# බෞද්ධ ධර්මාචාර්ය විභාගය

බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

# බෞද්ධ ධර්මාචාර්ය විභාගය

# අභිධර්මය

ලේඛකවරු

**මහාචාර්ය වත්දිම වීජේබණ්ඩාර**

**(බී.ඒ., පී.එච්.ඩී., ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති)**

**( 1, 2, 3, 4, 6, 7, 8, පරිච්ඡේද )**

**එච්. එම්. මොරටුවගම**

**(බී.ඒ., එම්. ෆිල්., ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය)**

**( 9, 10, පරිච්ඡේද )**

**ගුණසේන මහතත්ත්‍රිගේ**

**(බී.ඒ., බී.ඒ.ඩී., එම්.ඒ., දඹදෙණිය රජයේ ගුරු විද්‍යාලයේ විද්‍යාලයාධිපති)**

**( 5 වන පරිච්ඡේදය )**

සම්පාදනය හා ප්‍රකාශනය

**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

**2011**

Free Distribution www.thiryak.org

# පෙරවදන

බෞද්ධ ධර්මාචාර්ය විභාගය සඳහා අවශ්‍ය අභිධර්ම ඥානය සපයනු පිණිස සකස් කරන ලද මෙම පාඨ ග්‍රන්ථය සම්පූර්ණ අභිධර්මය පිළිබඳව ලියැවුණක් නොවේ. අභිධර්මය ත්‍රිපිටක ධර්මයෙහි ගැඹුරුම හා දුෂ්කරම කොටස බව සියළු ධර්ම වේදීහු පිළිගනිති. වර්ෂයකට දින හතළිහක් පමණ පැවැත්වෙන දහම් පාසලක දිනකට මිනිත්තු හතළිස් පහක පමණ කාලපරිච්ඡේදයක ඉගැන්වෙන පාඩම් තුළින් පූර්ණ අභිධර්මය ඉගැන්වීම දුෂ්කර බව අමුතුවෙන් කිවයුතු නැත. එහෙයින් අභිධර්මයෙහි ස්වරූපය හා මූලික සංකල්ප පිළිබඳ අවබෝධයක් පමණක් ලැබෙන පරිදි මෙම පාඩම් සකස් කර ඇත. (එමෙන් ම ධර්මාචාර්ය විභාගාපේක්ෂකයන් අ.පො.ස. උසස් පෙළ පමණ දැනුම් තලයක සිටිතැයි අනුමාන කරගත් විට සියුම් අභිධර්ම ගැටළු වෙත ඔවුන් යොමු කිරීම අනවශ්‍ය බව ද පැහැදිලි වනු ඇත.) කෙසේ වුවද අභිධර්මයෙහි මූලික ලක්ෂණ හඳුනාගෙන ඒ පිළිබඳ රුචියක් වර්ධනය කර ගන්නා ධර්මාචාර්යවරුනට තම ඥානය පුළුල් කර ගැනීම සඳහා යෝග්‍ය සිංහල ග්‍රන්ථ කිහිපයක් ඇති හෙයින් ඔවුන් ඒ වෙත යොමුවනු ඇතැයි අපේක්ෂා කරමු.

බුදුරදුන් විසින් යථාර්ථාවබෝධය කැමති ධර්මාභිලාෂීන්ට මහා කරුණාවෙන් කරන ලද ධර්ම දේශනා පදනම් කරගත් විවිධ අභිධර්ම සම්ප්‍රදායයන් ඇති බව හා ඒ පිළිබඳ තුලනාත්මක ඥානය ශාස්ත්‍රීය ශික්ෂණයක් වශයෙන් එලදායී වන බව මේ ග්‍රන්ථයෙන් ධර්මාචාර්යවරුනට වැටහෙනු ඇත. එමෙන් ම ථෙරවාදී අභිධර්මය අභිමානය පිණිස පාඩම් කර ගතයුතු ධර්ම ලැයිස්තුවක් නොව සූනමය ඥානයෙන් භාවනාමය ඥානයට ප්‍රවේශවීම පිණිස ආරාධනයක් ලෙස ගතයුතු ධර්ම විග්‍රහයක් බව ද අපි අවධාරණය කරමු. ඇතැම් ''ආභිධර්මිකයෝ'' ලැයිස්තුවෙන් එහා යථාර්ථයක් නොදකිමින් වචටෝරුමය ධර්මාවබෝධයෙන් දෘෂ්ටි කාන්තාරයේ සිරවෙති. එසේ නොවන ධර්මාභිලාෂීන් පිරිසක් බිහිවනු දැක්ම අපගේ අරමුණ යි.

වත්දිම විජේබණ්ඩාර



Free Distribution www.thiryak.org

## උපදේශක හා ලේඛක මණ්ඩලය

**පූජ්‍ය හේන්ගොඩ කල්‍යාණධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
(බී.ඒ., කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය)
සිංහල ශබ්දකෝෂයේ සහකාර කර්තෘ, ශ්‍රී චන්ද්‍රවිමල ධර්මග්‍රන්ථ සංරක්ෂක මණ්ඩලයේ ගරු සභාපති)

**අභය වීරකෝන් මහතා**
(බුද්ධ ශාසන අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්)

**සෝමරත්න කාරියවසම් මහතා**
(හිටපු බෞද්ධ කටයුතු කොමසාරිස්)

## සම්බන්ධීකරණය

**ශාස්ත්‍රවේදී ජ්. ඩී. ගුණපාල මහතා**
(බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දහම් පාසල් අංශයේ මාණ්ඩලික සහකාර)



Free Distribution
2. ර.මු.නි.ස. 100236
www.thiryak.org

# පටුන


| | | | පිටුව |
|---|---|---|---|
| 1 | පරිච්ඡේදය | අභිධර්මයේ ප්‍රභවය හා සංවර්ධනය | 1 |
| 2 | පරිච්ඡේදය | විවිධ අභිධර්ම සම්ප්‍රදායයෝ | 5 |
| 3 | පරිච්ඡේදය | අභිධර්ම සාහිත්‍යය | 9 |
| 4 | පරිච්ඡේදය | සංඛත - අසංඛත ධර්ම | 17 |
| 5 | පරිච්ඡේදය | සතර පරමාර්ථ පිළිබඳ ලක්ෂණ කථනය | 21 |
| 6 | පරිච්ඡේදය | භෞතික ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය | 29 |
| 7 | පරිච්ඡේදය | කය සහ සිත පිළිබඳ බෞද්ධ විවරණය | 36 |
| 8 | පරිච්ඡේදය | සිතෙහි ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය | 39 |
| 9 | පරිච්ඡේදය | සිත කිළිටිවීම | 44 |
| 10 | පරිච්ඡේදය | සිත පිරිසිදු කරගැනීම | 53 |




Free Distribution www.thiryak.org

1 වන පරිච්ඡේදය

# අභිධර්මයේ ප්‍රභවය හා සංවර්ධනය

ථෙරවාද බෞද්ධයන් ගේ ත්‍රිපිටකය සූත්‍ර පිටකය, විනය පිටකය සහ අභිධර්ම පිටකය වශයෙන් ත්‍රිවිධ වෙයි. මෙයින් අභිධර්ම පිටකය ධර්මධරයන් අතර විශේෂ ගෞරවාදරයට පාත්‍ර වෙයි. එහි අන්තර්ගත කරුණු පරමාර්ථ ධර්මය වශයෙන් හඳුන්වනු ලැබේ. ථෙරවාදී බෞද්ධයන් ගේ පිළිගැනීම වන්නේ අභිධර්මය හැදෑරීම ධර්මය පිළිබඳ නිරාකුල අවබෝධය සඳහා අත්‍යවශ්‍ය බව ය.

'අභිධම්ම' යන පාළි වචනය පිළිබඳව විග්‍රහයක් කරන අටුවාචාරීන් වහන්සේ ප්‍රකාශ කර ඇත්තේ විශේෂ, අතිරේක යන අදහසක් 'අභි' යන්න නිසා එක්වන බවකි.

''කෙනට්ඨෙන අභිධම්මො?
ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙන
අතිරෙක විසෙසට්ඨදීපකො හි එත්ථ අභිසද්දො''

යනුවෙන් ධම්මසංගනී අටුවාවෙහි දක්වා ඇත්තේ එය යි. මෙම අභිධර්මය ශෛලීය විසින් සූත්‍ර පිටකයට වඩා වෙනස් අයුරකින් ඉදිරිපත් කර ඇති හෙයින් එය 'පරමත්ථ දේසනා' ලෙස හඳුන්වති. සූත්‍ර පිටකය හඳුන්වන්නේ වෝහාර දේසනා වශයෙනි. අභිධර්ම දේශනා ක්‍රමය 'අභිධම්ම පරියාය' වශයෙන් ද සූත්‍ර දේශනා ක්‍රමය 'සුත්තන්ත පරියාය' වශයෙන් ද හඳුන්වනු ලැබේ. සූත්‍ර පිටකයෙහි දී උපමා උපමේය ගැලපීම් හා කතා පුවත් මගින් කරුණු පැහැදිලි කිරීම් වැනි ජනකාන්ත සන්නිවේදන මාර්ග උපයෝගී කර ගැනේ. එහෙත් අභිධර්මයේදී එබඳු ක්‍රම වෙනුවට හුදු ශාස්ත්‍රීය හා නිශ්චිත විලාසයෙන් පාරිභාෂික පද භාවිතයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබේ. මේ නිසා සූත්‍ර පිටකයට සප්පරියාය දේශනා යන නම ද අභිධම්ම පිටකයට නිප්පරියාය දේශනා යන නම ද ව්‍යවහාර කරනු ලැබේ. ඇතැම්විට සූත්‍ර ධර්මයෙහි කරුණු බෙදු හදු විවරණය කරන ක්‍රමවලට වෙනස් ක්‍රමවලින් කරුණු ප්‍රභේදගත කර විග්‍රහ කිරීම අභිධර්මයෙහිදී සිදු වේ. එසේ වූ විට සුත්තන්ත භාජනීය හා අභිධම්ම භාජනීය වශයෙන් එම වෙනස හඳුන්වා දෙනු ලැබේ.

ථෙරවාදී සම්ප්‍රදාය අභිධර්මයට හිමිකර ඇති ගෞරවනීය ස්ථානය තේරුම් ගැනීමට බුද්ධඝෝෂ හිමියන් ඒ පිළිබඳව පවසන මේ කියුම වැදගත් වෙයි ,

''අභිධර්මය නොදත් තැනැත්තා ධර්ම දේශනා කරන්නට ගියවිට මෙය ස්වවාදය ය, මෙය පරවාදය ය යන නිරවුල් අවබෝධය නැති හෙයින් ඒවා පටලවා දේශනා



Free Distribution www.thiryak.org

කරයි. ස්වවාදයක් ලෙස පරවාදය දක්වයි. පරවාදය සේ ස්ව වාදය දක්වයි. එහෙත් අභිධර්මය දත් තැනැත්තා එය නිවැරදිව තේරුම් ගෙන ධර්ම දේශනා කරයි. ධර්මය වෙනත් කරුණු සමග පටලවා නො ගනී යි.''

මෙම අභිධර්මය අන්තර්ගත අභිධර්ම පිටකය ප්‍රථම හා ද්විතීය ධර්ම සංගායනාවන්හිදි සංගායනා කරනු ලැබුවේ ද, ධර්මය හා විනය වශයෙන් තම දහම ද්විප්‍රකාර බව දැක්වූ බුදුරදුන් එය අභිධර්මය ද එක් කර ත්‍රිප්‍රකාර බව නො දැක්වූයේ කවර හෙයින් ද? සූත්‍ර දේශනාවලට මෙන් අභිධර්මයට නිදාන කථාවක් දක්වා නැත්තේ ඇයි? වැනි ප්‍රශ්න රාශියක් අභිධර්මය පිළිබඳ ව මතුකර තිබේ. මේ ප්‍රශ්න අනුසාරයෙන් ම අභිධර්මය මූලික බුද්ධ දේශනාවක් නො වෙතියි පවසන විචාරකයෝ ද වෙති. එහෙයින් අභිධර්මය පිළිබඳ ව උනන්දු වන විද්‍යාර්ථීන් එබඳු ගැටළු පිළිබඳ ව සාකච්ඡා කිරීම ප්‍රයෝජනවත් කාර්යයකි.

ප්‍රථම ධර්ම සංගීතියේදී හා ද්විතීය ධර්ම සංගීතියේ දී ධර්මය වශයෙන් ම අභිධර්ම පිටකය ද සංගායනා කළ බව අභිධර්ම පිටකයෙහි අධිකාරිණත්වය (ප්‍රාමාණිකත්වය) පිළිගන්නා ධර්මධරයෝ පවසති. එමෙන් ම බුද්ධකාලයේ අභිධර්මය පැවති බව සනාථ කරනු සඳහා බුද්ධකාලීන භික්ෂූන් වහන්සේලා අභිධර්ම කථා සහ අභිවිනය කථා නම් වූ සාකච්ජා දෙවර්ගයක යෙදුණු බව ප්‍රකට කරන සටහන් ගෙනහැර පානු ලැබේ. එම කථා අභිධර්ම පිටකය පිළිබඳ කථා ද නැතහොත් ධර්මය හා විනය පිළිබඳ ව ගැඹුරු මට්ටමෙන් කරන සාකච්ජා ද යනු පැහැදිලි නැත.

අභිධර්මයට නිදානයක් නොමැතිකම පිළිබඳ ගැටළුව ථෙරවාදී අටුවාචාර්යවරුන් ගේ සැලකිල්ලට භාජන වූවකි. බුදුරජාණන් වහන්සේ ප්‍රථම ආභිධම්මිකයා බව දක්වන අත්ථසාලිනී නම් වූ ධම්මසංගණී අටුවාව අභිධර්මයට නිදාන එකක් නොව දෙකක් ම ඇති බව දක්වයි. ඒ අධිගම නිදාන හා දේසනා නිදාන වශයෙනි. (අභිධම්මෙ ද්වෙ නිදානානි : අධිගම නිදානං, දේසනා නිදානං) බුද්ධත්වය පිළිබඳ ප්‍රණිධාන අවස්ථාවේ ම අභිධර්මය පිළිබඳ මූලික ආරම්භය සටහන් වන බවත්, පන්සිය පණහක් ජාතක අවස්ථාවන්හි දී එය මුහුකුරා ගිය බවත්, බෝධි මූලයෙහි දී බුදුවන අවස්ථාවේදී ම සාක්ෂාත් කරගත් බවත්, අනතුරු ව රතනඝරයෙහි වැඩ වසමින් බුදුරදුන් එය සම්මර්ශනය කළ බවත් අධිගම නිදානය වශයෙන් දැක්වේ. දේශනා නිදානය වශයෙන් මෙම අභිධර්මය බුදුරදුන් විසින් ම තාවතිංස දේව ලෝකයේ දී තම මව ව සිටි මාතෘ දිව්‍ය රාජයාණන් ප්‍රමුඛ දෙව් දේවතාවනට චතුරෝස තරණය පිණිස උපකාර වනු වස් දේශනා කළ බව දැක්වේ. දෙව්යනට පසු එම අභිධර්මය භාග්‍යවතුන්වහන්සේ විසින් සාරිපුත්ත මහ රහතන් වහන්සේට දේශනා කරන ලදු ව උන්වහන්සේ ගේ ශිෂ්‍ය ප්‍රශිෂ්‍ය පරම්පරාව වශයෙන් භද්දජි, සෝභිත, පියජාලි, පියදස්සි, කොසියපුත්ත, සිග්ගව, සන්දේහ, මොග්ගලිපුත්ත, විසුදත්ත, ධම්මිය, දාසක, සොණක, රේවත යනාදී හිමිවරුන් විසින් පිළිවෙළින් ප්‍රවර්තනය කළ බවත් දක්වා තිබේ. පරම්පරානුයාත අභිධර්මය මහින්ද මහ රහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලදී.



Free Distribution www.thiryak.org

නූතන විචාරකයන් ගේ අදහස වන්නේ අභිධර්මයෙහි අන්තර්ගත චින්තනය බුදුරදුන් සූත්‍ර දේශනා මගින් ඉදිරිපත් කළ ධර්මය ම වුව ද අභිධර්ම පිටකය නමින් අද අප හඳුන්වන ග්‍රන්ථ සප්තකයේ විලාසයෙන් ම එය වදාරන ලද බව නම් පිළිගත නො හැකි බවයි. අභිධර්මය ධර්මය තුළින් ම බිහි වූ අතිරේක හා විශිෂ්ට ශාස්ත්‍රයක් බවත්, එහි සංග්‍රහණය ධර්මවේදී බෞද්ධ පඬිහිමිවරුන් ගේ කාර්යයක් බවත් ඔවුහු විශ්වාස කරති. අභිධර්මය නම් භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනේය ජනයා ඇරබ ඒ ඒ තැනදී දෙසූ ධර්මය ම යැයි සර්වාස්තිවාදීන් ස්ඵුටාර්ථාභිධර්මකෝශ ව්‍යාඛ්‍යා නම් ග්‍රන්ථයේ දී කරන ප්‍රකාශය මේ හා ගැළපේ යි. (අභිධර්මොහි ධර්මලක්ෂණොපදේශ ස්වරූපො විනෙයවශාත් තත්‍ර තත්‍ර භගවතෝක්තඃ) බෞද්ධ චින්තනය විධිමත් ව ශාස්ත්‍රීය ලෙස පද්ධති බන්ධනය කොට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවට ප්‍රතිචාරයක් වශයෙන් අභිධර්ම පිටකය සකස් වූ බව නවීන විචාරකයෝ සිතති.

බුද්ධ වචනය නිෂ්පර්‍යාය දේශනයක් වශයෙන් සංග්‍රහණය කිරීමේ අවශ්‍යතාව උද්ගත වීමට බුදුරදුන් ගේ දේශනා ක්‍රමය ප්‍රධාන වශයෙන් ඉවහල් වූ බව කියති. උන්වහන්සේ ධර්ම දේශනා කළේ විධිමත් දර්ශනයක් ඉදිරිපත් කරන දාර්ශනිකයකු ගේ විලාසයෙන් නොව විමුක්තිකාමී ශ්‍රාවකයනට අදාළ පරිදි කරුණු දක්වන ශාස්තෘවරයකු ලෙසිනි. එය උපමා කර ඇත්තේ රෝගීනට ප්‍රතිකර්ම කරන වෛද්‍යවරයකුගේ ප්‍රතිපත්තියට ය. (ආතුරි ආතුරි භෛෂජ්‍යං යද්වත් භිෂක් ප්‍රයච්ඡති) රෝගියාට ගැළපෙන ඖෂධය ඔහුට දෙනු මිස ඔහුට වෛද්‍ය ශාස්ත්‍රය ඉගැන්වීමට උත්සාහ කරනු නො ලැබේ. එමෙන් ම චිකිත්සා ක්‍රමය ද රෝගියාට ගැළපෙන පරිදි වෙනස් කරනු ලැබේ. (වෛද්‍යෙ යථාතුරිවශාත් – ක්‍රියා භේදං ප්‍රකුර්වතේ) බුදුහු ද එසේ ම ශ්‍රාවකයා ගේ විමුක්තියට අදාළ පරිදි පර්‍යාය වෙනස් කරමින් විචක්ෂණයෙන් යුතු ව ධර්මය දේශනා කරති. එහෙත් ශ්‍රාවක සංඝයා සංස්ථාගත වත් ම නවක භික්ෂූනට ධර්මය විධිමත් ව ඉගැන්වීම අවශ්‍ය වෙ යි. බුද්ධකාලීන සමාජය දාර්ශනික වාද විවාද වලින් පිරුණු හා විදග්ධ චින්තකයන්ගෙන් අනූන වූවක් හෙයින් බෞද්ධ දර්ශනය ද විධිමත් ව පද්ධති බන්ධනය කර ගැනීම අවශ්‍ය වූයේ ය. එහෙයින් බුදුරදුන් වදාළ සූත්‍ර ධර්ම එක්රැස් කර එහි ගම්‍යමාන ධර්මය විශේෂ මාතෘකා යටතේ විධිමත් කිරීම උගත් භික්ෂූන් වහන්සේ අතින් ඉටු වූ බව විචාරකයන් ගේ හැඟීම යි. අභිධම්මකථා නමින් පෙළපොත්වල සඳහන් වන්නේ එබඳු කාර්‍යයන් සඳහා පවත්වන ලද සාකච්ඡා විය හැක.

අභිධර්මය සංග්‍රහ කිරීමේ දී මුලින් ම සිදුවන්නට ඇත්තේ මාතෘකා එක්රැස් කිරීම ය. ධර්මය පිළිබඳ ප්‍රධාන ශීර්ෂ විධිමත් ව එක්රැස් කිරීම පද්ධති බන්ධනයේ මුල් ම තාර්කික පියවර වීම යුක්ති යුක්ත ය. අභිධර්මයට 'මාතිකා' යන ව්‍යවහාරය ද යෙදීම මීට නිදසුනකි. ප්‍රථම සංගීති අවදිය වනවිට පැවැත්තේ 'මාතිකා' පමණක් විය හැකියයි ඒ. කේ. වෝඩර් සිතයි. බොහෝ අභිධර්ම පොත් මුලින් ම මාතෘකා දක්වා අනතුරු ව ඒවා විවරණය කිරීමේ ක්‍රමයට සකස් වෙයි. සර්වාස්තිවාදී අභිධර්මයෙහි ඇති සංගීතිපර්‍යායපාද නම් ග්‍රන්ථය මෙබඳු මාතෘකා එකතුවකට හොඳ ම නිදසුනකි.



Free Distribution www.thiryak.org

බුද්ධකාලීන ව අභිධර්මය මාතෘකා රුස්කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධකර දැක්විය හැකි වැදගත් සූත්‍රයක් දීඝනිකායේ අන්තර්ගත වෙයි. 'සංගීති' නමින් හැඳින්වෙන එම සූත්‍රය ජෛන මහාවීර ගේ අභාවය හා එම අභාවයෙන් පසු මහාවීර ගේ ශිෂ්‍ය පිරිස භේද භින්න වූ ආකාරය වාර්තා කිරීමෙන් ඇරඹේ. ජෛන ශ්‍රාවකයෝ ධර්මය පිළිබඳ වාද විවාද ඇති කරගෙන නිකාය භේද පවා ඇති කර ගත් හ. ඒ නිමිත්තෙන් සංඝයා ඇමතූ බුදුරජාණන් වහන්සේ මගේ ඇවෑමෙන් ඔබ ධර්මය පිළිබඳ ව විවාද නො කළ යුතු ය. සංගායනා කළයුතු යැයි වදාළ හ. අනතුරු ව සැරියුත් හිමියෝ සමස්ත බෞද්ධ දර්ශනය ම අළලා මාතෘකා සංග්‍රහයක් කළ හ. මෙම මාතෘකාවලිය සංගීති පර්‍යාය ශාස්ත්‍ර නම් සර්වාස්තිවාදී අභිධර්ම ග්‍රන්ථයට පදනම සපයා ඇති බව වෝඩර් පවසයි.

මේ මත සියල්ල ම පොදුවේ ගත් විට අපට පැහැදිලි වන වැදගත් ම කරුණ නම්, අභිධර්මය බුද්ධ ධර්මය ම මිස මිථ්‍යාදෘෂ්ටියක් හෝ සංඝයා වහන්සේලා විසින් අමුතුවෙන් ගොතා නිර්මාණය කළ දෙයක් නො වන බව ය. කෙළින් ම බුදුරදුන් විසින් දේශනා කළ හෝ වේවා බුදුරදුන් දේශනා කළ සූත්‍ර දේශනා තුළින් උකහා ගෙන පද්ධතිබන්ධනය කළ හෝ වේවා අභිධර්මයෙහි අන්තර්ගතය නම් බුද්ධභාෂිතය ම ය. විවාදය ඇත්තේ අභිධර්මය ගැන නොව අභිධර්ම පිටකය ගැන ය. අභිධර්ම පිටකය සංවර්ධිත සාහිත්‍යයක් ලෙස පිළිගත් අයකුට වුව ද එහි අන්තර්ගත දර්ශනය බුද්ධ දේශිත සද්ධර්මය බව ප්‍රතික්ෂේප කළ නො හැක. අභිධර්ම පිටකයෙහි අන්තර්ගත කථාවත්ථුප්පකරණ නම් ග්‍රන්ථය මොග්ගලීපුත්තතිස්ස හිමියන් විසින් කරන ලද කෘතියක් බව හැමදෙන ම දනිති. ඒ සම්බන්ධයෙන් ධම්මසංගනී අටුවාවේ පවසා ඇත්තේ බුදුරදුන් ඉගැන්වූ න්‍යායට අනුව මාතෘකා පිහිටුවා කරන ලද හෙයින් එම ප්‍රකරණය ද බුද්ධභාෂිත වශයෙන් ම පිළිගත යුතු බව ය. එය එසේ නම්, අනිකුත් අභිධර්ම ප්‍රකරණ වුවත් ඍජු ලෙස ම බුද්ධභාෂිත යැයි නොපිළිගන්නා අයට පවා අපට කිව හැක්කේ පූර්වෝක්ත ක්‍රමයට ම අනුව එම ප්‍රකරණ ද බුදුරදුන් ඉගැන්වූ න්‍යායට ම අනුව මාතෘකා පිහිටුවා කරන ලද හෙයින් බුද්ධභාෂිත සංඛ්‍යාවට ම ගැණෙන බව ය. ථෙරවාදී සම්ප්‍රදායේ පිළිගැනීම නම්, ඒ සියල්ල දෙව්ලොවදී හා මිනිසුලොවදී බුදුරදුන් විසින් ම දේශනා කළ හෙයින් බුද්ධභාෂිත බව ය.



Free Distribution www.thiryak.org

## 2 වන පරිච්ඡේදය

# විවිධ අභිධර්ම සම්ප්‍රදයයෝ

සත්වයා සහ ලෝකය පිළිබඳව අවිපරීත අවබෝධය ශ්‍රාවකයන් තුළ ජනිත කිරීම පිණිස කරනු ලබන ධර්ම විශ්ලේෂණයක් හා සංශ්ලේෂණයක් වශයෙන් අභිධර්මය හැඳින්විය හැක. සූත්‍ර පිටකයේදී ස්කන්ධ, ධාතු හා ආයතන වශයෙන් සත්වයා විභේදනය කර දක්වන්නේ අනාත්ම ධර්මය ප්‍රකට කිරීම පිණිස ය. පූර්වෝක්ත ධර්ම අනිත්‍යව පරස්පර සාපේක්ෂව ප්‍රතීත්‍ය සමුත්පන්න ව ප්‍රවර්තනය වෙයි. එහෙයින් නිත්‍ය වූ අවිනශ්වර වූ ආත්මයක් නො ලැබෙන බව සූත්‍ර ධර්මයෙන් පැහැදිලි කරනු ලැබේ. එහෙත් සූත්‍ර පිටකයෙහි දක්වෙන මෙම බෙදුම් සත්වයා සහ ලෝකය පිළිබඳ සකලාංග පූර්ණ බෙදුමක් අරමුණු කරගත් බවක් නො පෙනේ. අභිධර්මයෙහි අරමුණු වූයේ සත්වයා සහ ලෝකය පිළිබඳ සියල්ල ම නිරවශේෂ වශයෙන් බෙද දැක්වීමේ මතයක් සකසා ගැනීම ය. එහෙයින් ලොව පවත්නා සියල්ල ධර්ම වශයෙන් නම් කරන අභිධර්මය ඒ සියල්ල චිත්ත, චෛතසික. රූප හා නිර්වාණ වශයෙන් බෙද දක්වයි. මෙසේ ප්‍රභේද ගත කළ විට වෙනත් කිසිවක් අවශේෂ වන්නේ නැත.

මෙම විශ්ලේෂණ ක්‍රමය මූලික වශයෙන් ථෙරවාදි විභජ්ජවාදි සම්ප්‍රදයේ භාවිත වූයේ ය. එහෙත් බුදුසමයෙහි විකසිත වූ සැම ආචාර්යවාදයකට ම එය පොදුවේ අභිමත වූ බව නො පෙනේ. විවිධ අභිධර්ම ගැටළු මත විවිධ ආචාර්යවරුන් අතර මතභේද තිබිණි. ථෙරවාදීන් ගේ සප්තප්‍රකරණය ලෙස හැඳින්වෙන පාළි ග්‍රන්ථ සප්තකය වෙනත් ගුරුකුලවල නොපිළිගැණිනි. නිදසුනක් වශයෙන් ථෙරවාදයේ ම ශාඛාවක් වූ සර්වාස්තිවාදි වෛභාෂික ආචාර්යවරුන් දැක්විය හැක. ඔවුහු සතු බසින් වෙන ම අභිධර්ම ග්‍රන්ථ සප්තකයක් ඉදිරිපත් කළහ. මෙසේ අභිධර්ම සාහිත්‍ය සම්ප්‍රදය රාශියක් ජනිත වී වාද විවාද කිරීම ගැන කළකිරුණු භික්ෂු පිරිසක් මේ සියළු ගැටළු අභිධර්මය පිළිගැනීම නිසා ඇති වූ දේ හෙයින් හොඳ ම ක්‍රියාව අභිධර්මය ප්‍රතික්ෂෙප කිරීම යැයි සිතා සූත්‍රධර්ම පමණක් පදනම් කරගත් ආචාර්ය වාදයක් ඉදිරිපත් කළහ. ඔවුන් හඳුන්වන ලද්දේ සෞත්‍රාන්තිකයන් වශයෙනි. අභිධර්මය ප්‍රතික්ෂෙප කළ ද අභිධර්ම අධ්‍යයනවල ප්‍රතිඵල වශයෙන් උද්ගත වී තිබුණු නව ගැටළු මහ හරින්නට ඔවුනට හැකි නොවී ය. එහෙයින් ඔවුන් අතුරින් ද බිහිවූයේ නමින් පමණක් අභිධර්මයක් නොවූ එහෙත් යථාර්ථ වශයෙන් බලන විට තවත් අභිධර්මයක් ම වූ ඉගැන්වීම් සමුදයයකි.

විවිධ අභිධර්ම සම්ප්‍රදයයන් ගැන සඳහන් කරනවිට මුලින් ම අප විසින් සැලකිල්ලට ගත යුත්තේ පාලි බසින් සුරැකී ඇති ථෙරවාදී විභජ්ජවාදී අභිධර්මය වෙනත් කිසිම අභිධර්මයකට වඩා පාලි සූත්‍ර සාහිත්‍යය සමඟ ගැළපී සිටින බව යි. පාලි සම්ප්‍රදයයේ චින්තනය බෞද්ධ ඉතිහාසයේ පැරණි ම සම්ප්‍රදය බව



3. ර.මු.නී.ස. 100236

Free Distribution www.thiryak.org

අවිවාදනීය ය. එහෙයින් කවර අභිධර්ම සම්ප්‍රදායකටත් වඩා එය මූලික බුදුදහම නියෝජනයෙහි ලා සමත් බව කිවයුතු ය. වෙනත් සම්ප්‍රදායයන්හි අභිධර්ම කෘති ථෛරිය අභිධර්ම කෘතිවලට වඩා ව්‍යුහයෙන් බොහෝ දුරට වෙනස් බව දක්වන ජේ. තකාකුසු වැනි පඬිවරු එයින් හැඟී යන්නේ ඔවුන් තම අභිධර්ම සාහිත්‍යය වර්ධනය කර ගත්තේ නිකාය වශයෙන් වෙන් ව ගියාට පසුව බව යැයි පවසති.

ථෙරවාදී විභජ්ජවාදීන් ගේ අභිධර්මය ළඟට වැදගත් වන දියුණු අභිධර්ම සම්ප්‍රදායයක් සේ ථෙරවාදී නිකායක් සේ දැක්වෙන සර්වාස්තිවාදය දැක්විය හැක. එම අභිධර්මය ථෙරවාදී නිකායයක් විසින් අරඹන ලද්දේ වුව ද මහායානිකයනට පවා එහි බලපෑමෙන් මිදෙන්නට නො හැකි වූ බව විචාරකයෝ පවසති. ථෙරවාදී අභිධර්මයෙහි උගන්වනු ලබන්නේ චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ පමණක් වුව ද සර්වාස්තිවාදී අභිධර්මයෙහි ද චිත්ත විප්‍රයුක්ත ධර්ම නමින් තවත් ධර්ම දහහතරක් උගන්වනු ලැබිණි. මේ හැරෙන්නට අසංස්කෘත ධර්ම (අසංඛත) සංඛ්‍යාව ද ඔවුන් විසින් වැඩිකොට තිබේ. ථෙරවාදී පාලි අභිධර්මය නිර්වාණය එක ම අසංස්කෘත ධර්මය වශයෙන් දක්වයි. එහෙත් සර්වාස්තිවාදීහු අසංස්කෘත ධර්ම තුනක් දක්වති. එනම්, ප්‍රතිසංඛ්‍යා නිරෝධ, අප්‍රතිසංඛ්‍යා නිරෝධ සහ ආකාශ වශයෙනි. ඔවුන් දක්වන ධර්ම සංඛ්‍යාව 75කි. සංස්කෘත ධර්ම 72 ක් හා අසංස්කෘත 3 ක් වශයෙනි. එම ධර්ම වර්ග කර ඇත්තේ මෙසේ ය.

| | |
|---|---|
| (1) චිත්ත | 1 |
| (2) චෛතසික | 46 |
| (3) රූප | 11 |
| (4) චිත්ත විප්‍රයුක්ත | 14 |
| (5) අසංස්කෘත | 3 |

තවත් වැදගත් අභිධර්ම සාහිත්‍යයක් වශයෙන් ශාරිපුත්‍ර අභිධර්ම ශාස්ත්‍රය විචාරකයන් ගේ අවධානයට යොමු වී ඇත. මෙය දැනට අවශිෂ්ට ව ඇත්තේ චීන බසින් පමණි. මෙය මහාසාංඝික නිකායේ ද, සම්මිතීය නිකායේ ද, නැතහොත් ධර්මගුප්තිකයන්ගේ දැයි හරියට ම නිර්ණය කර නැත. මේ ආචාර්යවරුන් තුන් පිරිසට ම අභිධර්මයක් පැවති බව සඳහන් වේ. මහාසාංඝිකයන් ථෛරීයයන්ගේ අභිධර්මය ප්‍රතික්ෂේප කළ ද මාතිකා පිටකයක් ඔවුනට තිබුණු බව ශිලාලේඛන සාධක මගින් සනාථ වී ඇත. මහාසංඝිකයන් ගේ ගෝකුලික හා බහුශ්‍රැතීය යන අනු නිකායවල භික්ෂූන් අභිධර්මය ප්‍රිය කළ තමන්ගේ ම අභිධර්මයක් වර්ධනය කරගත් පිරිසක් බව පැවසේ. සම්මිතීයයන්ගේ අභිධර්මය පුද්ගලවාදී වූවකි. ශාරිපුත්‍රාභිධර්මයේ පුද්ගලවාදය ගැන කිසිවක් නොමැත.

ථෙරවාදී පක්ෂයට ම අයත් අභිධර්මධර ආචාර්යවරුන් අතර වාත්සීපුත්‍රීයයෝ විශේෂ තැනක් ගන්හ. ඔවුහු අභිධර්මයෙහි දැක්වෙන නිස්සත්ත නිජ්ජීව ධර්ම විභාගය අසම්පූර්ණ විග්‍රහයක් බව සිතූ හ. ලෝක සත්වයා හුදෙක් ශුෂ්ක නිජ්ජීව ධර්ම සමූහයක් පමණක් ද ? සත්වයන්ගේ සජීවිබව අභිධර්මයේදී නො තකා කළ නොහේ. එහෙයින් එය පුද්ගල වශයෙන් හඳුන්වන ලදී. වාත්සීපුත්‍රීය නිකාය විසින්



Free Distribution www.thiryak.org

අරඹන ලද මෙම පුද්ගල වාදය ඔවුන්ගේ අනුනිකාය වතුෂ්කය වූ ධර්මෝත්තරීය, භද්‍රයානික, සම්මිතීය හා ෂණ්ණාගාරික යන නිකායයන් විසින් ද පිළිගන්නා ලදි. මෙ ඉගැන්වීම් පිළිබඳ ව මේ නිකායවල අනුගාමිකයන් ලියූ ග්‍රන්ථ කිසිවක් සංස්කෘත භාෂාවෙන් ලැබී නැත. සම්මිතීය නිකායට අයත් සම්මිතීය නිකාය ශාස්ත්‍ර නම් ග්‍රන්ථය චීන බසින් ලැබී ඉන්දියාවේ වෙන්කටරමනන් නම් පඬිවරයා විසින් 1951 දී ඉංග්‍රීසි බසට පරිවර්තනය කර ඇත. මේ හැරෙන්නට කථාවත්ථු, අභිධර්මකොශ වැනි ග්‍රන්ථවලද විවේචනය සඳහා ඔවුන්ගෙන් අදහස් ගෙනහැර දක්වා තිබේ.

අභිධර්මය පිළිබඳ ඉතා වැදගත් අදහස් දැක්වූ මහායාන ආචාර්යවාදය යෝගාචාර නමින් හැඳින් වේ. බාහිර ලෝකය හුදෙක් අප විසින් සිතෙහි මවාගත් දෙයක් බවත් විඥප්ති මාත්‍රයක් පමණක් වශයෙන් එය හැඳින්විය යුතු බවත් ඔවුහු පැවසූ හ. මහායාන ධර්මයේ මූලික ඉගැන්වීමක් වූ සියල්ල හේතුඵල සමවායයෙන් හටගත් ස්වභාව විරහිත ශූන්‍ය වස්තු වෙතියි යන මතය තහවුරු කරන්නට තර්ක කළ ඔවුහු බාහිර ලෝකයට යථාර්ථ වත් හෝ පරමාර්ථමය පැවැත්මක් ඇතැයි නො පිළිගත්හ. ඔවුන් ගේ අභිධර්මය අනුව ලෝකයේ විද්‍යමාන ධර්ම වර්ගීකරණය කරනු ලබන්නේ මෙසේ ය.

| | |
|---|---|
| අසංස්කෘත ධර්ම | 6 |
| රූප | 11 |
| චිත්ත | 8 |
| චෛතසික | 51 |
| චිත්ත විප්‍රයුක්ත | 24 |

මේ අනුව සංස්කෘත හා අසංස්කෘත ධර්මයන් ගේ එකතුව 100ක් වෙයි.

අභිධර්ම පිටකය ප්‍රතික්ෂෙප කරමින් අභිධර්ම ගැටළුවලට සූත්‍ර පිටකානුසාරයෙන් පිළිතුරු සෙවූ සෞත්‍රාන්තික නිකාය ද අභිධර්ම ආචාර්ය වාදයක් බිහි කළ බව පිළි ගැනීමට සිදුවේ. ඔවුන්ගේ ඉගැන්වීම් රාශියක් සර්වාස්තිවාදය සඳහා ග්‍රන්ථයක් රචනා කිරීමට ඉදිරිපත් වූ වසුබන්ධු විසින් අභිධර්මකොශයෙහි ඇතුළත් කර ඇත. වසුබන්ධු සර්වාස්තිවාදී ග්‍රන්ථයක් ලිවීමට ඉදිරිපත් වුව ද පෞද්ගලික ව සෞත්‍රාන්තික ධර්ම පිළිගන්නෙක් වූයේ ය. (එහෙයින් අභිධර්ම කෝශය මගින් ඔහු සර්වාස්තිවාදයට අවාසියක් කර ඇතැයි තේරුම් ගත් සර්වාස්තිවාදීහු තම මත නිවැරදි අයුරින් වාර්තා කරනු පිණිස 'අභිධර්මදීප' නම් නව කෘතියක් සම්පාදනය කළහ.) සෞත්‍රාන්තිකයන් ගේ ධර්ම විභාගය පිළිබඳ අනෙකුත් ග්‍රන්ථ නෂ්ටප්‍රාය නමුත් ශිව ඥාන සිද්ධි නම් ද්‍රවිඩ ග්‍රන්ථයේ එම ධර්ම විභාගය දක්වා තිබේ. රූප, අරූප, ව්‍යවහාර හා නිර්වාණ වශයෙන් ධර්ම ප්‍රභේද හතරක් උගන්වන ඔවුහු එහි වර්ගීකරණය මෙසේ දක්වති.

| | |
|---|---|
| රූප | 8 |
| අරූප | 2 |
| ව්‍යවහාර | 2 |
| නිර්වාණ | 2 |



Free Distribution www.thiryak.org

මෙයට අතිරේකව කේවල ධර්ම වර්ගීකරණය නමින් තවත් ප්‍රභේදනයක් ද දක්වා ඇත.

| | |
|---|---|
| රූප | 8 |
| විඥත | 6 |
| වේදනා | 3 |
| සංඥ | 6 |
| සංස්කාර | 20 |

මේ අනුව කේවල ධර්ම 43ක් ඔවුහු උගන්වති. ඔවුන්ගේ සුවිශේෂ ඉගැන්වීම් අතර බීජ සංකල්පය, බාහිරාර්ථ අනුමෙයත්වවාදය හා අභූත්වාභාව උත්පාද වාදය දක්විය හැක.

මෙසේ විවිධ අභිධර්ම සම්ප්‍රදයයන් පිළිබඳව සාකච්ජා කරනවිට සූත්‍රධර්ම විෂයෙහි බෞද්ධයන් අතර පවත්නා ඒකමතිකත්වය අභිධර්මය විෂයෙහි නොමැති බව පැහැදිලි වේ. මෙම ආචාර්‍ය වාද හය – හත භාරතයේ සජ්වීව පැවති සමයේ උණුසුම් හා සිත්ගන්නා ධර්ම සංවාද ඔවුන් අතර පවතින්නට ඇත. කෙසේ වුව ද අපට පෙනී යන පරිදි පැරණි ම අභිධර්ම සම්ප්‍රදය ථෙරවාද විභජ්ජවාදීන් ගේ පාලි අභිධර්මය බව නිසැක ය. පාලි සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම දේශනයන්හි විවිධ ප්‍රවාද, උපමා, රූපක හා සංකේත ආදිය අතුරින් වියුක්ත සිද්ධාන්ත සමූහයක් නිෂ්කර්ෂණය කර ගනිමින් උජ්වලිත වන පාලි අභිධර්මය මූලික සූත්‍ර ස්ථාවරය තුළ ම රැඳෙන්නට දරන ප්‍රයත්නය ප්‍රශංසාර්හ ය. ධම්ම, පඤ්ඤත්ති, වොහාර වැනි සංකල්ප සියුම් ලෙස විවරණය කර බලන විට ආභිධර්මිකයන් අතථතා, තථතාවැනි මිථ්‍යා සංකල්ප දුරලමින් ස්වාධීන විචාර මාර්ගයක් හරහා සියළු දෘෂ්ටීන් ප්‍රහාණය කරන්නට මග සලසන අයුරු පැහැදිලි ය. ථෙරවාදී අභිධර්මය හුදු ලැයිස්තු මාලාවක් නොවේ. එහි එන සංශ්ලෙෂණ හා විශ්ලෙෂණ ක්‍රමය ප්‍රායෝගික ආගමික චරණයකට උචිත භාවනාමය පදනමකි. එහි විග්‍රහය ධර්ම බහුත්ව වාදයක් ලෙස වරදවා නො ගෙන ධර්මයන් ගේ සූක්ෂ්ම හා ගතික ස්වභාවය තේරුම් ගනිමින් අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ස්වභාවය එමගින් ධ්වනිත වන අයුරු ග්‍රහණය කරගත යුතු ය.



Free Distribution www.thiryak.org

## 3 වන පරිච්ඡේදය

# අභිධර්ම සාහිත්‍යය

"අභිධර්මය" යන්නෙන් පාලි ත්‍රිපිටකයෙහි තුන්වන පිටකය අදහස් කරන බව ප්‍රකට කරුණකි. එහෙත් අභිධර්ම සාහිත්‍යය ගැන කථා කරන විට එතරම් සරල ලෙස හඳුන්වා නිහඬ වීමට නොහැකි පරිදි අභිධර්ම සාහිත්‍යය විපුල බව කිව යුතුය. ථෙරවාදී බෞද්ධයන් තම තුන්වන පිටකයේ ඇති ග්‍රන්ථ සප්තකය අභිධර්මය සේ හඳුන්වන විට එම සාහිත්‍යයට වෙනස් ග්‍රන්ථ සමූහයක් අභිධර්මය සේ ඉදිරිපත් කරන නිකායාන්තර රුසක් ඇති බව සැලකිල්ලට ගන්නට අපට සිදුවෙයි. එමෙන් ම අභිධර්මය යනු බුදුරදුන් විසින් සූත්‍ර මගින් දේශිත ධර්මය විධිමත් ලෙස පද්ධති බන්ධනය කර තේරුම් ගන්නට දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලය සේ ගන්නා ඇතැම් නූතන පඬිවරු ථෙරීය අභිධර්ම සාහිත්‍යය පවා ක්‍රම විකාශය වූවක් බව දක්වති. මේ මතිමතාන්තර ගැන අවබෝධයක් ලබා තිබීම බුදුසමය විධිමත්ව හදාරන්නවුනට ඉතා ප්‍රයෝජනවත් ය.

මුලින් ම අපි ථෙරවාදී අභිධර්ම සාහිත්‍යය පිළිබඳව සලකා බලමු. මෙහිදී ථෙරවාදීන් අතර ප්‍රමුඛත්වය ගන්නා පාලි බසින් අභිධර්ම පිටකය පවත්වාගෙන එන ථෙරීය විභජ්ජවාදී සම්ප්‍රදාය මුල් තැන ලා සැලකිය හැක. ජපන් ජාතික බෞද්ධ වියතකු වූ ජේ. තකාකුසු පවසන්නේ අභිධර්ම පිටකය විභජ්ජවාදී ත්‍රිපිටකයේ තහවුරු වූයේ තුන්වන සංගීතියේදී බවය. එම අවස්ථාවේ ම ඊට සමාන්තරව තවත් ථෙරීය කණ්ඩායමක් වූ සර්වාස්තිවාදීන් විසින් ද අභිධර්මයක් සකස් කර ගන්නා ලදී. මෙහිදී අප විසින් තේරුම් ගත යුත්තේ අභිධර්ම සාහිත්‍යය අශෝක රජුගේ සමයෙහි (එනම් තෙවන සංගීති අවස්ථාවෙහි) අළුතෙන් ම ඇති වූ බව නොවේ. අභිධර්මය එසේ එක් අවස්ථාවක සංගීති කාරකයන් විසින් රචනා කරන ලද්දක් නොවේ. තෙවන සංගීති අවස්ථාවෙහි මොග්ගලීපුත්ත තිස්ස හිමියන් විසින් සකස් කරන ලද්දේ කථාවත්ථුප්පකරණය පමණි. අනෙකුත් ග්‍රන්ථ හය ඊට පෙර පැවතුණා විය යුතු ය. ථෙරීය විභජ්ජවාදීන් ගේ අභිධර්මයට විරුද්ධව මුල්වරට විකල්ප අභිධර්මයක් සකස් කර ගත්තේ සර්වාස්තිවාදීන් නොවේ. අශෝක රජු ගේ පියාණන් වූ බින්දුසාර රජ දවස ථෙරීය භික්ෂුවක් වූ වාත්සී පුත්‍ර හිමියෝ එවකට පැවති අභිධර්මය ප්‍රතික්ෂේප කර නව අභිධර්මයක් සැකසූහ. පොත් නමයක් රචනා කර ඉදිරිපත් කළ මෙම නව අභිධර්මයෙන් උන්වහන්සේ කීයා සිටියේ බුදු දහමෙහි පුද්ගල සංකල්පය පිළිගැනෙන බව ය. බුදුරජාණන් වහන්සේ අනාත්ම වාදය දේශනා කළ නමුත් පුද්ගලයකු නැතැයි වදාරා නැති බව පැවසූ උන්වහන්සේ එම පුද්ගලයා භවයෙන් භවයට විවිධ කායික ස්වරූප ගනිමින් සංක්‍රමණය වී අවසන විමුක්තිය ලබා ගන්නා බව පැවසූහ. මෙම 'පුද්ගල' පංචස්කන්ධයට අතිරේක වශයෙන් පැනවිය හැකි අතර





Free Distribution www.thiryak.org

එය ස්කන්ධයෙන් සහමුලින් බැහැර දෙයක් නොවන බව ද සංස්කෘත හෝ අසංස්කෘත ධර්මයක් ලෙස වර්ග කළ නොහැකි අව්‍යාකෘතයක් බව ද පවසන ලදි. මේ අදහස් පිළිගත් පිරිස එම ග්‍රන්ථ නමයේ අභිධර්මය පෙරදැරි කර ගනිමින් වාත්සිපුත්‍රීය නමින් නිකායක් පිහිටුවා ගත්හ. ථෙරවාදී ආභිධර්මිකයන් අතර මෙම භේදය හටගන්නා සමයෙහි කථාවත්ථුප්පකරණය රචනා වී නො තිබිණි. එහෙයින් මෙම වාදය හා සර්වාස්තිවාදය පිළිබඳ විවේචන කථාවත්ථුවේ ඇතුළත් කරන්නට හැකි විය.

අභිධර්ම සාහිත්‍යයෙන් සැහෙන කොටසක් අවශ්‍යයෙන් ම සූත්‍ර පිටකයේ ධර්ම කොට්ඨාශයක් විග්‍රහ කරමින් ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් සාකච්ඡා කරමින් විධිමත් ධර්ම ප්‍රකරණයන් සේ සංගෘහිතව ඇතැයි ඒ. කේ. වෝඩර් ප්‍රකාශ කරයි. මෙම කාර්යය බුද්ධ කාලයේ ම සමාරම්භවූ බව ගැන විවාදයක් නැත. බුද්ධකාලීන සංඝරත්නය අභිධර්ම කථාවෙහි නිරතව සිටි අවස්ථා ගැන සූත්‍ර පිටකයෙහි ග්‍රන්ථවල දැක්වෙන්නේ එහෙයිනි. මෙහිදී අභිධර්මය හා සාරිපුත්ත මහ රහතන් වහන්සේ අතර සම්බන්ධය ද සැළකිය යුත්තකි. සම්ප්‍රදායික මතය අනුව දිව්‍යලෝකයේ දී දේශනා කළ අභිධර්මය බුදුරදුන් විසින් සාරිපුත්ත හිමියනට උගන්වන ලදි. අනිකුත් භික්ෂූන් වහන්සේලා එය උගත්තේ සාරිපුත්ත හිමියන් වෙතිනි. සර්වාස්තිවාදීන්ගේ සංගීති පර්යාය සූත්‍රයේ දැක්වෙන්නේ සාරිපුත්ත හිමියන් අභිධර්ම විවරණ මහා සංඝයාට දේශනා කළ විට ඒවා අනුමත කිරීම බුදුරදුන් විසින් කර ඇති බව ය. ධර්මගුප්තික නිකායේ අභිධර්මය හඳුන්වන්නේ ශාරිපුත්‍රාභිධර්ම ශාස්ත්‍රය නමිනි. මේ හැරෙන්නට බහුශ්‍රැතීය නිකායට ද අභිධර්මයක් තිබිණ. මහායානිකයන් අතර විශේෂ අභිධර්ම පිටකයක් සඳහන් නොවුණ ද අභිධර්ම පිටකයන්හි ආ අදහස් විවේචනය කරමින් නව අභිධර්ම ග්‍රන්ථ කිහිපයක් යෝගාචාර නිකායේ භික්ෂූන් වහන්සේලා විසින් රචනා කරන ලදි. එම ග්‍රන්ථ ද අභිධර්ම ග්‍රන්ථ වශයෙන් හැඳින්වූවාට වරදක් නැත. එසේ සමීක්ෂණය කරන විට,

(1) ථෙරීය විභජ්ජවාදී අභිධර්ම සාහිත්‍යය

(2) ථෙරීය සර්වාස්තිවාදී අභිධර්ම සාහිත්‍යය

(3) වාත්සී පුත්‍රීය හා ඔවුන්ගේ අනුනිකායිකයන් (ධම්මොත්තරිය භද්‍රයානික, ෂණ්ණාගාරික, සම්මිතීය) විසින් නිර්මිත පුද්ගලවාදී අභිධර්ම සාහිත්‍යය

(4) ධර්මගුප්තික නිකායේ ශාරිපුත්‍රාභිධර්මය

(5) බහුශ්‍රැතීය නිකායේ අභිධර්මය

(6) මහායාන යෝගාචාර නිකායේ අභිධර්මය

(7) සෞත්‍රාන්තිකයන් අභිධර්මය විවේචනය කරමින් ඉදිරිපත් කළ සාහිත්‍යය

යන වශයෙන් ඉතා පෘථුල අභිධර්ම සාහිත්‍යයක් පිළිබඳව අපට කථා කළ හැකි වෙයි. මේ හැර විවිධ මහාසංඝික නිකායයන් විසින් ඉදිරිපත් කළ විකල්ප අභිධර්ම කෘති ද රාශියක් තිබෙන්නට ඇත. එහෙත් දැනට අපට ඉතිරිව ඇත්තේ ඉතා ස්වල්ප කෘති ප්‍රමාණයක් පමණි. නිදසුනක් වශයෙන් පුද්ගලවාදී නිකාය පහ විසින් රචිත අති මහත් ග්‍රන්ථ සමූහයෙන් අද අවශේෂව ඇත්තේ සම්මිතීය අභිධර්ම ශාස්ත්‍රය පමණි.



Free Distribution www.thiryak.org

(එය ද ලැබුණේ චීන බසිනි. ශාන්ති තිකේතනයේ චෙත්කථරමණන් විසින් එය ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන ලදි.) මේ හැම අභිධර්ම සම්ප්‍රදායයක් ම බෞද්ධ චින්තනයේ පොදු උරුමයට හිමිකම් කියන අතර විස්තර ව්‍යාඛ්‍යානයන්හි දී වෙනස්කම් දක්වති. විභජ්ජවාදීන්ගේ පට්ඨාන ප්‍රකරණය ප්‍රත්‍ය විසිහතරක් ගැන කරුණු දක්වනත් සර්වාස්තිවාදීන් ගේ අභිධර්මයේ ප්‍රත්‍ය හතරක් පමණක් දැක්වෙයි. (ඔවුහු හේතු හයක් ද දක්වති.) ශාරිපුත්‍රාභිධර්මයේ ප්‍රත්‍ය දහයක් හා හේතු තිස්තුනක් දක්වති. මෙසේ යම් යම් ප්‍රභේද දක්නා ලැබෙන්නේ අභිධර්ම පිටකයන්ගේ සංවර්ධනය නිකාය භේදයෙන් පසුව ද සිදු වූ හෙයිනි. වෙනත් විදියකින් කිවහොත් අභිධර්මය පිළිබඳව ඇතිවුණු මතභේද නිකාය භේද රාශියකට මුල් වූ බව කිව හැක. අපි අභිධර්මය පසෙක ලා සූත්‍ර කරා යමු යැයි සෞත්‍රාන්තික නිකායේ අය පැවසුවේ ද මෙම මතභේද අභිධර්මය නිසා සිදුවන බව පෙනුණු හෙයිනි. එහෙත් ඒ වනවිට ඇති වී තිබුණු ගැටළුවලින් මඟ හරින්නට ඔවුන්ට නො හැකි විය. එහෙයින් අභිධර්ම පිටකය ප්‍රතික්ෂේප කළත් අභිධර්ම ගැටළු මඟ හරින්නට බැරි වූ තැන ඔවුහු අභිධර්මයට විකල්ප සාහිත්‍යයක් ඉදිරිපත් කළහ. එය ද අභිධර්ම නම නැතත් අභිධර්මයක් ම බව කිවයුතු ය.

ථෙරිය විභජ්ජවාදී සම්ප්‍රදායයෙහි අභිධර්ම කෘති හතක් දක්නා ලැබේ. එනම්,

(1) ධම්මසංගණිප්පකරණ
(2) විභංගප්පකරණ
(3) පුග්ගලපඤ්ඤත්තිප්පකරණ
(4) ධාතුකථාප්පකරණ
(5) කථාවත්ථුප්පකරණ
(6) යමකප්පකරණ
(7) පට්ඨානප්පකරණ

වශයෙනි. මේවා ඍජු ලෙස ම සම්බුද්ධ භාෂිත කෘති බව ථෙරවාදී අට්ඨකථාව අවධාරණය කරයි. මෙහිදී මොග්ගලීපුත්තතිස්ස හිමියන් කථාවත්ථුප්පකරණය සකස් කිරීම පිළිබඳව ප්‍රශ්නයක් මතු වීම වැළැක්විය නො හැක. ථෙරවාදී අටුවාචාරීන් එයට පිළිතුරු දෙන්නේ මොග්ගලීපුත්ත තිස්ස හිමියන් එම කෘතිය කර ඇත්තේ බුදුරජුන් විසින් දෙන ලද න්‍යායය පදනම් කරගෙන නිසා එහි කර්තෘත්වය ඒ හිමියනට නොව බුදුරදුන්ට ම හිමිවන බවයි.

ධම්මසංගණිප්පකරණය ථෙරවාදී අභිධර්මයෙහි කේන්ද්‍රීය ප්‍රකරණය බව කිව යුතු ය. එය අභිධර්මයේ මූලික ලක්ෂණය වන සංඛ්‍යාලේඛනයක් බඳු ප්‍රභේද කරණයක් විලාශයෙන් ධර්ම පිළිබඳ විභාගයක් ඉදිරිපත් කරයි. එය ආරම්භ වන්නේ 'මාතිකා' නමින් හැඳින්වෙන පූර්ණ මාතෘකා පෙළකිනි. මෙම මාතෘකා ධම්මසංගණියට පමණක් නොව සමස්ත අභිධර්ම පිටකයට ම පොදු බව සැළකිය යුතු ය. මාතෘකා එකසිය විසි දෙකක් වශයෙන් වර්ග වෙයි. එයින් මුල් විසිදෙක ත්‍රික නමින් හැඳින් වේ. ඉතිරිය දුක වශයෙන් හැඳින් වේ. ත්‍රික නමින් හඳුන්වන්නේ තුන



Free Distribution www.thiryak.org

බැගින් ඉදිරිපත් කළ හැකි ධර්මයෝ ය. තිදසුතක් වශයෙන් දක්වතහොත් කුසල, අකුසල, අව්‍යාකත යන තුන කුශල ත්‍රිකය ලෙස දැක්වේ. සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන තුන වෙදනා ත්‍රිකය සේ දැක්වේ. මෙබදු ත්‍රික විසිදෙකකි. දුක හෙවත් දෙකේ ගණවලට නිදසුන් සේ හේතු – නහේතු යන දෙක, හේතු දුකය ලෙස ද, සහේතුක, අහේතුක දෙක සහේතුක දුකය සේද දක්වා තිබීම පෙන්වා දිය හැක. මෙම ලැයිස්තු දෙක තිමවත්තේ සුත්තන්තමාතිකා නම් වූ ධර්ම ගණ හතළිස් දෙකකිනි. ඒවා අභිධර්මයට නොව සූත්‍රවලට අයත් ප්‍රභේද වුව ද සැරියුත් හිමියන් විසින් ඒවා ද ධම්මසංගනී මාතිකාවලට එක් කළ බව අටුවාවේ දැක් වේ.

මාතෘකාවලින් අනතුරුව ධම්මසංගණිය කාණ්ඩ හතරකින් අභිධර්මයෙහි මූලික විෂය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි. එම කාණ්ඩ හතර නම්,

(1) චිත්තුප්පාද කාණ්ඩය – චිත්ත හා චෛතසික ධර්ම පිළිබඳව කුසලා කුසල හා අව්‍යාකත වශයෙන් සළකා බලමින් ඒවායේ පහළවීම පිළිබඳව සාකච්ඡා කරයි. ඒවා කාමාවචර, රූපාවචර, අරූපාවචර, හා ලොකුත්තර භූමිවල පවත්නා ආකාරය ප්‍රශ්නෝත්තර වශයෙන් සාකච්ඡා වෙයි. අනතුරුව ඒවා කුසල, අකුසල, අහේතුක වශයෙන් කවර අයුරින් ප්‍රභේද වත්තේදැයි විග්‍රහ වෙයි. මේවා ධම්මවවත්ථානවාරයේදී සොමනස, දෙමනස වැනි කවර ගුණයක් තිබේදැයි දක්වනු ලැබේ. කොට්ඨාශවාරයේදී ඛන්ධ, ආයතන, ධාතු ආදී කොටස් වශයෙන් වර්ග කරනු ලැබේ. සුඤ්ඤතවාරයේ දී ආත්ම වැනි දෙයින් ශූන්‍ය බව පැහැදිලි කරනු ලැබේ. කොට්ඨාසවාර, සුඤ්ඤතවාර වශයෙන් වඩාත් සියුම් ව විග්‍රහ කරනු ලැබේ.

(2) රූප කාණ්ඩය – භෞතික රූප පිළිබඳ සාකච්ඡාව ද මාතෘකාවලදී දැක්වූ ප්‍රථම ත්‍රිකය අනුව ම කෙරෙයි. චිත්තුප්පාදයේදී කෙටියෙන් දැක්වූ අව්‍යාකත ධම්ම මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නේ රූප අයත් වන්නේ ඒ ගණයට හෙයිනි. රූප 28ක් සාකච්ඡාවට භාජන වෙයි.

(3) නික්ඛෙප කාණ්ඩය – මුලදී වර්ග කර ගන්නට නොලද පරිද්දෙන් ඒ ඒ මාතෘකාවන් අතුරින් එක් එක් පදයෙන් සංග්‍රහ කළ යුතු ධර්ම සංඛ්‍යාව මෙතෙකැයි වෙන්කර දැක්වීම මෙහිදී සිදු වෙයි.

(4) අට්ඨකථා කාණ්ඩය – මෙය අතිරේක සංග්‍රහයකි. කුශල යනු කුමක්ද ? අකුශල යනු කුමක් ද, ආදී වශයෙන් ප්‍රශ්න නගා පැහැදිලි කිරීම මෙයින් සිදු වෙයි.

**විභංගප්‍රකරණය**

ධර්ම පිළිබඳ විවිධ වර්ගීකරණ ඇතුළත් විභංගප්‍රකරණයෙහි මාතෘකා දහඅටක් න්‍යාය තුනකට අනුව විභාග කර දක්වනු ලැබේ. ඒ මාතෘකා දහඅට මෙසේ ය.

| | |
|---|---|
| (1) ඛන්ධ | (2) ආයතන |
| (3) ධාතු | (4) සච්ච |
| (5) ඉන්ද්‍රිය | (6) පටිච්චසමුප්පාද |



Free Distribution www.thiryak.org

| | |
|---|---|
| (7) සතිපට්ඨාන | (8) සම්මප්පධාන |
| (9) ඉද්ධිපාද | (10) බොජ්ඣංග |
| (11) මග්ග | (12) ඣාන |
| (13) අප්පමඤ්ඤ | (14) සික්ඛාපද |
| (15) පටිසම්භිද | (16) ඤණ |
| (17 ඛුද්දකවත්ථු | (18) ධම්මපදය |

මේවා මුලින් ම සූත්‍ර පිටකයෙහි ඇතුළත් ක්‍රමයට අනුව විභාග කර එය සුත්තන්ත භාජනීය වශයෙන් හඳුන්වනු ලැබේ. එම පද ම අභිධර්මයෙහි ක්‍රමයට අනුව විග්‍රහ කරන විට අභිධම්ම භාජනීය නම් වේ. අනතුරුව ප්‍රශ්න තබා පිළිතුරු සැපයීමේ ක්‍රමයට සාකච්ඡා කෙරෙයි. එම න්‍යාය හඳුන්වන්නේ පඤ්හ පුච්ඡා වශයෙනි.

විභංගයෙහි සාකච්ඡා කෙරෙන කරුණු දහඅටෙන් මුල් 6 තුළ සත්වයන්ගේ මානසික හා කායික සංඝටක ඇතුළත් වන අතර එම සංඝටකයන් හසුරුවන ප්‍රධාන නියාම දෙක වශයෙන් අනිච්ච හා පටිච්ච සමුප්පාද දැක්වේ. හත්වැන්නේ සිට දොළොස්වැන්න දක්වා ඇති ධර්ම සත්වයන් සසරින් මුදවන මාර්ගයෙහි අංග වෙති. දහතුන් වැන්නේ සිට 18 වැන්න දක්වා ඇත්තේ මුල් කොටසේ කරුණු පිළිබඳ වඩාත් පරිපූර්ණ ලෙස කෙරෙන විග්‍රහ වෙති.

**ධාතු කථා**

මෙය මුල් පොත් දෙක හා එක්ව ගත්විට අභිධර්මය පිළිබඳ ගැඹුරු දැනුමට අදාළ ප්‍රමුඛ ග්‍රන්ථය වශයෙන් හැඳින්විය හැකියයි විචාරකයෝ පවසති. මෙම කුඩා ප්‍රකරණයෙහි ධාතු පිළිබඳ විභංගයට ද වඩා ගැඹුරු විවරණයක් ඇතුළත් වෙයි. මෙහි උපයුක්ත විශ්ලේෂණ ක්‍රමය විභංග ක්‍රමයට වෙනස් ය. තික හා දුක ආදී මාතිකා වශයෙන් මුල් ග්‍රන්ථවල දී කැටි කළ ධර්ම ධාතු කථාවෙහිදී ස්කන්ධ, ධාතු හා ආයතන වශයෙන් බෙදා දහහතර ආකාරයකට විශ්ලේෂණය කිරීම මෙහිදී සිදුවෙයි. එම දහහතර විධිය ග්‍රන්ථයේ පරිච්ඡේද දහහත බවට පත්වෙයි.

**පුග්ගල පඤ්ඤත්ති**

අභිධර්මයේදී ධර්ම විභාගයෙහි පදනම වශයෙන් සම්මුති හෙවත් පඤ්ඤත්ති වශයෙන් එක් ධර්ම වර්ගයක් ද පරමත්ථ වශයෙන් තවත් ධර්ම වර්ගයක් ද දක්වනු ලැබේ. පරමාර්ථ සත්‍යය විසුක්ත පද භාවිතය මගින් විග්‍රහ කිරීම අභිධර්මයේ මූලික අරමුණ වුවත් හුදෙක් පරමාර්ථ වශයෙන් පමණක් ධර්ම සාකච්ඡා කිරීම දුෂ්කර කටයුත්තකි. ශ්‍රාවකයනට කරුණු අවබෝධ කිරීම පිණිස ලෝක සම්මුතියට අනුව දෛනික ව්‍යවහාර පද හා සංකල්ප භාවිත කිරීමට සිදුවෙයි. අභිධර්මය දෙවිදියක ප්‍රඥප්ති ගැන කථා කරයි. ප්‍රථම වර්ගය ලොව සැබැවින් ම ඇති දේ ගැන ද සඳහන් කරන අතර දෙවන වර්ගය යථාර්ථ වශයෙන් නැති දේ ගැන සඳහන් කරයි. යථාර්ථ වශයෙන් ම විද්‍යමාන ප්‍රඥප්ති ගණයට වැටෙන්නේ ස්කන්ධ, ධාතු, ආයතන හා ඉන්ද්‍රිය වැනි දේ ය. දෙවන වර්ගයට අයත් වෙන්නේ මිනිසා, ස්ත්‍රිය, දෙවියෝ, පුද්ගලයා වැනි යථාර්ථ වශයෙන් බලනවිට විද්‍යමාන නැතත් සාමාන්‍ය ලෝක ව්‍යවහාරය සඳහා අවශ්‍ය හෙයින් පිළිගත යුතු ප්‍රඥප්තිය.



Free Distribution www.thiryak.org

අභිධර්ම පිටකයෙහි මුල් ග්‍රන්ථ වූ ධම්මසංගනී, විභංග හා ධාතු කථා යන ග්‍රන්ථවලදී මුල් ගණයට වැටෙන ස්කන්ධ, ධාතු, ආයතන, සච්ච හා ඉන්ද්‍රිය පිළිබඳව සාකච්ඡා හා විශ්ලේෂණ ප්‍රමාණවත්ව සිදුකර ඇත. පුග්ගල පඤ්ඤත්ති ග්‍රන්ථය ඉතිරි ප්‍රඥප්ති පිළිබඳ සාකච්ඡා කිරීම අරමුණ කර ගත්තකි. එහෙත් පඤ්ඤත්ති පිළිබඳ සාකච්ඡාවක් අංග සම්පූර්ණ වීමට තම පූර්වෝක්ත විද්‍යමාන ප්‍රඥප්ති පිළිබඳව ද සඳහන් කිරීම අවශ්‍ය හෙයින් ඒවා පිළිබඳව ද කෙටියෙන් දක්වා ඇත. ඛන්ධ පඤ්ඤත්ති, ආයතන පඤ්ඤත්ති, ධාතු පඤ්ඤත්ති, සච්ච පඤ්ඤත්ති, ඉන්ද්‍රිය පඤ්ඤත්ති සහ පුග්ගල පඤ්ඤත්ති වශයෙන් මෙහි පරිච්ඡේද හයකි. හයවන පරිච්ඡේදයේ නම පොතෙහි නම වශයෙන් යොදා ඇත්තේ පොතෙහි මූලික අරමුණ පුද්ගල වශයෙන් ගත හැකි අවිද්‍යමාන ප්‍රඥප්තීන් පිළිබඳ දීර්ඝ විග්‍රහයක් කරන හෙයිනි. මෙහි දී අංගුත්තර නිකායේ ද භාවිත ක්‍රමය වන උත්තරෝත්තර ක්‍රමයට සංඛ්‍යාගත කළ පුද්ගල වර්ග අනු පිළිවෙළින් දක්වා ඇත. එබඳු අනු ඛණ්ඩ දහයක් එම පරිච්ඡේදය තුළ දක්වා තිබේ.

**කථාවත්ථුප්පකරණ**

මෙම ග්‍රන්ථය (පුග්ගල පඤ්ඤත්තිය මෙන් ම) සාමාන්‍ය පරමාර්ථ සත්‍ය විග්‍රහ ක්‍රමයෙන් බැහැරව ව්‍යවහාරික ගැටළුවක් වූ ධර්ම විරෝධී මති මතාන්තර විවේචනය හේතුවෙන් කැප වූවකි. ''පුද්ගලයෙක් ඇත'' ''ආත්මයක් ඇත'' වැනි ධර්මය විකෘති කරන සංකල්ප බෞද්ධ නිකායාන්තරයන් අතර ඇති වූ හෙයින් ඒවා නිසි සේ නිරාකරණය කොට ථෙරවාදී විභජ්ජවාදී ස්ථාවරය තහවුරු කරලනු පිණිස මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ විසින් ධර්මාශෝක රාජ සමයේ දී මෙම ග්‍රන්ථය රචනා කරන ලදී. එහෙත් මේ සඳහා භාවිත කර ඇත්තේ බුදුරදුන් විසින් ම දෙන ලද න්‍යාය හෙයින් මෙය ද බුද්ධ වචන වශයෙන් ම සලකා ථෙරවාදී අභිධර්ම පිටකයට ඇතුළත් කර ඇත.

කථාවත්ථුප්පකරණයේ ඇතුළත් කරුණු සකවාද (තම පක්ෂයේ මතය) හා පරවාද (ප්‍රතිවාදීන් ගේ මතය) වශයෙන් දෙවැදෑරුම් වෙයි. සකවාද පන්සියයක් ද පරවාද පන්සියයක් ද මෙහි ඇතුළත් ය. ඒවා ඉදිරිපත් කර ඇත්තේ ප්‍රතිවාදියකු හා මොග්ගලී පුත්තතිස්ස හිමියන් අතර ඇති වන විවාදයක විලාසය අනුගමනය කරමිනි. වාද ප්‍රතිවාද සාකච්ඡා රටාවෙන් ඉදිරිපත් කරන මෙම රීතිය වෙනත් අභිධර්ම ග්‍රන්ථවල රීතියට බෙහෙවින් වෙනස් ය. ඒ වන විට ඇතිව තිබූ මිථ්‍යාමත මෙන් ම ඇති වෙතැයි හැඟුණු මත ද මෙයට ඇතුළත් කර සාකච්ඡා කළ බව කියනු ලැබේ. මේ අදහස් කවර කවර නිකායයනට අයත්දැයි හඳුන්වා දෙනු ලබන්නේ කථාවත්ථු අටුවාවෙනි.

**යමකප්පකරණ**

බෞද්ධ තර්ක හෙවත් න්‍යාය ශාස්ත්‍රයේ මූල ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකි යැයි රිස් ඩේවිඩ්ස් පඬිතුමා විසින් හඳුන්වනු ලබන මේ ග්‍රන්ථය බෞද්ධ දර්ශනික ගැටළු හා පාරිභාෂික පද පිළිබඳ විවක්ෂණයක් වශා කර ගැනීම පිණිස අදාළ වන්නකි.



Free Distribution www.thiryak.org

අභිධර්ම පිටකයට අයත් ධම්මසංගණී, විභංග හා ධාතු කථා යන ග්‍රන්ථවලින් සංඛාර ලෝකයේ පවතින ධර්මයන් පිළිබඳව පැහැදිලි කරන ලදි. පුග්ගල පඤ්ඤත්ති හා කථාවත්ථු මගින් සත්ව ලෝකය හෙවත් පුද්ගලයන් හෝ ජීවීන් විසින් නිරූපණය කරනු ලබන යථාර්ථ නොවූ එහෙත් යථාර්ථ වශයෙන් පෙනෙන ලෝකය පිළිබඳව සාකච්ඡා කරන ලදි. සංඛාර ලෝකය හා සත්ව ලෝකය පවතින්නේ එකට ය. මේ දෙක ම එක් කර ඕකාසලෝක (අවකාශ ලෝකය) වශයෙන් හැඳින් වේ. මෙම ලෝකත්‍රය ම එකට ගෙන එහි පවතින ධර්ම හා පුද්ගල අතර පවත්නා අන්තර් සම්බන්ධතා විශ්ලේෂණය කිරීම යමක මහා ප්‍රකරණයෙන් කරනු ලැබේ. යමකය මෙම කාර්‍ය්‍යය ඉටු කරන්නේ ධර්ම යුගල වශයෙන් ගැනීමෙනි. එක් එක් පදයක සම්පූර්ණ වැදගත් කම හා සීමාවන් තීරණය කිරීම සඳහා අනුලෝම හා පටි ලෝම යන තාර්කික ප්‍රතිපද දෙක අනුව මෙම විමර්ශනය සිදු කෙරේ. මෙහිදී කිසියම් පදයක් පිළිබඳ සංශයක් ඇති වීම වැළකීම සඳහා වෙනත් අර්ථ එයට නොගැළපෙන ආකාරය තහවුරු කිරීම ද කරනු ලැබේ. මේ කාර්‍ය්‍යයන් ඉටුකර ගන්නේ ප්‍රශ්න තහා පිළිතුරු දීමේ රටාවෙනි.

නිදසුනක් වශයෙන් :-

සියළු රූප රූපස්කන්ධ ද? යන්නට පිළිතුරු වශයෙන් රූප යන්න ප්‍රිය රූප, මෙබඳු රූප වැනි වාක්‍යාංශ වල ද යෙදෙයි. එහෙත් ඒ තැන්හි රූප යන්නෙන් රූපස්කන්ධය නොහැඟේ යයි පවසා සියළු රූපස්කන්ධ රූප ද යන ප්‍රශ්නය තහා එයට එසේය' යන පිළිතුර දෙනු ලැබේ. රූපස්කන්ධ යන්න පුළුල් අරුත් ඇති පදයක් හෙයින් එයට පියරූප – එවරූප වැනි පද ඇතුළත් වෙයි.

**පට්ඨානපපකරණ**

මෙය විශාලතම අභිධර්ම ප්‍රකරණය වන අතර අභිධර්ම පිටකයෙහි සංශ්ලෂණ කාර්‍ය්‍යය ඉටුකරන ග්‍රන්ථය සේ ද හැඳින්වෙයි. ධම්මසංගනියෙහි දක්වූයේ ධර්ම විශ්ලේෂණය කරන ආකාරයයි. ධර්ම බෙදමින්, විග්‍රහ කරමින් කරනු ලබන විවරණ හේතුවෙන් අභිධර්මය නම් බහුත්ව වාදයකි යන මිථ්‍යාදෘෂ්ටිය කිසිවකුට ඇති වුවහොත් එය දුරුවීමට ධර්ම සංශ්ලෂණයක් වූ පට්ඨාන මහා ප්‍රකරණය උපකාර වෙයි. ධර්ම නම් එකිනෙකට අසම්බන්ධව පරිබාහිරව වියුක්තව පවතින දේ නොවෙති. ඒවා අතර අන්තර් සම්බන්ධතා පවතියි. ඒවා එකිනෙකට බැඳුණු සුසංයුක්ත ඒකක රාශියකි. කුඩා ම ධර්ම ඒකකය පවා අතිකුත් ධර්ම කෙරේ බලපාමින් ඒවායින් බලපෑම් ලබා ගනියි. මෙම සංශ්ලෂි අන්‍යෝන්‍ය සම්බන්ධතාජාලය අතිශය සියුම්, සංකීර්ණ හා ගැඹුරු එකකි. පට්ඨානය එම සම්බන්ධතා විසිහතර ආකාරයකින් දක්වයි.

ග්‍රන්ථය ප්‍රධාන කොටස් හතරකින් සමන්විත වෙයි.

(1) අනුලෝම පට්ඨානය – ධර්ම අතර ප්‍රත්‍යය සම්බන්ධතාවන් පවත්නා ස්ථාන විග්‍රහ කරයි.

(2) පච්චනීය පට්ඨාන – ධර්ම අතර ප්‍රත්‍යය සම්බන්ධතා නො පවත්නා ස්ථාන විග්‍රහ කරයි.



Free Distribution www.thiryak.org

(3) අනුලෝමපච්චනීය පට්ඨාන – සමහර ප්‍රත්‍යය සම්බන්ධතා පවත්නා සහ සමහර සම්බන්ධතා නො පවත්නා තැන් පිළිබඳව දක්වයි.

(4) පච්චනීයඅනුලෝම පට්ඨාන – සමහර පච්චය සම්බන්ධතා නැති නමුත් සමහර ඒවා පවත්නා තැන් දක්වයි.

පටිච්ච සමුප්පාදයෙහි අංග අතර පවත්නා සූවිසි ප්‍රත්‍යයන් මෙම චතුර්විධ ප්‍රභේදය තුළ ආකාර හයකට ක්‍රියාත්මක වන බව දක්වා තිබේ.

(1) තික පට්ඨාන – සූවිසි ප්‍රත්‍යය තික විසි හතරක් අනුව යෙදේ.

(2) දුක පට්ඨාන – සූවිසි ප්‍රත්‍යය දුක සියයක් අනුව යෙදේ.

(3) දුක – තික පට්ඨාන – දුක සියය තික විසිහතරට මිශ්‍රව යෙදේ.

(4) තික – දුක පට්ඨාන – විසිහතරක් වූ තික, සියයක් වූ දුක හා මිශ්‍රව යෙදේ.

(5) තික – තික පට්ඨාන – තික විසිහතර එකිනෙක මිශ්‍රව යෙදේ.

(6) දුක – දුක පට්ඨාන – සියයක් දුක සියයක් දුක හා එකිනෙක මිශ්‍රව යෙදේ.

(මෙහි දී දුක නමින් දෙකේ ගොඩ යන්න ද තික යන්නෙන් තුනේ ගොඩ යන්න ද අදහස් වෙයි.)

මෙසේ සතරාකාර සිවු පට්ඨානය ෂඩාකාර සය පට්ඨානය හා මිශ්‍ර වූ විට කාණ්ඩ 24ක් වන හෙයින් මහා ග්‍රන්ථයක් බවට පට්ඨානය පත්වෙයි. එහෙයින් ටීකානු ටීකාවන්හි එය අනන්තනය සමන්තපට්ඨාන ලෙස හඳුන්වා ඇත.



Free Distribution www.thiryak.org

## 4 වන පරිච්ඡේදය

# සංඛත – අසංඛත ධර්ම

'ධර්ම' යන වචනය බුදු සමයෙහි විවිධ අර්ථ හැඟවීම සඳහා යෙදුණු ජනප්‍රිය පදයකි. එයට අරුත් කීමේදී යෙදී ඇති පරිසරයට අනුව කරනු ලබන්නේ එහෙයිනි. 'ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං' යන්නෙහි එන ධම්ම යන වචනය 'සබ්බෙ ධම්මා අනත්තා' යන්නෙහි එන අර්ථය නොවේ. කුසලා ධම්මා, අකුසලා ධම්මා වැනි තැන්වල ඊටත් වෙනස් අර්ථයකි. මෙසේ ධම්ම යන වචනයට අටුවාවලදී ගුණ, දෙසනා, පරියත්ති, නිස්සත්ත – නිජ්ජීව, සුඤ්ඤතා, හෙතු, සච්ච, චතුසච්ච, සමාධි, පඤ්ඤා, පකති, සභාව, පුඤ්ඤ, ආපත්ති, ඤෙය්‍ය යන අරුත් විවිධ සන්දර්භවලදී ඉදිරිපත් කර ඇත. මෙම විවිධාර්ථවත් බව සූත්‍ර පිටකයෙහි හා විනය පිටකයෙහි පමණක් නොව අභිධර්ම පිටකයෙහි ද දක්නා ලැබේ.

අභිධර්ම පිටකයෙහිදී 'ධම්ම' යන්න හැකි තරම් නිශ්චිත පරිද්දකින් සමස්ත ඥෙය විෂය (නුවණින් දතහැකි සියළුම කරුණු) හැඳින්වීම සඳහා උපයෝගී කරගෙන ඇති බව පෙනේ. අභිධර්මයෙහි කාර්යය වන්නේ 'ධර්ම ප්‍රවිචය' හෙවත් ධර්ම පිළිබඳ විභාග කිරීමයි. එහිදී ධර්ම වශයෙන් ගැණෙන සියල්ල සංඛත හා අසංඛත වශයෙන් නිරවශේෂ බෙදුමකට (ඉතිරි නොවන සේ බෙද දැක්වීම) භාජන කරනු ලැබේ. සූත්‍ර පිටකයෙහි ධර්ම විභාග පදනම් කරගෙන වඩාත් ශාස්ත්‍රීය ආකාරයෙන් යථාර්ථය විවරණය කිරීම සඳහා මෙම සංඛත – අසංඛත භේදය උපයෝගී කරගනු ලැබේ.

සංඛත යන්නෙන් ''විවිධ සාධක සමවායයෙන් ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායානුකූලව හටගත්'' යන අරුත හැඟවෙයි. සංස්කරණය වූ හටගත් ඕනෑම දෙයක් සංඛත වශයෙන් හැඳින්විය හැක. සංස්කෘත හා සිංහල භාෂාවන්හි යෙදෙන 'සංස්කෘත' යන්නෙහි තේරුම ද සැකසුණු යන්නයි. අසංඛත යන්නෙන් මෙහි විරුද්ධාර්ථය හැඟවෙයි. කිසිම හේතු – ප්‍රත්‍යාදී දෙයකින් සකස් නොවූ දෙයක් එයින් හැඟවේ. අභිධර්මයෙහි ඉගැන්වෙන චිත්ත, චෛතසික හා රූප යන ත්‍රිවිධ පරමාර්ථ ධර්ම මේ ගණයට අයත්ය. ථෙරවාදී බුදු සමයෙහි පිළිගැනෙන එකම අසංස්කෘතය නිර්වාණ ධර්මය පමණි. වෙනත් බෞද්ධ සම්ප්‍රදායයන්හි ආකාශය ද අසංස්කෘතයක් සේ පිළිගෙන ඇත. කිසිවකින් තොර හිස් අවකාශය උපන් හටගත් හෝ සැකසුණු දෙයක් නොවන බව යන තේරුමෙන් එය දක්වා ඇත. නිර්වාණය ද ප්‍රතිසංඛ්‍යා නිරෝධ හා අප්‍රතිසංඛ්‍යා නිරෝධයැයි දෙකකට බෙද ආකාශය ද සමඟ එකට ගෙන අසංස්කෘත ධර්ම තුනක් කොට එම සම්ප්‍රදායයන්හි දක්වනු ලැබේ. එහෙත් ථෙරවාදී අභිධර්මයෙහි ඉගැන්වීම අනුව ලොව ඇත්තේ එකම අසංස්කෘතයක් පමණි. එනම් නිර්වාණයයි.



5 - ශ්‍රමු.නී.ස. 100236

Free Distribution www.thiryak.org

පටිච්ච සමුප්පාදයෙහි 'අවිජ්ජා පච්චයා සංඛාරා' යන්නෙහි සංඛාරා නමින් හඳුන්වන්නේ කුසල හා අකුසල සංස්කාර පමණි. සංචේතනිකව කාය – වචී – මනෝ යන ත්‍රිවිධ ද්වාරයෙන් කරනු ලබන ක්‍රියාවල ගුණය සංස්කාර ලෙස හැඳින්වෙන්නේ සත්වයන්ගේ සාංසාරික පැවැත්මෙහි සංස්කාරක ප්‍රවේගය එය හෙයිනි. 'සකස් කරන' යන අර්ථය එහිදී ඉස්මතු වේ. සංඛත – අසංඛත භේදයෙහි ලා දැක්වෙන 'සංස්කාර' යන්නෙන් හටගත් ධර්ම හැඟවේ. 'සබ්බේ සංඛාරා අනිච්චා' යන්නෙහි 'සංඛාරා' යන පදයෙන් දක්වා ඇත්තේ හේතු – ප්‍රත්‍ය සමවායයෙන් හටගත්තා සංඛත ධර්ම ය. අභිධර්මයේදී සංඛත ධම්ම වශයෙන් නිර්වචන කරනු ලබන්නේ ද ඒවාමය.

මෙයින් හැඟෙන්නේ ලොව පවත්නා සෑම දෙයක් ම නිරවශේෂ වශයෙන් සංඛත හා අසංඛත යන භේදයට ඇතුළත් බව ය. මෙයින් බැහැර කිසිවක් පිළිබඳව කිසිවකුට කථා කළ නොහේ. ඉන්ද්‍රියානුභූතික (ඉඳුරන් ඇසුරෙන් දතහැකි) අතීන්ද්‍රියානුභූතික (අභිඥා මගින් දතහැකි) හෝ පාර අනුභූතික (ඉඳුරන් හෝ අභිඥා මගින් දත නොහැකි) කිසිම සත්තාවක් 'ධම්ම' යන සර්වග්‍රාහී පදයෙන් පිටතට නො ගැනෙන අතර සංඛත අසංඛත ව්‍යවහාරය ඒ සියල්ල මුළුමනින්ම හසුකර ගනියි. එහෙයින් අභිධර්ම පිටකයෙහි එන සංඛත – අසංඛත ධර්ම විග්‍රහය සමස්ත යථාර්ථයේ ම ලක්ෂණ කථනයක් සේ හැඳින්විය හැක.

සංඛත හා අසංඛත ධර්මයන් ගේ යථා තත්ත්වය පසක් කිරීම බෞද්ධ ආගමික ප්‍රතිඥාවෙහි අවශ්‍ය අරමුණක් බව උගන්වා තිබේ.

> සබ්බෙ සංඛාරා අනිච්චා ති. . .
> සබ්බෙ සංඛාරා දුක්ඛා ති. . .
> සබ්බෙ ධම්මා අනත්තාති. . .
> යද පඤ්ඤාය පස්සති
> අථ නිබ්බින්දති දුක්ඛෙ
> එස මග්ගො විසුද්ධියා

යන්නෙන් පැහැදිලි කරන්නේ එයයි. විසුද්ධිය හෙවත් නිවන්සුව ලබා ගැනීම සඳහා ඇති මග සියළු සංස්කාර අනිත්‍ය හා දුක් බව ද සියළු ධර්ම අනාත්ම බව ද නුවණින් දැන දැක ගැනීම බව මෙයින් ඉගැන්වේ. මෙහි 'සංඛාරා' යන පදයෙන් සියළු සංඛත ධර්ම හඟවන අතර 'ධම්මා' යන්නෙන් සංඛත හා අසංඛත යන දෙවර්ගය ම හඟවයි. සංඛාර ධර්ම පිළිබඳව අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම යන තිලකුණු ම දත යුතු අතර අසංඛත ධර්ම සම්බන්ධයෙන් අනත්ත බව දතයුතු වෙයි. යමක් අනත්ත වන්නේ හුදෙක් අනිත්‍ය හා දුක නිසා ම නොවන බව මෙයින් ප්‍රකට වෙයි. ආත්ම වශයෙන් ගත යුතු පෞද්ගලික පැවැත්මක් නොමැති හෙයින් ද අනාත්ම වෙයි. යමක් ආත්ම වන්නේ නම් එහි ලා ආත්ම දෘෂ්ටිය හට ගනියි. දෘෂ්ටි යනු හානිකර වූ දෙයක් බව බුදු සමයෙහි ඉගැන්වෙයි. එහෙයින් නිර්වාණය පිළිබඳව පවා දෘෂ්ටි ඇතිකර නොගතයුතු බව බුදුසමය උගන්වයි.

සංස්කෘත ධර්මවල ලක්ෂණ කථනයේදී අනිච්ච, දුක්ඛ හා අනත්ත යනු වඩාත් පැහැදිලි කරනු පිණිස එහි පැවැත්ම තවදුරටත් සියුම්ව විග්‍රහ කර දක්වනු ලැබේ. ''තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි. උප්පාදෙ පඤ්ඤායති. වයො



Free Distribution www.thiryak.org

පස්සතියනි, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති'' යනුවෙන් එය දක්වා ඇත. ඒ අනුව සංස්කෘත ධර්මවල ලක්ෂණ තුනක් අනිවාර්යයෙන් ම දක්නා ලැබේ. එනම්, උපත විපත හා පැවැත්මෙ වෙනස් වීමයි. සෑම ධර්මයක ම සමාරම්භය පටිච්ච සමුප්පාද ක්‍රමයට සිදු වෙයි. ප්‍රත්‍ය සාමග්‍රිය හේතුවෙන් කිසියම් නාමයක් හෝ රූපයක් ප්‍රාදුර්භූත වීම උප්පාද නමින් හැඳින්වේ. එමෙන් ම එහි ප්‍රත්‍ය විසිර යාමෙන් ස්වරූපය වෙනස් වීමෙන් සිදුවන ක්‍රියාවලිය ඨිතස්ස අඤ්ඤථත්ත හා වය යනුවෙන් හැඳින්වේ. සූත්‍ර පිටකයේදී මෙසේ දක්වූ ලක්ෂණත්‍රය අභිධර්ම පිටකයේදී වඩාත් සූක්ෂ්මාවබෝධය පිණිස ක්ෂණ වශයෙන් බෙද දක්වේ. ඒ අනුව ධර්මයක පැවැත්ම ක්ෂණ තුනකින් විස්තර කර දක්වනු ලැබේ.

උප්පාදක්ඛණ - ඉපදෙන ක්ෂණය
ඨිතික්ඛණ - පවතින ක්ෂණය
භංගක්ඛණ - විනාශවන ක්ෂණය

මෙ ක්ෂණ තුන ධර්ම තුනක් නොවේ. එකම ධර්මයේ පැවැත්මෙ අවස්ථා තුනකි. එම ක්ෂණ තුන එකම ක්ෂණික ධර්මයක අවස්ථා තුනක් බව අවධාරණය වෙයි. මෙහි වැදගත් කරුණ නම්, ඨිතික්ඛණ යන්න ජරතාව වශයෙන් විස්තර වීම ය. එය නොවෙනස්ව පවතින මොහොතක් නොව දිරා යාමක් සිදුවන අවස්ථාවකි. අටුවාචාර්යයන් වහන්සේලා එය විස්තර කරන්නේ නවභාවාපගමය හෙවත් නව බව (අළුත් බව) ඉවත්ව යාම, (පරණවීම) වශයෙනි. යමක් පරණ වූ පමණින් එහි මූලික ස්වභාවය අතුරුදන් වන්නේ නැත. එහෙයින් ජරතාව නම් 'සභාවානපගම' (ස්වභාවය නැති නොවීම) වශයෙන් ද පැහැදිලි කර ඇත. එය වි පරණවීම (විහි පුරාණභාවො විය) වැනි ය. ථෙරවාදී අභිධර්මයේ පැවැත්ම පිළිබඳ විග්‍රහයේ සියුම්බව මෙයින් තේරුම් ගත හැක. ගතික බව අවධාරණය කරන අතර ම ධර්මයක පැවැත්ම පිළිගැනීම ද සියුම් ලෙස සමතුලිත අයුරකින් කර තිබීම වැදගත් ය. ජරතාව යනු නිරෝධාභිමුඛ අවස්ථාව හෙවත් නිරුද්ධ වීමට මුහුණ දී සිටින අවස්ථාව වශයෙන් ද දක්වා ඇත. ලොව කිසිවක් භංගක්ෂණයට ලක් නොවී නොසිටින බව ද භංගය අනිවාර්ය බව ද මෙයින් හැඟවේ.

කෙසේ වුව ද චිත්ත හා රූප ධර්මයන් ගේ පැවැත්මෙහි වෙනසක් ද උගන්වා තිබේ. චිත්ත ධර්මයන්හි ඨිතිය රූප ධර්මයන්හි ඨිතියට වඩා කෙටි වෙයි. වෙනත් විදියකින් කිවහොත් රූපක්ෂණ චිත්තක්ෂණ වලට වඩා දීර්ඝ ය. මෙසේ වන්නේ යම්කිසි රූපයක් අප විසින් ඇසින් දැක තේරුම්ගෙන සියළු මනෝමය ක්‍රියාවලිය හෙවත් ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය නිමවනතුරු ම රූපය පවත්නා නිසා ය. චිත්තය තම ආත්මය සේ සිතන්නවුනට වඩා රූපය ආත්මය සේ සිතන්නන් අනුවණකමින් අඩු බව බුදුරදුන් දක්වූයේ එහෙයිනි.

අසංඛතය හෙවත් නිර්වාණය පිළිබඳව වාස්තවිකව එනම් ධන වාචී පදවලින් විවරණය කරන්නේ ඉතා අඩුවෙනි. අසංඛත යන්න අජාත, අනුප්පන්න වැනි පදවලින් ද හැඳින්වේ. වාස්තවික පදවලින් විවරණය කළයුතු අවස්ථාවන්හිදී ශාන්ත,



Free Distribution www.thiryak.org

සුඛ, ප්‍රණීත වැනි වචන ඒ සඳහා යෙදේ. අපගේ භාෂාව සීමිතව ඇත්තේ අපගේ අත්දැකීම් ප්‍රකාශ කිරීම පිණිස ගොඩනගා ගත් සංකල්ප හැඟවීම පිණිස පමණක් හෙයින් අසංස්කෘතය විස්තර කිරීම පිණිස අවශ්‍ය සංකල්ප හා වචන අප තුළ නොමැත. නිවන අනිර්වචනීය හා අනභිලාප්‍ය දෙයක් යැයි පවසන්නේ එහෙයිනි. නිවණ පිළිබඳව අපට සිතාගත හැක්කේ සසර ඇති සියළු දුකින් මිදීම හා සියළු කෙලෙසුන්ගෙන් මිදීම වශයෙනි. එය වූපසම සුඛයක් සේ හඳුන්වන්නේ ද එහෙයිනි. නිවණ පිළිබඳ අත්දැකීම හුදෙක් නිර්වාණ සාක්ෂාත්කරණයෙන් ම මිස ඒ පිළිබඳව වාද විවාද තර්ක විතර්ක කිරීමෙන් ලද නොහැක.*

---

* නිර්වාණය පිළිබඳව දීර්ඝ විස්තරයක් සඳහා ධර්මාචාර්ය විභාගයට නියමිත ''ථෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්'' පොත බලන්න.


Free Distribution www.thiryak.org

5 වන පරිච්ඡේදය

# සතර පරමාර්ථ පිළිබඳ ලක්ෂණ කථනය

අභිධර්මයෙහි ලෝකය හා සත්වයා පිළිබඳව කෙරෙන විග්‍රහ එකම ආකෘතියක් නො ගනියි. අභිධර්ම ග්‍රන්ථවල මෙම විෂය දෙස විවිධ දෘෂ්ටිකෝණවලින් කෙරෙන විග්‍රහ හමුවෙයි. කුසල – අකුසල වශයෙන්, ස්කන්ධ වශයෙන් ආයතන වශයෙන් ධාතු වශයෙන් වැනි විවිධ විභජන ක්‍රමවලින් මෙම විග්‍රහ කර ඇත. කවර ආකාරයෙන් විග්‍රහ කළ ද අභිධර්මයෙහි විෂය චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ යන මූලික කරුණු හතරින් පරිමිත කරගත හැකි හෙයින් අභිධර්මය පිළිබඳව කරනු ලබන අධ්‍යයන මෙ සතර පරමාර්ථය වටා ගොනු කර ගැනීම පහසු වෙයි. අභිධර්මයෙහි යථාර්ථය හැඟවීම පිණිස පොදුවේ 'ධම්ම' යන පදය යෙදෙයි. එම ධම්ම යන සංකල්පය සංඛත ධම්ම හා අසංඛත ධම්ම වශයෙන් දෙ වැදෑරුම් ය. චිත්ත, චෛතසික හා රූප සංඛත ධර්ම වශයෙන් ද නිර්වාණය අසංඛත ධර්ම වශයෙන් ද හඳුන්වනු ලැබේ.

අභිධර්මයේ දී ධර්ම වශයෙන් ලෝකය විශ්ලේෂණය කර දක්වන්නේ ධර්ම එකිනෙකට අසම්බන්ධ තනි තනි ඒකක වශයෙන් පවතින නිසා නොවේ. එසේ දැක්වීම බහුත්ව වාදයකි. බුදුදහම බහුත්ව වාදය (සබ්බං පුථුත්තං) ප්‍රතික්ෂේප කරයි. සියළු සංස්කෘත ධර්ම එකිනෙකට පටිච්ච සමුප්පාද ක්‍රමයට සාපේක්ෂක වශයෙන් බැඳී පවතියි. විග්‍රහ නය මෙන්ම සංග්‍රහ නය ද දක්වමින් සියළු ධර්ම සංශ්ලේෂණ වශයෙන් මෙන්ම විශ්ලේෂණ වශයෙන් ද දක්වන්නේ එහෙයිනි. එහෙත් ඒ ධර්ම ඒකත්වයක් (සබ්බං ඒකත්තං) යන වැරදි නිගමනය ද අභිධර්මයෙන් නො කියැවේ. නාම රූප ධර්ම නිතරම එකිනෙකට සම්බන්ධව අන්‍යෝන්‍ය බලපෑම් ඇතිව ක්‍රියාත්මක වෙයි. ඒවා වෙන වෙන ම දක්වන්නේ නිර්වචනය හා විවරණය සඳහා පමණි. ධර්ම වනාහී සමූහ වශයෙන් ඉපිද ප්‍රවර්තනය වන සංඝටකයෝ වෙති. නාම ධර්ම මෙන් ම රූප ධර්ම මෙසේ සාමූහිකව ඉපදීම එක ධර්මයක තනිව ඉපිදීම ප්‍රතික්ෂේප කිරීම තුළින් තහවුරු කර ඇත. චිත්තයක් උපදින විට අවම වශයෙන් ඵස්ස, වේදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්ද්‍රිය (අරූපී) හා මනසිකාර යන සබ්බ චිත්ත සාධාරණ චෛතසිකයෝ ද උපදිති. චිත්තය හා අනිවාර්ය චෛතසික හත අතර ඇත්තේ සහජාත සම්බන්ධයකි. චිත්තය මෙසේ ධර්ම පද්ධතියක් වන අතර රූප සම්බන්ධයෙන් ද මෙසේ ම පැවසිය හැක. රූප ධර්මවල කුඩා ම ඒකකය සුද්ධාට්ඨකය නම් වේ. එහි පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහා භූත හතර ද, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන ද්විතීයික රූප හතර ද කලාප වශයෙන් එක්ව පවතියි. එහෙයින් එය ද නියත සහජාත (අනිවාර්යයෙන් ම එකට උපදින) ධර්ම වන අතර පෙදෙස නො අවිනිබ්භෝග (ස්ථාන වශයෙන් වෙන් කර නැබිය නොහැකි) ද වෙයි. මේ අනුව අප



Free Distribution www.thiryak.org

වටහා ගත යුත්තේ පරමාර්ථ ධර්ම යනු ප්‍රතීත්‍ය සමුත්පාදයෙන් බැහැර වූ නිරපෙක්ෂක වූ කේවල ධර්ම නොවන බව ය. ඒවා තවදුරටත් සියුම් ලෙස බෙදිය නොහැකි බව් පමණක් තේරුම් ගැනීම ප්‍රමාණවත් ය.

මේ ක්‍රමයට සංඛත ධර්මයන්, චිත්ත, චෛතසික හා රූප වශයෙන් බෙද දක්වන අභිධර්මය නිර්වාණය, ලෝකෝත්තර පරමාර්ථ ධර්මය වශයෙන් දක්වයි. නිර්වාණය පූර්වෝක්ත සංඛත ධර්ම හා එක්ව සතර පරමාර්ථ ලෙස ව්‍යවහාර කරනු ලැබුව ද එය චිත්ත, චෛතසික හා රූප වලින් සහමුලින් ම වෙනස් බව මෙහි දී අවධාරණය කළයුතුව පවතියි. චිත්ත, චෛතසික හා රූප ධර්මයෝ පරමාර්ථ වශයෙන් හඳුන්වනු ලැබුව ද නො වෙනස්ව පවත්නා නිත්‍ය පදර්ථයෝ නො වෙති. ඔවුන් ගේ පැවැත්ම අනිත්‍ය ය. එහෙත් නිර්වාණය පරමාර්ථ සත්‍යය වශයෙන් වචනයෙන් විස්තර කළ නොහැකි බව පිළිගත් කරුණකි. එය අනිර්වචනීය ය.

**චිත්ත**

අභිධර්මයේ දී යමක් පැහැදිලි කිරීම සඳහා ක්‍රම තුනක් භාවිත වෙයි. එනම් (1) කාරකයකු හෙවත් කරන්නකු පිළිබඳ අදහස මුල් කරගෙන කර්තෘත්ව සමාරෝපණයෙන් කරනු ලබන කර්තෘ සාධනය, (2) උපකරණ අර්ථය මුල් කරගෙන කරනු ලබන කරණ සාධනය හා (3) ක්‍රියා සන්තතිය සිදුවන බව මුල් කරගෙන වියුක්ත ස්වරූපයෙන් කරුණු දක්වන භාව සාධනය වශයෙනි. චිත්ත චෛතසිකාදිය පිළිබඳව කරුණු දක්වන විට මේ ක්‍රම උපයෝගී කරගෙන තිබේ. ආරම්මණං චින්තෙතීති චිත්තං (අරමුණ සිතන හෙයින් සිත ය) යි පැවසූ විට කර්තෘ සාධනය ද චින්තෙති එතෙන (මෙය කරණකොට ගෙන සිතයි) පවැසූ විට කරණ සාධනය ද චින්තන මත්තං එව චිත්තං (සිතීම් මාත්‍රය ම සිත ය) හෝ පස්ස විජානනං චිත්තං යි පැවසූ විට භාව සාධනය ද ප්‍රකට වෙයි.

"ආරම්මණ විජානන ලක්ඛණං චිත්තං" යන විග්‍රහයට අනුව අරමුණු විජානනය කරන බැවින් හෙවත් දැනගන්න ලක්ෂණය ඇති බැවින් සිත යයි නම් කෙරෙයි. ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රිය පස හා මනෝද්වාරය නිසාත් ඇතිවන විවිධාකාර ඒ සියලු දැනීම සිත් ය. සාමාන්‍ය ව්‍යවහාරයෙහි දැකීම, පෙනීම, ඇසීම යනුවෙන් සඳහන් කරන්නේ ද සිත්ම ය. ඇසෙහි රූපයක් ගැටුණු විට ඒ පිළිබඳ දැනුමක් හෙවත් සිතක් පහළ වේ. එහෙත් එහිදී දැනීම යන වචනය ව්‍යවහාර නොකොට දැකීමය, පෙනීමය, යන වචන භාවිත කරයි. කනෙහි ශබ්දයක් ගැටුණුවිට ඒ හඬ දැන ගැනීමේ සිතක් පහළ වේ. එය අපි ඇසීම යනුවෙන් ව්‍යවහාර කරන්නෙමු. මේ අන්දමට ඉන්ද්‍රියන් හා අරමුණ ගැටුණු විට දැනුනාය, පෙනුනාය, ඇසුනාය, කල්පනා වුනාය, හැඟුනාය, තේරුණාය ආදී විවිධ වචන අපි භාවිත කරන්නෙමු. ඒ සියල්ලෙන්ම ප්‍රකාශ වන්නේ සිතම ය.

බෙරයකට ගසන විට ඒ එක් එක් පහරකට අනුව වෙන වෙනම බෙරහඬ ඇතිවන්නාක් මෙන් ඇස ආදි ඉඳුරන් හි රූපාදී අරමුණු ගැටුණ කල්හි ඒවා සම්බන්ධයෙන් වෙන වෙනම සිත් ඇතිවේ. ඒ අනුව අරමුණක් නැතිව සිත් ඇති නොවන බව ද තේරුම් ගතයුතුය.



Free Distribution www.thiryak.org

අරමුණු දැන ගැනීම ලක්ෂණ කොට ඇති මේ සිත යම් ක්‍රියාවක් හෙවත් බෙදයක් ලෙස ද හැඳින්විය හැකිය. එමෙන්ම බෙරයකින් නිකුත්වන හඬ සැණෙකින් නැතිව යන්නාක් මෙන් මේ සිත් නම් වූ ක්‍රියාවත් ද, වේගයත් ද සැණෙකින් ම නිරුද්ධ වේ. නැති වී යයි. යම් සිතක් පහළවීමට ගත වූ කාලය ම එහි පැවැත්මටත් නැතිවී යාමටත් ගතවේ. එය සිතේ සවභාවයයි. ඒ අනුව සිතකට ඇත්තේ ඉතා කෙටි ආයු කාලයකි. සිතක් ඇතිව පැවති, නැති වී යන කාලය ''චිත්තක්ෂණය'' යනුවෙන් හඳුන්වන්නේ එහි ඇති ක්ෂණික බව නිසා ය. සන්තානයක එකවර සිත් දෙකක් නූපදින අතර දෙවන සිතක් උපදින්නේ කලින් උපන් සිත සම්පූර්ණයෙන් නැතිව ගිය විට ය. සිතක් ඇතිව නැතිව යන කාලය ඇසිපිය හෙලන කාලයෙන් කෝටි ලක්ෂ ගණනකින් කොටසක් තරමට අල්පය.

එක් සිතක් ඉපිද නැතිවනවාත් සමඟම ඒ ක්ෂණයෙහි ම අලුත් සිතක් පහළ වීම ද සිතේ තවත් ලක්ෂණයකි. නිරොධ සමාපත්ති අවස්ථාව හා අසංඥ භූමියේ ඉපිද සිටින අවස්ථාවක් හැරුණුවිට චිත්ත පරම්පරාවේ සිත් නූපදින අවස්ථාවක් නැත.

විචිත්‍ර බව ද සිතේ පවත්නා තවත් ලක්ෂණයකි. සාමාන්‍ය ඉන්ද්‍රියානුබද්ධ ලෝකය විචිත්‍ර ය. එසේ ලෝකය විසිතුරු වී ඇත්තේ අප්‍රමාණ වූ සත්ව පුද්ගල, වස්තු ද්‍රව්‍ය ආදියෙන් යුක්තවන නිසා ය. සිතද මේ විචිත්‍රවූ, ලෝකය හා බැඳී විචිත්‍රව පවතී. ලොව ඇති එක් අරමුණක් ගැනම වුවද සිත එකිනෙකට වෙනස් ලෙසින් පහළ වේ. එමෙන්ම ඒ ඒ අරමුණු කෙරෙහි එක් එක් පුද්ගලයා තුළ පහළවන සිත් ද විවිධ ය. එබැවින් ලොව පවත්නා විසිතුරු බවට ද වඩා අප්‍රමාණ ගුණයකින් සිත විචිත්‍ර බව කිව හැකිය.

චිත්තය චෛතසික හා බැඳී පවතින්නකි. මේ දෙක්හි පවත්නා වෙන්කළ නොහැකි සබඳතාව අභිධර්මයෙහි මෙසේ දක්වෙයි.

(i) චිත්ත චෛතසික එක්ව උපදී (එකුප්පාද)
(ii) චිත්ත චෛතසික එක්ව නිරුද්ධ වේ (ඒක නිරොධා)
(iii) චිත්ත චෛතසික එක අරමුණක එල්බ පවතී (ඒකාලම්භන)
(iv) එක් වස්තුවකම එක් තැන්හිම පවතී. (ඒක වත්තුක)

අභිධර්මයට අනුව චිත්තය ක්‍රියාත්මක අවස්ථා වශයෙන් පුළුල් ක්ෂෙත්‍ර හතරකට බෙදා දක්වා තිබේ.

(i) කාමාවචර සිත් (කාම ලෝකවල වැඩි වශයෙන් හටගන්නා සිත්)
(ii) රූපාවචර (රූප බ්‍රහ්ම ලෝකවල වැඩි වශයෙන් පහළවන සිත්)
(iii) අරූපාවචර (අරූප ලෝකවල වැඩි වශයෙන් හටගන්නා සිත්)
(iv) ලෝකෝත්තර (පංචස්කන්ධ සංඛ්‍යාත ලෝකය ඉක්මවා පවත්නා මාර්ග හා ඵල සිත්, නිර්වාණය අරමුණු කරගත් සිත්)

මේ අතුරෙන් කාම රූප, අරූප යන භවත්‍රයට අයත් චිත්තය, ත්‍රෛභූමික සිත් ලෙස හැඳින්වෙයි. සොවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත්, සතර මග සතර ඵල හා සම්බන්ධ සිත් ද චතුර්භූමික සිත් ගණයට ඇතුළත් වෙයි. මෙසේ සිත භූමි වශයෙන්



Free Distribution www.thiryak.org

සිව් වැදෑරුම් කොට දක්වෙන අතර, එම සිත්වල පවත්නා සදවාරාත්මක තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කෙරෙන ප්‍රභේදයක් ද ඇත. ඒ අනුව සිත අරමුණ ගැනීම් වශයෙන් එක් ආකාරය, අහේතුක සහේතුක වශයෙන් දෙආකාරය, කුසල අකුසල අව්‍යාකෘත වශයෙන් තුන් ආකාරය, කුසල, අකුසල, විපාක, ක්‍රියා වශයෙන් සිව් ආකාරය.

**චෛතසික**

අරමුණු දැන ගැනීම සිත හැටියට අපි හඳුනා ගත්තෙමු. එසේ අරමුණු දැන ගැනීමේ ක්‍රියාව හා සම්බන්ධව පවත්නා අප්‍රධාන ක්‍රියා චෛතසික ලෙස හැඳින් වේ. එවැනි චෛතසික පනස් දෙකකි.

ඉතිරි චෛතසික හතළිස්පහ වර්ග කරනු ලබන්නේ මෙසේය :

(1) විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද යන ප්‍රකීර්ණක චෛතසික හය කලින් සඳහන් කළ සබ්බ චිත්ත සාධාරණ චෛතසික හත සහ මෙම ප්‍රකීර්ණක චෛතසික හය එක්ව ගත්විට අන්‍යසමාන නමින් හැඳින්වේ. මේවාට අන්‍යසමාන යයි නම් කරනු ලබන්නේ ඔවුනොවුන්ට ප්‍රතිවිරුද්ධවූ ද සෝභන සහ අකුසල චෛතසික දෙවර්ගය සමගම මෙම චෛතසික යෙදෙන නිසාය.

(2) ඉතිරි චෛතසික තිස් නමයෙන් දහතරක් අකුසල චෛතසික ලෙස හැඳින් වේ. එනම්, මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, ලෝභ, දිට්ඨි, මාන, දෙස, ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච, ථිනමිද්ධ, විචිකිච්ඡා යනුයි. මේවා අකුසල් සිත් දෙළහේ පමණක් යෙදෙන බැවින් අකුසල් චෛතසික නමින් හැඳින්වෙයි.

(3) ඉතිරි චෛතසික විසිපහ සෝභන රාශිය නම් වේ. එනම්, සද්ධා, සති, හිරිය, ඔත්තප්ප, අලෝභ, අදෙස, තත්‍රමජ්ඣත්තතා, කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි, කායලහුතා, චිත්තලහුතා, කාය මුදුතා, චිත්ත මුදුතා, කාය පාගුඤ්ඤතා, චිත්ත පාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, කරුණා, මුදිතා, ප්‍රඥ

මෙයින් මුල් දහනමය සෝභන සාධාරණ චෛතසික නම්, ඒවාට ඒ නම යෙදෙන්නේ සියලුම සෝභන සිත්වල යෙදෙන බැවිනි. සෝභන සිත් නම් අකුසල් දෙළහ සහ අහේතුක දහ අට යන සිත් තිස හැර ඉතිරි සිත් ය. ඉතිරි හය සෝභන අසාධාරණ චෛතසිකයෝ වෙති.ඒ හයෙන් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන විරති නමින් හැඳින්වේ. මේවා විරති නමින් හැඳින්වෙන්නේ කයින්, වචනයෙන් කෙරෙන අකුසලයන්ගෙන් වෙන් කිරීමක් සිදුවන නිසායි. කරුණා, මුදිතා යන දෙක අප්පමඤ්ඤ නමින් හැඳින්වේ. ඒවාට අප්පමඤ්ඤ යයි නම් කරන්නේ අප්‍රමාණ සත්වයන් අරමුණු කොට පහළවන බැවිනි. අවසානයට ඉතිරිවන්නේ ප්‍රඥ චෛතසිකය යි. සිතින් දැනගන්නවාට වඩා හොඳින්, වඩා පිරිසිදු ලෙස නිවැරදිව අරමුණු ගන්නා ස්වභාවය ප්‍රඥ චෛතසිකයායි.



Free Distribution www.thiryak.org

## රූප

සියළු භෞතික පදාර්ථ රූප වශයෙන් දක්වෙයි. රුප්පනය හෙවත් සිඳෙන, බිඳෙන සුළු බව රූපයේ ලක්ෂණ වෙයි. පඨවි, ආපෝ, තෙජෝ සහ වායෝ යන මහා භූත හතර හා වර්ණ, ගන්ධ, රස, ඕජා යන උපාදාය රූප, රූප වශයෙන් හැඳින්වෙයි. මෙම අට සුද්ධටඨක නම් වේ. මෘත පදාර්ථවල මෙම අට ඇති අතර ජීව පදාර්ථවල ' ජීවිත ' ද පවත්නා හෙයින් එය ජීවිත නවක කලාප ලෙස හැඳින් වේ. මෙය සත්වයන් සම්බන්ධයෙන් ගත්තා විට තවත් සවිස්තරව රූප 28ක් සේ දක්වෙයි.

## රූප පරමාර්ථය

රූප යන්න විවිධ අර්ථයන්හි යෙදෙයි. එහෙත් බහුල වශයෙන් රූපය ශරීරය යන අර්ථයෙන් යෙදෙයි. දිග, කොට, හත රැස්, වටකුරු ආදි සටහන් ඇති, කුඩා, මහත් ආදි ප්‍රමාණ ඇති එමෙන්ම යම් වර්ණයක් ඇති, සත්වයෙක් හෝ එසේ නොවන සියල්ලම රූප යයි හැඳින්වෙයි. වෙනත් ලෙසකින් දක්වතොත් රූපය යන්න ශරීරය යන්නට සමානව යෙදෙන පදයකි.

පරමාර්ථ ධර්ම නාම රූප වශයෙන් බෙදෙයි. එහි එන චිත්ත චෛතසික නිබ්බාන යන තුන් පරමාර්ථ ධර්මයන්හි කිසිදු සටහනක් දක්විය හැකි හැඩයක් වර්ණයක් වශයෙන් දක්විය නොහැකි බැවින් නාම පමණක් නිසා ඒ අනුව තේරුම් ගතයුතු බැවින් නාම යයි හැඳින්වෙයි. ලක්ෂණ කීපයක් එක්තැන් වී ශරීරයක් වශයෙන් රූපයක් වශයෙන් දැකිය හැකි කොටස රූප වශයෙන් දක්වෙයි.

රුප්පනය වන බැවින් රූප නම් වේ. (රුප්පතීති බෝ භික්ඛවේ තස්මා රූපන්ති වුච්චති) යනුවෙන් ද රූපය යන්න ධර්මයෙහි නිර්වචනය කොට ඇත. අර්ථ දක්වා ඇත, ශීත, උෂ්ණ ආදියෙන් වෙනස් වීමට විනාශයට පත්වීම මෙහි ' රුප්පනය ' යන්නෙන් අරථවත් වෙයි.

වෙනස්වන ලක්ෂණයෙන් සියලුම රූප එකසමාන නමුත් මහා භූත රූප උපාදාය රූප යනුවෙන් රූප දෙවර්ගයකට බෙදා දක්වෙයි. රූපයක් උපදවන, හට ගන්වන යන අර්ථයෙන් භූත රූප යන නම යෙදෙයි. රූපයක් නිසා පවත්නා රූප උපාදාය රූප නම් වෙයි.

පඨවි, ආපො, තෙජෝ, වායෝ යනු භූත රූප සතරයි. අධික තද ගතියෙන් යුත් ගල්, ඇට, මස් ආදිය පඨවි ධාතුවයි. වැගිරෙන සවභාවය ඇලෙන සවභාවය ඇති වතුර, ලේ, සෙම, ආදිය ආපෝ ධාතුවයි. උෂ්ණුම ගුණයෙන් යුතු ගිත්ත තේජෙ ධාතුවයි. සැලෙන ගතියෙන් යුත් සුළඟ වායෝ ධාතුවයි. අභිධර්ම විග්‍රහයට අනුව මේ ධාතු වෙන් වෙන් වශයෙන් පවත්නා දේ නොව, පස්, දිය, ගිනි, සුළං යන සියල්ලෙහිම ධාතු සතරම පවතියි.

## පඨවි ධාතු

කර්කශ බව පඨවි ධාතුවෙහි ලක්ෂණය හැටියට දක්වෙයි. (කක්ඛලත්තා ලක්ඛණා පඨවි ධාතු) එසේ පඨවි ධාතුව කර්කශ ලෙස ද තද ගතියෙන් යුක්ත ලෙස ද දැනෙන්නේ රූප කලාප ඝනව පිහිටීම නිසා ය. රූප කලාප ඝණව නො පිහිටි, වායුව



Free Distribution www.thiryak.org

අධිකව ඇති වස්තූන්හි කර්කශබව මෘදු වූවක් සේ දැනෙයි. කලු ගලක් හා ළදරු සිරුරක් ආදී තිදසුන් කොට බැලීමෙන් එය තේරුම් ගතහැකි ය. මේ අනුව රූප කලාපවල පිහිටීම අනුව තද බව හෝ මොලොක්, මෘදුබව පවතින තමුත් තද බව හා මෘදු, මොලොක් බව යන දෙකම පඨවි ධාතුවයි. රූප කලාප ඝනව පිහිටා ඇති ගලෙහි හෝ යම්කිසි ලෝහ වර්ගයක් බරට දැනෙයි. වායුව හෙවත් ආකාශ, ආකාශ බහුලව පවත්නා පුළුන් පිඩෙහි සැහැල්ලු බවක් දැනෙයි. ඒ අනුව බර බව හා සැහැල්ලු බව ද පඨවි ධාතුවම ය.

### ආපෝ ධාතුව

කර්කශ ස්වභාවයයි දැකපු පඨවි ධාතුවට විසිර යා නොදී ඒකරාශී කොට, පිඩු කොට පවත්වා ගන්නා වූ ස්වභාවය ආපෝ ධාතුවයි. වැගිරෙන බව, ඇලෙන බව, පැතිරෙන බව ඇත්තේ ආපෝ ධාතුවයි. ඕනෑම රූපයක ආපෝ ධාතුව ඇතුළත පිටත දෙක්හිම පැතිර පවතියි. තමා හා ගැටී ඇති දෙය තමා වෙත ඇද ගැනීම, උරාගැනීම තමාගෙන් ඉවත් වන්නට නොදී අල්ලා ගැනීම ආපෝ ධාතුවේ ස්වභාවයයි. ලෝකයේ ඇති වස්තූන් ධූලි මෙන් බැඳී ඝන වී පවතින්නේ ආපෝ ධාතුවේ බලයෙනි. පඨවි ධාතුව අධිකව ආපෝ ධාතුව අඩුවෙන් පවතින වස්තු ඝනව කැටිව පවතියි. සත්ව ශරීරවල ඇති ඇට, නහර, මස් ආදියෙන්, පස්, ගල්, යකඩ, දැව ආදියෙහි ආපෝ ධාතුව මදය. පඨවි ධාතුව වැඩිය. තෙල්, වතුර ආදිය දියාරු වැගිරෙන ගතියෙන් යුක්ත වන්නේ පඨවි ධාතුව අඩුවෙන් ද ආපෝ ධාතුව බහුලව ද ඇති බැවිනි.

### තේජෝ ධාතුව

උණුසුම් බව හා සිසිල් බව තේජෝ ධාතුවය. පඨවි, ආපෝ, වායෝ යන අනෙක් ධාතූන් පාලනය කරන බලවත් ස්වභාවයක් මෙහි ඇත. මෙමගින් පඨවි ධාතුවෙහි තදබව අඩු කරයි. ආපෝ ධාතුවෙහි වැගිරෙන ස්වභාවය ද අඩු වැඩි කරයි. නිදසුනක් වශයෙන් ගතහොත් මැටියෙන් තැනූ බඳුනක් පිළිස්සීමෙන් තද බව වැඩි කරයි. එහිදී පඨවි ධාතුවේ තදබව වැඩි කිරීමකි. ඉටි වර්ග මොලොක් වන්නේ තේජෝ ධාතුවෙන් පඨවි ධාතුවෙහි තද ගතිය අඩු කිරීමෙනි. පැණි හුණු කළවිට කැටි වන්නේ තේජෝ ධාතුවෙන් ආපො ධාතු බලය හීන කිරීමෙනි. ඉටි දියවන්නේ ආපෝ ධාතු බලය වැඩිවීමෙනි. ජලය උණු කරන විට දුම් නගින්නේ තේජෝ ධාතුවෙන් වාතය වැඩි කිරීමෙනි.

මදකුත් පෙර පසු නොවී සිත හා එකටම ඉපදීමත්, සිත නැතිවනවාත් සමගම නිරුද්ධවීමත් සිතින් ගන්නා අරමුණ ම ගැනීමත් සිත හටගන්නා තැනම හටගැනීමත් යන කරුණු සතර චෛතසිකයන්ගේ සාමාන්‍ය ලක්ෂණයි. "එකුප්පාද නිරොධාච, ඒකාලම්භන වත්ථුකා" යනුවෙන් අභිධර්මාර්ථ සංග්‍රහයෙහි මේ ලක්ෂණ හතර දක්වා ඇත.

කිසිවිටකත් සිතෙන් වෙන්ව චෛතසික ඇති නොවේ. සිතක් (අරමුණු දැන ගැනීමක්) නැතිව ඉපදීමට ශක්තියක් චෛතසික වලට නැත. එමෙන්ම චෛතසිකයන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙන්ව සිතකට ද පහළ විය නොහැකි ය.



Free Distribution www.thiryak.org

එම චෛතසික සියල්ලම එක සිතක් (අරමුණු දැන ගැනීමේ ක්‍රියාවක්) හා නිශ්‍රයව උපදින්නේ නැත. එක් එක් සිතක් සමග පහළවන්නේ ඒ ඒ සිතට සිත හා චෛතසික අතර පවත්නා සමීප සම්බන්ධය උපමාවකින් දක්වතහොත් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යන ගමනක් නිදසුන් කරගත හැකිය. එම ගමන සිත හා සමානය. මෙම ගමන තවත් ක්‍රියාවන් දෙකකින් තොරව කිසිසේත් සිදු කළ නොහැකිය. එම ක්‍රියා දෙකනම් තමන් දැනට සිටින ස්ථානයෙන් ඈත්වීම සහ යන්නට අරමුණු කරන ස්ථානයට ලංවීමයි. ගමන ආරම්භ කරන විට ම මෙම ක්‍රියා දෙකද සිදුවේ. ගමන චිත්තයට සමාන නම් දෙවනුව දැක්වූ ක්‍රියා දෙක චෛතසික හා සමානය.

පංචස්කන්ධ විග්‍රහයේදී ද විඤ්ඤාණ ස්කන්ධයට අයත් චිත්තය, වේදනා සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ සමඟ එකට ක්‍රියාත්මකවන බව ද දැක්වේ.

චිත්තය සමඟ චෛතසික අනිවාර්යයෙන් ම යෙදෙන බව දැන් අපට පැහැදිලිය. චෛතසික පනස් දෙකෙන් ඔනෑම සිතක් සමඟ අනිවාර්යයෙන් ම යෙදෙන චෛතසික සංඛ්‍යාවක් තිබේ. ඒවා හඳුන්වන්නේ සබ්බ චිත්ත සාධාරණ චෛතසික නමිනි. සිතක යෙදෙන මෙම අවම චෛතසික නම් ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා සහ ජීවිතින්ද්‍රිය (අරූපී) සහ මනසිකාර යන හතයි.

සෑම රූප කලාපයකම තේජෝ ධාතුව ඇත. තේජෝ ධාතුව මඟින් අලුත් රූප කලාප ඇති කොට එම වස්තූන් හෝ සත්වයින්ගේ ශරීර විශාල කිරීමත්, ශක්තිමත් කිරීමත් සිදුවන අතර වස්තුවේ පැහැය, ශක්තිය අඩු කිරීම ද සිදුවෙයි. කුඩා දරුවකු ක්‍රමයෙන් වැඩෙන්නේ ද නැවත මහලුබවට පත් වන්නේ ද මරණයට පත් වන්නේ ද තේජෝ ධාතු මඟින් රූප කලාප පරම්පරාව මෙහෙයවීම නිසා ය.

**වායෝ ධාතුව**

පිම්බෙන, පුම්බවන, තෙරපන සවභාවය වායෝ ධාතුවය. කර්කශ සවභාවය වූ පඨවි ධාතුව හා බැඳී සිට එයට විසිරී යන්නට නොදී එය ඇද, බැඳගෙන තබාගැනීම ආපෝ ධාතුවෙන් කෙරෙන අතර, වායෝ ධාතුවෙන් එය පුම්බවනු ලැබේ. නිදසුනක් හැටියට පුළුන් පිම්බී තිබීම වායෝ ධාතුවෙන් කෙරෙන්නකි. යම් වස්තුවක් ආකර්ශන වේගය ඇති දෙසට ඇදෙන එය තල්ලු කෙරෙන්නේ වායො ධාතුවෙනි. එබැවිනි තල්ලු කරන සවභාවය වායෝ ධාතුව ලෙස දක්වන්නේ.

යම් වස්තුවක සෙලවීමක් වෙතොත් වනුයේ වායෝ ධාතුව නිසාය. ඇතැම් දෙයක වායෝ ධාතුව අධිකය. එය සැහැල්ලුය. ඒ නිසාම සෙලවෙන සුළුය.

පොදුවේ ගත්විට මේ ධාතු සතරෙන් එකකටවත් අනික් ධාතු තුනෙන් වෙන්ව පැවතිය නොහැකිය. හැම ධාතුවකම මේ සතර මිශ්‍රව පවතී. මේ අනුව යම් තැනක එක් ධාතුවක් වේ නම් ඉතිරි ධාතු තුනද පවතී. ඒවායින් එකකට අනෙක් තුන නිශ්‍රය වේ. දෙකකට ඉතිරි දෙක නිශ්‍රය වේ. මෙම ධාතු ද්‍රව්‍ය නොවන අතර ශක්තීන් ලෙස ද බලවේගයන් ලෙසද හැඳින්විය හැකිය.


Free Distribution www.thiryak.org

භූතරූප ද්‍රව්‍යත් නොවන අතර ඒ සතර අන්‍යොන්‍ය ග්‍රාහකව පවතියි. එහි ප්‍රතිඵලය වශයෙන් ද්‍රව්‍යයෙහි කුඩාම සංඝටක පහළ වෙයි. පරමාණුව ඉතාම කුඩා දෙයකි. එයද සෑදී තිබෙන්නේ රූප කලාප ගණනාවක් එක්වීමෙනි. රූප කලාපයන්ගේ සියුම් බව, කුඩා බව වඩාත්ම තේරුම් ගතහැකි වෙයි.

### උපාදාය රූප

කලින් සඳහන් කළ මහා භූත රූප සතර ඇසුරු කොටගෙන පවත්නා බැවින් උපාදාය රූප යනුවෙන් හැඳින්වෙන අප්‍රධාන රූප විසිහතරක් ගැන සඳහන් වෙයි .

(1) චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය (ප්‍රසාද රූප 5)

(2) රූප, ශබ්ද, ගන්ධ, රස(ස්පර්ශ) (විෂය රූප 4)

(3) ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය (භාව රූප 2)

(4) හදයවත්ථු

(5) ජීවිතින්ද්‍රිය

(6) ආහාර රූපය

(7) ආකාශ ධාතුව

(8) කාය විඥප්ති, වචී ඥප්ති (විඥප්තිරූප 2)

(9) ලහුතා, මුදුතා කම්මඤ්ඤතා (විකාර රූප 3)

(10) උපචය - සන්තති, ජරතා, අනිච්චතා (ලක්ඛණ රූප 4)

### නිර්වාණය

පරමාර්ථ ධර්ම අතරට ගැනෙන නිර්වාණය අනෙක් පරමාර්ථයනට වඩා වෙනස් ය. එය ලෝකෝත්තර සිතට පමණක් අරමුණු වන්නකි. රාගාදී කෙලෙස්වලින් හා ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී දුක්වලින් තොර වූ ශාන්ත සුඛ ස්වභාවයක් වන නිවන බුදුදහමේ ඉගැන්වෙන පරම නිෂ්ඨාවයි.

අලෞකික අනුභූතියක් වන නිර්වාණය සැබැවින්ම ලෞකික වූ ව්‍යවහාර භාෂාවන්ගේ වචනවලින් විස්තර කිරීම දුෂ්කර වූ අනිවචනීය ස්වභාවයකි. ප්‍රඥාව වැඩීමෙන් සතර මාර්ග ඥානයෙන් ම පසක් කළයුතු සුඛ ස්වභාවයකි.

(වැඩි විස්තර සඳහා 'ථෙරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්' ග්‍රන්ථයෙහි 8 වැනි පරිච්ඡේදය (නිර්වාණය) බලන්න.)

6 වන පරිච්ඡේදය

# භෞතික ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය

ථෙරවාදී බුදුදහම සූත්‍ර හා අභිධර්ම පිටක දෙක්හි ම භෞතික ලෝකය පිළිබඳ ව විග්‍රහයක් ඉදිරිපත් කරයි. මෙම විග්‍රහ ඉදිරිපත් කර ඇත්තේ බුද්ධ ශ්‍රාවකයනට ලෝක තත්වය පිළිබඳ අවිපරීත අවබෝධය ලබා ගැනීම සඳහා මාර්ගෝපදේශ වශයෙන් මිස විද්‍යාඥයන් මෙන් හුදු ශාස්ත්‍රීය ඥනයක් ලබා දෙනු පිණිස නො වේ. එහෙයින් ලෝකයෙහි නිර්මාණය, ව්‍යුහය, රසායනික යථාතත්වය බඳු කරුණු දැනගැනීම සඳහා නොව විශ්වව්‍යාපී අනිත්‍යතා ව, දුක්ඛතාව හා අනාත්ම ලක්ෂණය තේරුම් ගැනීම සඳහා ම අභිධම්මය හදාළ යුතු වෙයි. මෙයින් අදහස් කරන්නේ අභිධර්මාගත භෞතික ලෝක විග්‍රහය අශාස්ත්‍රීය හෝ විද්‍යා විරෝධී බවක් නොවේ. අභිධර්මාගත විග්‍රහය වර්තමාන විද්‍යාඥනය අනුව විද්‍යා විරෝධී නොවන නමුත් එබඳු තුලනයක් කිරීම සාධාරණ නොවන්නේ විද්‍යාව තම නිගමන පිළිබඳ අවසානයට තව ම එළැඹී නැති හෙයින් සහ තවමත් නිගමන වෙනස් කරමින් සංශෝධනය කරමින් ගවේෂණ කාර්යයෙහි නිරත ව සිටින හෙයිනි.

භෞතික ලෝකය සත්වයන්ගේ උත්පත්ති ස්ථාන වශයෙන් ගතහොත් කාම හා රූප වශයෙන් ද්විවිධ වෙයි. අරූප ලෝකය අභෞතික හෙයින් එය මෙහිලා නො ගැනේ. කාමලෝකය, නිරය, තිරච්ජාන යෝනි, පේතලොක, අසුර ලෝක, මනුස්ස ලෝක හා සදිව්‍ය ලෝකයෙන් සමන්විත වෙයි. රූප ලෝකයට රූපී බ්‍රහ්ම ලෝක (16) අයත් වෙයි. (අරූප ලෝකයන්හි රූපස්කන්ධය නොමැති හෙයින් එය අභෞතික නාමස්කන්ධ ලෝකය සේ හැඳින්වේ.) මෙම ප්‍රදේශ 'අවචර' වශයෙන් ද හැඳින්වෙයි.

භෞතික රූප පිළිබඳ විග්‍රහය මුළුමනින් ම පාහේ අභිධර්මයෙන් ම දත යුත්තක් දැයි හැඟෙන තරමට ඒ පිළිබඳ තොරතුරු සූත්‍ර පිටකයෙහි විරල ය. සූත්‍ර පිටකයෙහි පඨවි, ආපෝ, තේජෝ, සහ වායෝ යන මහා භූත සතර ගැන නිතර සඳහන් වෙයි. සියළු භෞතික රූප ප්‍රත්‍යය සමුත්පන්න සංස්කෘත ධර්ම බව පෙන්වා දීම අරමුණු කරගත් විග්‍රහයක් වශයෙන් සූත්‍රාගත විවරණය හැඳින්විය හැකිය. සාමාන්‍යයෙන් නාම ධර්ම (චිත්ත – චෛතසික) වලට වැඩි කාලයක් රූප ධර්ම පවත්නා බව සූත්‍ර පිටකයෙහි දැක් වේ. එහෙත් ඒ කවර අනුපාතයකින් දැයි දක්වා නැත. ඒ පිළිබඳ ව විස්තර කරන්නේ අභිධර්මයේ ය. චිත්තක්ෂණ 17 ක් ගෙවී යන තුරුම රූපක්ෂණයක් පවත්නා බව අභිධර්මය දක්වයි. මනුෂ්‍ය ශරීරය හා සිත අන්‍යෝන්‍ය සාපේක්ෂ සම්බන්ධයක් ඇති ව ජීවිතය පවත්වා ගෙන යන අතර බාහිර ලෝකයේ රූප සිතෙන් ස්වාධීන ව හුදු භෞතික පැවැත්මක් ම ඇති ව පවතින බව මිලින්ද ප්‍රශ්නය අනුව පැවසිය හැක.



Free Distribution www.thiryak.org

ථෙරවාදී අභිධර්මයට අනුව රූපධර්ම (හෙවත් භෞතික රූප) සත්විසි වැදෑරුම් හෝ අටවිසි වැදෑරුම් වෙයි. විසි අටක් බවට පත්වන්නේ අටුවාවන්හි දී හදයවත්ථු රූපය ද එයට එකතු කරන හෙයිනි. රූප ධර්ම ප්‍රධාන වශයෙන් ගණ දෙකකට බෙදනු ලැබේ. එනම් මහාභූත හා ඒවායේ උපාදා රූප වශයෙනි. මෙම ප්‍රභේදය සර්ව සංග්‍රාහක හෙයින් සමස්ත භෞතිකය ම (සබ්බං රූපං) මෙයට ඇතුළත් කරනු ලැබේ. මහාභූත රූප නම් පඨවි, ආපො, තේජෝ, වායෝ යන හතරයි. මේවා මූලික හෙවත් ප්‍රාථමික රූපයෝ වෙති. උපාදා රූප නම් ඒ මූලික රූප කෙරෙ යැපෙන හෙවත් ප්‍රාථමික රූපයෝ වෙති. උපාදා රූප නම් ඒ මූලික රූප කෙරේ යැපෙන හෙවත් ඒවායේ බලපෑම ලබා පවතින රූපයෝය. සත්වයාගේ නාම රූපය (සිත - ගත සංයුක්ත පැවැත්ම) නිර්මාණයෙහි ලා එක් වී ඇති භෞතික රූපයට අජ්ඣත්ත රූප යන නම ද සත්ව ශරීරයෙන් පරිබාහිර ව පවත්නා භෞතික රූප බහිද්ධා හෙවත් බාහිර රූපය වශයෙන් ද හැඳින් වේ.

රූප නමින් මෙම භෞතික වස්තු හඳුන්වනු ලබන්නේ කවර හෙයින් ද ? සූත්‍ර පිටකයෙහි රූප නිර්වචන කරන්නේ රුප්පතීති බො භික්ඛවෙ තස්මා රූපංති වුච්චති. කෙන රුප්පති ? සීතෙන පි රුප්පති, උණ්හෙන පි රුප්පති, ජිගච්ඡායපි රුප්පති., පිපාසාය පි රුප්ප ති. ඩංස, මකස වාතතප සිරිංසප සම්ඵ සෙසනපි රුප්පති යනුවෙනි. සීත, උෂ්ණ හා පිපාසා මැසි මදුරු වැනි සාධක මගින් සම්බාධයට, හිරිහැරයට, වෙනසට භාජන වීම ලක්ෂණය කර ගෙන රූප යන නාමය යෙදෙනැ යි ඉන් කියැ වේ. අභිධර්ම සම්ප්‍රදාය ද මෙම අරුත ම දක්වයි. කැළඹෙයි (කුප්පති) පීඩාවට පත් වෙයි. (පීලියති) කැඩී බිඳී යයි (භිජ්ජති) යන අර්ථයෙන් රූප නම් වන බව අභිධර්මයෙහි දක් වේ. රූපයෙහි අනිත්‍ය බව පරිණාමී බව කෙරේ විශේෂ අවධානය යොමු කර නිර්වචන කර ඇත්තේ රූප විග්‍රහය ලෝක තත්වාවබෝධය තුළින් ආගමික අරමුණු සනාථ කර ගැනීම අපේක්ෂා කරන්නක් නිසා ය. කෙසේ වුව ද විශ්වව්‍යාපී අනිත්‍යය හෙවත් ගතිකත්වය සමස්ත භෞතිකයේ ම ලක්ෂණය සේ වර්තමාන විද්‍යාඥයන් වුව ද පිළිගන්නා බව මෙහි දී සටහන් කළ හැකි ය. බෞද්ධ නිර්වචනයේ දී වැඩි වශයෙන් සත්වයන් හා සම්බන්ධ අජ්ඣත්තික රූපය වෙත අවධානය යොමු වූ බව සා - පිපාසා, මැසි - මදුරු උවදුරු ගැන සඳහන් වීමෙන් පෙනේ. එහෙත් මෙහිදී බාහිර රූප ගැන එතරම් උනන්දුවක් නැතැ යි වරදවා තේරුම් නොගත යුතුය. අභිධර්මය බාහිර රූප විෂයෙහි තිසි අවධාරණය දී ඇත. රූප කලාප විසිහත තුළ භෞතික හා අභ්‍යන්තරික සකල රූපය ම ගැනෙයි. විශේෂයෙන් ම මෙය නිෂ්පන්න හා අනිෂ්පන්න රූප පිළිබඳ ප්‍රභේදය තුළින් කැපී පෙනෙයි. මෙහි දී හේතුන්ගෙන් හට ගන්නා කර්මාදී රූප ඇසුරෙන් පවතින රූපවලින් වෙන් කර දක්වෙයි.

සතර මහා භූත පිළිබඳව ආගමික වශයෙන් දුක සත්‍යයට ගැලපෙන නිර්වචනයන් මෙන් ම ඒ පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය ආකල්පයක් ජනිත වන අයුරින් කළ සාකච්ඡා ද අභිධර්ම ග්‍රන්ථවල හමු වෙයි. ඒවා තේරුම් ගැනීම සඳහා සූත්‍ර ග්‍රන්ථවල එම මහා භූත හඳුන්වා දී ඇති ආකාරය තේරුම් ගැනීම ද අර්ථවත් විය හැක. සූත්‍ර ග්‍රන්ථවල පඨවි, ධාතුව හඳුන්වා ඇත්තේ කක්ඛල (තද) ඛරිගත (රළු) වශයෙනි. ආපෝ ධාතුව / වැගිරෙන (ආපොගතං) සේ ද, තේජෝ ධාතුව / දැවෙන හා උණුසුම්



Free Distribution www.thiryak.org

(තෙජොගතං) වශයෙන් ද, වායෝ ධාතුව සුළං සහගත (වායොගත) වශයෙන් ද දක්වා ඇත. අභිධර්මයේදී මෙම රටාව අනුගමනය කරන අතර ම සුළු සුළු වෙනස්කම් වශයෙන් අවධාරණයේ සංස්කරණ දක්නා ලැබේ. නිදසුනක් වශයෙන් කකඛලත්වය හා ඛරිගතත්වය පඨවි ධාතුවේ ලක්ෂණ හා ආකාරය වශයෙන් දැක්වේ. කකඛලත්වය හා ඛරිගතත්වය ම රූප ධාතුව වුව ද නිර්වචනයේ පහසුව පිණිස එසේ කරන බව දක්වා ඇත. මීට වැඩිමනත් වශයෙන් ව්‍යාප්තිය (පත්ථරති) ද පඨවි ධාතුව විස්තර කිරීමට යොදා ගැනේ. අනිත් මහාභූත පඨවි ධාතුව මත ම පිහිටා ඇති බව ද කියැවේ. (පඨවි පතිට්ඨිතා)

ආපෝ ධාතුව අභිධර්මයේ දී හැඳින්වෙන්නේ සිනෙහ (තෙතමනය) හා රූප ධර්මයන්ගේ බන්ධනීය (රූපසස බන්ධනත්තං) වශයෙනි. භෞතික වස්තුවලට තද බව ලැබෙන්නේ ඒවා ආපෝ ධාතුවෙන් බන්ධනීය කරන හෙයිනි. පග්ඝරණ හෙවත් වැගිරෙන බව හා නිස්සන්දභාව හෙවත් ගලා යන බව ද ආපෝ ධාතුවේ තවත් ලක්ෂණ දෙකකි. ආපෝ ධාතුව යනු ජලය නොවන බව මෙහි දී කිව යුතුය. ජලය තුළ සතර මහා භූතයෝ ම වෙති. කිසිම මහාභූත පදර්ථයක් තනි ව භෞතික වස්තුවක් ලෙස නිරූපණය නොවෙයි.

තේජෝ ධාතුව උසමා (උසුමා) හෙවත් උණුසුම් බව ලෙස දැක්වෙයි. සීතල ද තේජෝ ධාතුවේ ම කොටසක් ලෙස දැක්වීම ථෙරවාද අභිධර්මයේ විශේෂතාවකි. වෙනත් අභිධර්ම සම්ප්‍රදායවල එය ආපෝ ධාතුවේ ලක්ෂණයක් ලෙස දැක්වුව ද ථෙරවාදීන් ආපෝ ධාතුව පොට්ඨබ්බායතනයේ විෂය ක්ෂෙත්‍රයට නොගන්නා හෙයින් මෙසේ සීතල තේජෝ ධාතුවට ම ඇතුළත් කරන ලදී. සීතල යනු තේජෝ ධාතුවේ ම මන්දත්වය බව දැක්වෙයි. තේජෝ ධාතුවේ විශේෂ ලක්ෂණය පරිපාචනය සේ දැක්වේ.

වායෝ ධාතුව ථම්භිතත්ථ හෙවත් පිම්බීම හා ජම්භිතත්ථ හෙවත් ගතිකත්ව ලෙස අභිධර්මයේ දී දැක් වේ. එහෙයින් මෙය අනෙක් මහාභූතවලට වඩා වෙනස් කැළඹිලි රූපී ගත්‍යාත්මක චලනශීලී මහාභූතයකි. එහෙයින් අටුවාවල එයට සමුදීරණ යන වහර යෙදේ.

මෙතෙක් අප විස්තර කළේ භූත රූප හෙවත් මහා භූත රූප ගැනය. මෙම සතර මහා භූත සැම වස්තුවක ම සහජාත (එකට හට ගන්න) වශයෙන්, පවතියි. ඒවා සර්ව සූක්ෂම ය. එයින් අදහස් කරන්නේ සතර මහා භූත වනාහී අප්‍රතීත්‍ය සමුත්පන්න දේ බව නොවේ. ඒවා ද සංඛත ධර්ම ය. බුද්ධඝෝෂ හිමියන් විශුද්ධි මාර්ගයේ දී පැහැදිලි කර ඇති පරිදි ඒවා ද විනාශ වී යන හෙයින් අනිත්‍ය ය. (ඛයට්ඨෙන අනිච්චා) භය ඇති කරන හෙයින් දුක් ය. (භයට්ඨෙන දුක්ඛා) අසාර වූ හෙයින් අනිත්‍ය ය. (අසාරට්ඨෙන අනිච්චා)

මෙම මහා භූත හතරට අතිරේක ව ඒවායේ උපාදා රූප හෙවත් ද්විතීයික රූප විසි හතරක් ද අභිධර්මයෙහි උගන්වා තිබේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන හතර භූත රූප වශයෙනුත් අනිකුත් රූප (24) උපාදා හෙවත් ද්විතීයික රූප වශයෙනුත් හැඳින්වීමේ දී ඒ දෙක අතර වෙනස කුමක් දැ යි පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වෙයි.



Free Distribution www.thiryak.org

එම වෙනස පැහැදිලි කර ගැනීමට සූත්‍ර ග්‍රන්ථවලින් හෝ ධම්මසංගණියෙන් නොලැබෙන උපකාරයක් පට්ඨානයෙන් ලද හැක. මහාභූත රූප සතර සහජාත පච්චය හෙවත් එක් ව හට ගැනීම, අත්ථි පච්චය හෙවත් ඉදිරිපත්වීම, අවිගත පච්චය හෙවත් ඉවත නොයෑම, යන ආකාරවලින් උපාදා රූපවලට ප්‍රත්‍යය වෙයි. මෙයින් අපට හැඟී යන්නේ උපාදා රූප හට ගන්නේ මහාභූතවල හට ගැනීම සමඟ ම බව ය. එය අනිවාර්යයෙන් ම එසේ සිදු විය යුත්තකි. මහාභූතයන්ගෙන් තොර ව ඒවාට ඇති විය නො හැක. උපාදා රූපයන්ගේ පහළවීමට මහාභූත රූපවල පහළවීම අත්‍යවශ්‍ය බව කිව හැකි වුව ද මහාභූතවල පහළවීමට හා පැවැත්වීමට උපාදා රූප අත්‍යවශ්‍ය යැයි කියනු නො ලැබේ. අත්ථි හා අවිගත වශයෙන් මහාභූත රූප උපාදා රූපවලට ප්‍රත්‍ය වෙතියි කීමෙන් හැඟෙන්නේ ද උපාදා රූපවල අස්තිත්වය හා අවිගතත්වය මහාභූත රූපවල අස්තිත්වය හා අවිගතත්වය මත ම රඳා පවත්නා බව ය. උපාදා රූප ද්විතීයික රූප ලෙස හඳුන්වන්නේ මේ හේතු නිසා ය.

උපාදා රූප 24ක් අභිධර්ම පිටකයෙහි සඳහන් වෙයි. (මෙයින් 24 වැන්න වූ හදයවත්ථු රූපය එකතු කරන ලද්දේ අටුවා යුගයේ දීය.) ඒවා නම් :

1. පසාද රූප 5 (චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය)
2. ගෝචර රූප 4 (රූප, ශබ්ද, ගන්ධ, රස)
3. ඉන්ද්‍රිය රූප 3 (ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, රූප ජීවිතින්ද්‍රිය)
4. භාව රූප 2 (විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති)
5. විකාර රූප 3 (ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා)
6. ලක්ෂණ රූප 4 (උපචය, සන්තති, ජරතා, අනිච්චතා)
7. පරිච්ඡේද රූප 1 (ආකාස ධාතු)
8. ආහාර රූප 1 (කබලීංකාර ආහාර)
9. හදය වත්ථු රූප 1

මේ විසි හතරෙන් පසාද රූප, ගෝචර රූප, ඉන්ද්‍රියරූප, භාවරූප, ආහාර රූප, හදය වත්ථු රූප යන දහ හතර මහාභූත රූප 4 සමඟ එකතු කොට නිෂ්පන්න රූප 18 වශයෙන් හඳුන්වනු ලැබේ. විඤ්ඤත්ති රූප, විකාර රූප, ලක්ඛණ රූප හා පරිච්ඡේද රූප යන දහය වෙන ම ගෙන නිෂ්පන්න රූප වශයෙන් හඳුන්වති.

නිෂ්පන්න රූප වශයෙන් හැඳින්වෙන රූප දහ අට සභාව රූප, සලක්ඛණ රූප, සම්මසන රූප යන නම්වලින් ද හඳුන්වති. තමන්ගේ ම ස්වායත්ත ස්වභාවයක් ඇති නිසා සභාව රූප නමින් ද, අනිච්ච, දුක්ඛ අනත්ත යන ලක්ෂණ යුත් නිසා හෝ උප්පාද, ඨිතස්ස, ජරතා, භංග යන සංඛත ලක්ෂණ ඇති නිසා සලක්ඛණ නමින් ද, භාවනා අරමුණු වශයෙන් ගත හැකි නිසා සම්මසන රූප වශයෙන් ද හැඳින්වේ. රුප්පන ලක්ෂණ ප්‍රකට ව ඇත්තේ මේවායේ හෙයින් රූප රූප යන වචනය ද මේවාට යොදා ඇත. මේවාට නිෂ්පන්න රූප යන නම යොදන්නේ ඒවා ස්වායත්ත ස්වභාවයෙන් ම ග්‍රහණය කළ හැකි නිසා යැයි පවසති. (සභාවෙනෙව පරිග්ගහෙතබ්බ තො) එමෙන් ම



Free Distribution www.thiryak.org

චිත්ත, කම්ම, උතු සහ ආහාර යන ප්‍රත්‍යයන්ගෙන් සමුත්පන්න වන්නේ ද නිෂ්පන්න රූප පමණක් බව කියැවේ. (කම්මා දීහි පච්චයෙහි නිපඵන්නතත්තා නිපඵන්නරූපං නාම)

උපාද රූප අතුරින් මේ නිෂ්පන්න ගණයට වැටෙන්නේ රූප 14ක් පමණි.

පසාද රූප නම් රූප, ශබ්ද ආදී අරමුණු ගැනීමට සත්වයාට උපකාරී වන ඉන්ද්‍රිය සමූහයකි. ඒවා පහක් වෙයි. එනම්, චක්ඛුප්පසාදය, සොතප්පසාදය, ඝාණප්පසාදය, ජිව්හාප්පසාදය, හා කායප්පසාදය යන පහයි. මෙහිදී චක්ඛුප්පසාදය නම් ඇස නමැති ඉන්ද්‍රිය ම නොවේ. එම ඉන්ද්‍රිය හා සම්බන්ධ වූ ප්‍රසාදය හෙවත් ඔපයයි. ඇසෙහි රූප දැකීමට උපකාරී වන එම ඔපය චක්ඛු විඤ්ඤාණයෙහි පහළ වීමට ප්‍රත්‍ය වෙයි. සොතප්පසාදය කන් අඩියෙහි පිහිටි මුදුවක් වැනි ශබ්ද ජායාව ග්‍රහණය කරගත හැකි ප්‍රසාදය යි. ඝාණප්පසාදය පිහිටා ඇත්තේ නාසය තුළ ය. ජිව්හාපාසාදය නම් දිවෙහි පිහිටි රසයට සංවේදී වූ සූක්ෂම කොටස යි. කායප්පසාදය සමස්ත කාය පුරා ම පැතිර ගත් සංවේදී ස්වභාවයකි.

**ගෝචර රූප සතර**

ප්‍රසාද රූප පහට ගෝචර වන විෂය පහක් ම ඇතත්, කයට ගෝචර වන ස්පර්ශය අභිධර්මයෙහි දී රූප ලැයිස්තුවට ගෙන නැත. එයට මහාභූත තුනක් වූ පඨවි, තේජෝ, හා වායෝ ගැනෙයි. මහාභූත දශ්‍යමාන නොවුන ද ස්පර්ශ වන බව ථෙරවාදී අභිධර්මයේ පිළිගැනේ. චක්ඛුප්පසාදයෙහි විෂය වන රූපායතන වර්ණ සණ්ඨානයෙන් යුක්ත ය. එහෙයින් එයට වණ්ණ රූප යැයි ද කියැවේ. අටවිසි රූපයෙන් ඇසට ගෝචර වන මේ රූපය පමණක් අපට පෙනෙන අතර අනින් ඒවා නො පෙනේ. ශ්‍රොත හෙවත් කණට ගෝචර වන රූපය ශබ්දය යි. එය සාමාන්‍යයෙන් වෙනත් රූපවලට වඩා ඉක්මණින් නැති ව යයි. එය හට ගන්නේ විවිධ සම්මත හැපීම, පිපිරීම, පැවසීම ආදිය නිසාය. ගන්ධය නාසයෙහි පිහිටි ඝාණප්පසාදයට ගොචර වන රූපයයි. රසය නම් ජිව්හාපසාදයෙහි ගැටෙන අනේකවිධ රසය යි.

**ඉන්ද්‍රිය රූප තුන**

ඉත්ථින්ද්‍රිය හා පුරිසින්ද්‍රිය වශයෙන් හඳුන්වන්නේ ස්ත්‍රී පුරුෂයන්ගේ කායයන්හි නිරූපණය වන්නා වූ කායික පෙනුම, ලකුණු, ගතිගුණ යනාදිය ඇති කරවන සාධක දෙකකි. එය කායේන්ද්‍රිය මෙන් ම සකල ශරීරයේ ම ව්‍යාප්තව පවත්නා බව ඉගැන්වෙයි. (සකල ශරීර ඛ්‍යාපක) ජීවිතින්ද්‍රිය රූපය හඳුන්වා ඇත්තේ කර්මජ රූප (කම්මසමුට්ඨාන රූප) කල් පවත්නා පරිදි රැක ගන්නා සාධකය වශයෙනි. මෙහි දී දක්වා ඇත්තේ රූප ජීවිතින්ද්‍රිය සම්බන්ධයෙනි. සබ්බ චිත්ත සාධාරණ චෛතසිකයන් අතරට ගැනෙන අරූප ජීවිතින්ද්‍රියයක් ද වෙයි. එය රූප ගණයෙහි ලා නො ගැනෙයි. රූප ධර්මයන්ගේ ආයුෂය, පැවැත්ම, යැපීම, පාලනය, ජීවත්වීම යන කරුණු ජීවිතින්ද්‍රිය නිසා සිදු වෙයි.



Free Distribution www.thiryak.org

### ආහාර රූපය

මෙයින් අදහස් වන්නේ කබලිංකාරාහාරය යි. සාමාන්‍ය ව්‍යවහාරයේ ආහාර යන්නෙන් ධාන්‍ය ආදියෙන් සැකසෙන භෝජන අදහස් වුව ද අභිධර්මයේ දී එය ආහාරයේ පෝෂණ ගුණය වශයෙන් නිර්වචනය කර තිබේ (ඕජා). එහෙයින් අපට ඇසට පෙනෙන ආහාරය නොව එහි නොපෙනෙන ඕජා ගුණය මෙහි ආහාර වශයෙන් හඳුන්වා ඇති බව හැඟේ.

### හදය වත්ථු රූපය

මනෝ සහ මනෝ විඤ්ඤාණ ධාතූන්ගේ පහළවීමට සමාන වන හදය වත්ථු රූපය හදවත ම නොව සූක්ෂ්ම හදය රූපයක් බව කියැවේ. එය ද කර්ම විපාකජ වන නමුත් චක්ඛු සෝතාදීන් මෙන් ඉන්ද්‍රියයක් නොවේ. මනෝ සහ මනෝ විඤ්ඤාණ ධාතූන් හදය වත්ථු රූපයෙහි සම්භව වන නමුත් එයින් පාලනය නො වෙයි.

### භාව රූප දෙක

කාය විඤ්ඤත්ති. හා වචී විඤ්ඤත්තිය භාව රූප දෙක වශයෙන් හැඳින් වේ. අපගේ සිතුවිලි අන්‍යයනට දැනුම්දීමේ දී කය සහ වචනය උපකාර කර ගන්නට සිදු වේ. එහි දී කායෙහි චලනය සිදු වන්නේ කායික අවයව ක්‍රියා කරවන චිත්තයෙන් හට ගන්නා (චිත්ත සමුට්ඨාන) වායුවේ වේගය ඒ ඒ අතට හරවන ශක්ති විශේෂයක් මගිනි. එය කයෙහි දැඩි පෙළඹීමක් උත්තේජනයක් ලෙස දැක් වේ. (කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං) එමගින් සිතුවිල්ල කායික ව සන්නිවේදනය කෙරෙයි. එය චිත්තසමුට්ඨාන වායෝ ධාතුවේ ආකාර – විකාරයක් ස්වරූප විපර්යාසයක් ලෙස ද හඳුන්වා ඇත. කයෙහි චලනය (පරිඑන්දන) කෙරේහි කාය විඤ්ඤත්තිය ප්‍රත්‍ය වෙයි. වචී විඤ්ඤත්තිය නම් චිත්තසමුට්ඨාන සිත ප්‍රත්‍ය වීමෙන් හටගත් පඨවී ධාතුවෙහි ආකාර විකාරයක් (ස්වරූප වෙනසක්) වශයෙන් දැක් වේ. එම ආකාර විකාරය වචන හෙවත් ශබ්ද උත්පාදනය කරන ස්ථානය (අක්ඛරුප්පත්තිට්ඨානය) චලනය කර සිත විසින් සන්නිවේදනය කිරීමට අපේක්ෂා කරන ශබ්දය උපදවයි.

### විකාර රූප

රූපයෙහි සැහැල්ලු බව (ලහුතා) මෘදු බව (මුදුතා) හා ක්‍රියාත්මක කළ හැකි බව (කම්මඤ්ඤතා) යන තුන රූපයෙහි විශේෂ ආකාර තුනක් හෙයින් විකාර රූප තුනක් ලෙස වර්ග කරනු ලැබේ. රූපයෙහි ලහුතාව හෙවත් සැහැල්ලු බව පහසුවෙන්ම නැමීම හා වෙනස් කිරීම කළ හැකි බව (ලහුපරිණාමතා ) බර ගතියක් නැති කම (අදන්ධතා) දැඩි බවෙන් තොරවීම (අවිත්ථතා) ලෙස නිර්වචනය කරන අතර මුදුතාව රූපයෙහි මෘදු බව සුනම්‍ය බව (මද්දවතා) රළු භාවයෙන් තොරවීම (අකක්ඛලතා) ලෙස දැක් වේ. කම්මඤ්ඤතා යනු වැඩෙහි යොදවා ගැනීමට අවශ්‍ය සුනම්‍ය බව ලෙස විවරණය වේ. මේවා එකිනෙකට වෙන් වෙන් ව නොව එකට ම පවත්නා ලක්ෂණ වෙති. එමෙන් ම ඒවා ශරීරය නිරෝගී ව සුවපත් ව පවතින විට විද්‍යමාන වන තත්වයෝ වෙති.



Free Distribution www.thiryak.org

## ලක්ඛණ රූප

රූපයෙහි ලක්ෂණ වන උපචය (වර්ධනය) සන්තති (දිගට ප්‍රවර්තනය වීම) ජරතා (දිරායාම) අනිච්චතා (අනිත්‍යය) යන හතර ද අනිෂ්පන්න රූප හතරක් ලෙස දැක් වේ. රූපස්ස උපචය යන්න ඇස, කණ ආදි පංචවිධ ආයතනයන්ගේ සංග්‍රහණය හෙවත් හට ගැන්ම (සෝ ආයතනානං ආචයෝ සො රූපස්ස උපචයො) ය. රූපයෙහි හට ගැනීම රූපයෙහි සන්තතිය ලෙස (සො රූපස්ස උපචයො සෝ රූපස්ස සන්තති) ද දක්වා තිබීමෙන් මුල් ලක්ෂණ දෙක වූ උපචය හා සන්තති අන්‍යොන්‍ය වශයෙන් ඉතා සමීප ව බැඳී ඇති බව පෙනේ. පළමු වැන්නේ ම දිගට පැවැත්ම දෙවැන්න වෙයි. උපචය යන්නෙන් මුලින් ම හට ගැනීම අදහස් වන අතරේ, සන්තතියේදී ක්ෂය වන දේ වෙනුවට නැවත නැවත හට ගනිමින් ප්‍රවර්තනය වීම අදහස් වෙයි. රූපස්ස ජරතා නම් වූ තුන්වන ලක්ඛණ රූපය විවරණය කරන්නේ රූපය දිරා යාම හෙවත් මනුෂ්‍ය ශරීරයෙහි ඇති වන දත් දිරා යාම, (ඛණ්ඩිච්ච) හිස කෙස් පැසීම (පාලිච්ච) හම රැලි වැටීම (වලිතතචතා) ජීවිත කාලය ගෙවී යාම (ආයුනො සංහානි) හා ඉඳුරන් මෝරා(වරහස) යාම (ඉන්ද්‍රියානං පරිපාකො) වශයෙනි. රූපස්ස අනිච්චතා යන සිවුවන ලක්ෂණයෙන් මරණයේ දී රූපය බිඳ වැටීම අදහස් වෙයි. මෙම නිදර්ශන මනුෂ්‍ය ශරීරගත රූපයට සම්බන්ධ කොට දක්වන ලද්දේ වෙයි. මෙය සමස්ත රූප ධර්මවල පැවැත්මට අදාළ කොට යොදා ගැනීම ද කළ හැකි ය.

## පරිච්ඡේද රූපය

පරිච්ඡේද රූපය නම් ආකාශය යි. මෙයින් .හැඟෙන්නේ සමස්ත ආකාශය (අනන්තාකාස) හෙවත් අජටාකාශය නොව රූප ධර්ම වෙන් කරන රූප කලාප අතර පවතින සීමිත අවකාශය යි. එ සතර මහාභූත සමගි ස්පර්ශ නොවී පවතියි. මෙය ඉපදීමක් ඇති විශේෂ රූපයක් නොවුව ද රූප කලාපයන්ගේ අමිශ්‍ර පැවැත්ම සඳහා ඒ අතර පවත්නා අවකාශය හෙයින් මෙසේ අනිෂ්පන්න රූප ගණයට යොදා දක්වා තිබේ.



Free Distribution www.thiryak.org

## 7 වන පරිච්ඡේදය

# කය සහ සිත පිළිබඳ බෞද්ධ විවරණය

කය සහ සිත පිළිබඳ විවිධ ගැටළු ලොව පුරා දර්ශනිකයන් විසින් නිරතුරු ව ම සාකච්ඡා කෙරෙන හෙයින් බෞද්ධ අභිධර්මය මේ සම්බන්ධයෙන් කවර ස්ථාවරයක් ගන්නේ දැයි සොයා බැලීම අවශ්‍ය ය. සාමාන්‍යයෙන් බොහෝ භාරතීය චින්තකයන් සිත ආත්මය හා සම්බන්ධ කොට සාකච්ඡා කර ඇති හෙයින් බුදුසමය මේ සම්බන්ධයෙන් කරුණු දක්වන්නේ ද ආත්ම සංකල්පය සමඟ ද සම්බන්ධ කරමිනි. කය සහ ආත්මය හෙවත් ජීවය එකක් ද, දෙකක් ද යන්න පිළිබඳ විවිධ විවාද බුද්ධ කාලයේ ම පැවතුණු බවත් බුදුරදුන් මෙම විවාදයේ දී සරල පිළිතුරු දීමෙන් වැළකී ගැඹුරු දර්ශනික විග්‍රහයක් කරා ශ්‍රාවකයන් මෙහෙයවූ අයුරුත් ත්‍රිපිටකයෙන් පෙනේ. ස්ථිර වූ නිත්‍ය වූ ශාස්වත වූ ආත්මයක් පිළිබඳ පැවැත්ම බුදුසමයෙන් ඒකාන්ත වශයෙන් ම ප්‍රතික්ෂෙප වෙයි. එහෙත් එම ආත්ම ප්‍රතික්ෂේපය සිදු කර ඇත්තේ නිත්‍ය – අවිපරිණාමී පදර්ථයන් පිළිබඳ වූ නිර්වචනය පාදක කර ගෙන හෙයින් ආත්මයක් ප්‍රතික්ෂේප කළ පමණින් මානසික පැවැත්මක් ප්‍රතික්ෂේප නො කෙරෙයි. පටිච්ච සමුප්පන්න මනසක් පටිච්ච සමුප්පන්න කයක් සමඟ පරස්පර සම්බන්ධතා සහිත ව අනිත්‍යත්ව සන්දර්භයක් තුළ ක්‍රියාත්මක වන බව බුදුරදුන් ගේ ඉගැන්වීම තුළින් පැහැදිළි වෙයි.

දර්ශනිකයන් අතර ගත හා සිත එකිනෙකට බලපාමින් ක්‍රියාත්මක වන බව කියන්නෝ මෙන් ම මනස හුදෙක් කයෙහි ම අතුරු ඵලයක් ලෙස හඳුන්වන්නෝ ද වෙති. දෙවැන්න පිළිගන්නා බොහෝ භෞතිකවාදීහු සිතක් පිළිබඳ ව කතා කිරීම පවා බොළඳකමක් සේ හෙළා දකිති. සමහර විචාරකයන් බුදුදහම හෙළා දකින්නේ ද විඥානවාදයක් ලෙස එයට නිගරු කරමිනි. සිත භෞතික දේට වඩා ප්‍රධාන වන බව හා සිතෙන් භෞතිකය ඇරඹෙන බව විඥානවාදයේ කියැවෙයි. බුදුදහම භෞතිකය හෝ විඥානය පිළිබඳ ව එකක් අනෙකට වඩා විශේෂ වැදගත් කමක් ඇති සේ දක්වන චින්තනයක් නොව අවශ්‍ය තැන අවශ්‍ය පරිදි අවශ්‍ය දේට අවධාරණය දෙමින් පටිච්ච සමුප්පාදය පදනම් කර ගනිමින් කරුණු පැහැදිළි කරන්නකි.

මිනිසා ගතකින් මෙන් ම සිතකින් ද යුක්ත බව සාමාන්‍ය පොදු පිළිගැනීමකි. මේ දෙක අන්‍යෝන්‍ය අසම්බන්ධ ව ස්වාධීන ව පැවතිය හැකි දේ ලෙස වෙන් කිරීම ඉතා සරල සිතුවිලි ක්‍රමයක් මිස දර්ශනික පරිණතියක් පදනම් කර ගත් අදහසක් නොවේ. බුදුදහම සිත හා කය අතර විවිධ සම්බන්ධතා ඉදිරිපත් කර ඇති බව මෙහි දී අප තේරුම් ගත යුතුය. සිත වඩන්නට භාවනා කරන්නකුට කායික නිරෝගීතාව අතිශයින් අදාළ ය. එයින් හැඟෙන්නේ සිතට කය ආධාරක ව, බද්ධ ව පවත්නා බවය.



Free Distribution www.thiryak.org

මිනිසාගේ ජීවිතය ආයු. උස්මා යන විඤ්ඤාණ (ආයුෂ, උෂ්ණය හා විඥානය) යන ත්‍රිවිධ සාධක සමඟ බැඳී පවත්නා බවත් ඒවා ඉවත් වූ විට මරණය සිදු වන බවත් මූලික බෞද්ධ ඉගැන්වීම්වල දක්වෙයි. මෙයින් පෙනී යන්නේ ජීවිතින්ද්‍රියට කායික පදනමක් මෙන් ම මානසික පදනමක් ද ඇති බව ය. එමෙන් ම බුදුසමයෙහි පුනර්භවයක් ද පිළිගැනෙන හෙයින් විඤ්ඤාණය මරණින් පසු උච්ඡේද වීමක් සිදු නොවන බවත් පෙනේ.

පාලි අභිධර්මයේ දී විවිධ රූප කලාප ගැන ඉදිරිපත් කර ඇති විග්‍රහවලදී රූප හා බැඳුණු කිසි ම අවිනශ්වර සනාතන පදර්ථයක් උගන්වා නැති බව මෙහි දී සැලකිල්ලට ගත යුතුය. රූපය ද අනිත්‍ය බව නිරතුරු ව ම දක්වා ඇත. එමෙන් ම ඉතථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, කාය විඤ්ඤත්ති වැනි උපාද රූප ගණයට අයත් ඉන්ද්‍රිය පිළිබඳව දැනුමක් ලබාගත හැක්කේ මනසින් පමණකි. අනික් අතට ඉන්ද්‍රිය ඥානය ලැබීමේ දී චක්ඛු විඤ්ඤාණ ආදී ඉන්ද්‍රිය විඤ්ඤාණ පහළ වන්නේ කායික ඉන්ද්‍රිය හා ආරම්මණය (අරමුණ) ද පදනම් කර ගනිමිනි. ඒ සඳහා මනස යොමු කර තිබීම ද අවශ්‍ය ය. මෙය අභිධම්මාගත භවංග චිත්තය සමඟ සම්බන්ධ කර විස්තර කරනු ලැබේ. පට්ඨානප්පකරණයේ දී මනසෙහි සම්භවයට පදනම් වන වත්ථුරූපයක් ගැන කියැවෙන අතර බුද්ධඝෝෂ හිමියෝ විසුද්ධි මග්ගයේදී එය හදයවත්ථු රූප වශයෙන් විස්තර කරති.

මේ සම්බන්ධ ව සාකච්ඡා කිරීමේ දී අදාළ වන වැදගත් උපාදය රූප දෙකක් වූ කාය හා වචී විඤ්ඤත්ති පිළිබඳ ව මෙහිලා සාකච්ඡා කිරීම වැදගත් ය. මෙම උපාදය රූප කායික චලනයට හා කතා කිරීමට පදනම් වෙති. මේ රූප අනිකුත් රූප මෙන් නොව එම ක්‍රියාව සිදු වන අවස්ථාව තුළ පමණක් පවතියි. අටුවාවල දී මෙම රූප හුදු පඤ්ඤත්ති රූප වශයෙන් දක්වේ. මෙම උපාද රූපයෝ වායු හා පඨවි රූපයන්ගේ ප්‍රයෝගයෝ වෙති. එහෙයින් මේවා චිත්තය සමඟ සම්බන්ධ වන්නේ වෙනස් අයුරකිනි. අනිකුත් චිත්තජ රූප මනස සමඟ මීට වඩා ඍජු ව සම්බන්ධ වෙයි. එහෙත් රූප යනු සිතෙන් මවාගත් දේ නොවේ. චිත්තජ රූපයෝ මානසික සාධක හා අනිකුත් රූප සමඟ සමවායයෙන් ජනිත වෙති. එනම්, ඡන්ද, චිත්ත, විරිය, විමංසා, චේතනා හා ඣාන එම මානසික සාධකයෝ වෙති.

ධ්‍යාන ලාභීන්ට මනෝමය කායයක් ලැබ භෞතික ශරීරයෙන් පිටතට යාමට හැකියාවක් ඇති බව ද ඉගැන්වේ. එය මසැසට නො පෙනේ. ඍද්ධිමය වශයෙන් ද මෙබඳු කායයන් නිර්මාණය කිරීම හැකි වෙයි. මෙය කරන්නේ භාවනා බලයෙන් යම්කිසි මහා භූතයන් විශේෂ වශයෙන් ගෙන අනිකුත් මහාභූත ද එයට ම පරිවර්තනය කර ගැනීමට හැකි තත්වයට ගැනීමෙනි. නිදසුනක් වශයෙන් පෘථිවියට ප්‍රවිෂ්ට වීම (පොළොවෙහි කිමිදීම) පිණිස ආපො ධාතුව බවට පඨවි ධාතුව පරිවර්තනය කිරීම සඳහා භාවනා කිරීම අවශ්‍ය වෙයි.

කාය-චිත්ත භේදය පිළිබඳ ව අභිධර්මයෙහි එන විග්‍රහය කියවන විට අපට පැහැදිලි වන්නේ කය හා සිත වශයෙන් අන්‍යොන්‍ය ප්‍රති විරුද්ධ අසම්බන්ධ පදාර්ථ යුග්මයක් ගැන එහි නො කියැවෙන බවයි. කය හා සිත එකිනෙකට අසම්බන්ධ දේ

නොවේ. මේ දෙක ම නිරන්තර ව වෙනස් වන සංස්කාර ධම් පද්ධති වෙති. ප්‍රත්‍යයන්ගෙන් තොර ව ඒවායේ සම්භවය සිදු නොවේ. මෙම සංස්කාර ධම් පද්ධතියේ සාමාන්‍ය ගලා බැස්ම කෙරෙහි භාවනාව මගින් යම් යම් බලපෑම් ද වෙනස් කිරීම් සිදු කළ හැකිය.

ලොව සියල්ල පැහැදිලි ව වෙන් වෙන් ව පදර්ථ වශයෙන් සරල ව පවතිතියි සිතන්නවුනට මෙම සූක්ෂම හා සංකීර්ණ තත්වය තේරුම් ගැනීම අපහසුය. එහෙයින් ඔවුහු තම අති සරල චින්තනය පදනම් කර ගෙන සිත හා කය එකක් ද දෙකක්ද වැනි බොළඳ ප්‍රශ්න නගති. එවිට කලයුතු ව ඇත්තේ එම ප්‍රශ්න ඉවත දැමීමය. බුදුරදුන්ගෙන්. යං ජීවං තං සරීරං අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං' යනුවෙන් විමසුවනට පිළිතුරු නොදී ඒවා අව්‍යාකෘත ප්‍රශ්න ලෙස දක්වා ඇත්තේ එහෙයිනි. මේ දෙකහි අන්‍යොන්‍ය සාපේක්ෂක පැවැත්ම ''නාම-රූප'' දෙක නිතර ම යුගල පදයක් ලෙස දැක්වීම මගින් පැහැදිලි කර ගත හැකිය.



Free Distribution www.thiryak.org

## 8 වන පරිච්ඡේදය

# සිතෙහි ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය

ලෝකය සහ සත්වයා පිළිබඳ බෞද්ධ විවරණයෙහි සිතට අතිශය වැදගත් ස්ථානයක් හිමිවන බව ත්‍රිපිටකය පරිශීලනය කරන විට මනාව අවබෝධ වෙයි. චිත්ත චෛතසික හා රූප අන්‍යොන්‍ය සාපේක්ෂව ක්‍රියාකරන බව අවධාරණය කරන අතර ම. මනුෂ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වයෙහි ලා මනස ප්‍රමුඛවන බව ද බුදු සමයෙහි පැහැදිලි කරනු ලැබේ. මිනිසා නාම-රූප පද්ධතියක් සේ විග්‍රහ කරන විට, ඔහුගේ ඉන්ද්‍රිය පද්ධතිය එම නාම-රූප සමවායෙන් ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කර ඇත. මිනිසා ඉන්ද්‍රිය අනුසාරයෙන් බාහිර ලෝකයේ පවත්නා රූපාදී ආරම්මණ තේරුම් ගනියි. එම අරමුණු වටහා ගැනීම මගින් සංකල්ප සාධනය කරනු ලබන්නේ චිත්ත-චෛතසික ක්‍රියාකාරිත්වය අනුව ය. ලෝකය තේරුම්ගෙන විවරණය කිරීමෙහිලා මනසෙහි ප්‍රමුඛත්වය ප්‍රතික්ෂේප කිරීමට කිසිවකුට හැකි නො වේ. බාහිර ලෝකය පිළිබඳ අපගේ දැනුම අපගේ විජානන ක්‍රියාවලියේ අනිවාර්යය ප්‍රතිඵලයකි.

සිත හා භෞතිකය අතර පවත්නා සබඳතාව හරිහැටි තේරුම් නොගත්තා භෞතිකවාදියකු, සිත නම් භෞතික ධර්ම සමූච්චයෙන් නිපන් ද්විතීක පදාර්ථයක් සේ ලඝුකොට සිතුමට ඉඩ තිබේ. ඇතැම්හු එය දුම්රිය හා හුව පිළිබඳ සාදෘශ්‍යයෙන් දක්වති. දුම්රිය ධාවනයේදී එහි යන්ත්‍රානුසාරයෙන් නිකුත් කරන හූ හඬ ද්විතීයික දෙයකි. මනුෂ්‍ය ශරීරය හා බැඳුණු සිත ද එබඳු ක්‍රියාකාරිත්වයක් සේ ඔවුහු සිතති. එහෙත් මෙය සාවද්‍ය චින්තනයක් මිස නිවැරදි අදහසක් නොවේ. දුම්රියෙහි හූ හඬට දුම්රිය විෂයෙහි කිසිම බලපෑමක් කළ නොහැක. එහෙත් මිනිස් සිතට මනුෂ්‍ය ශරීරය විෂයෙහි දැඩි බලපෑමක් කළ හැකිය. සිත මුල්කරගෙන ඇතිවන රෝග සංඛ්‍යාව අතිශයින් විශාලය. සිත පාලනය කිරීමෙන් හා අධිෂ්ඨාන ශක්තිය ක්‍රියාත්මක කිරීමෙන් බොහෝ රෝග සුවකළ හැකිය. මනසෙහි ශක්තිය පිළිබඳව බොහෝ විද්වතුන් විසින් මෑතකදී කර ඇති පරීක්ෂණ අනුව එය හුදු උප පදාර්ථයක් නොව ඉතා වැදගත් හා බලගතු දෙයක් බව පෙනී ගොස් ඇත. මිනිසා සතු ඉතා වැදගත්ම ඉන්ද්‍රිය මන ඉන්ද්‍රිය බවත්, එහි ක්‍රියාකාරිත්වය විශ්මයජනක බවත් දිනෙන් දිනම ස්ඵුට වෙමින් පවතී.

අපගේ වයඹාවත් විෂයෙහි සිත දක්වන ප්‍රභූත්වය බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වාදී ඇත්තේ මෙසේය.

"චිත්තෙන නීයති ලෝකෝ
චිත්තෙන පරිකස්සති
චිත්තස්ස එක ධම්මස්ස
සබ්බෙව වසමන්වගූ"

ලෝකය මෙහෙයවනු ලබන්නේ සිත විසිනි. සිත විසින් ලොව ඇදගෙන යනු ලැබේ. සිත නම් වූ එකම ධර්මයට සියල්ලෝ වසඟව සිටිති. සිත දමනය කරගතහොත් මිනිසාට ඉතාමත් ප්‍රයෝජනවත් දෙයක් බවට එය පත්කරගත හැකි ය. (චිත්තං දන්තං සුඛාවහං) එහෙත් එය පහසු දෙයක් නොවේ. සිත අරමුණෙන් අරමුණට වහ වහා පතින, තම ස්වභාවය නිතර වෙනස් කරන වස්තුවකි. එක් මොහොතක යමකට ප්‍රියකරන සිත වහා වෙනස් වී එයම අප්‍රිය කරයි. (ලහු පරිවත්තක) සිත දියෙන් ගොඩ දැමූ මාළුවකු සේ සැලෙනිසි පැවසේ. එහෙයින් ක්ෂණයෙන් දුර ගමන් යන සිත දමනය කොට අපගේ වසඟයට ගැනීම සඳහා දැඩි ශික්ෂණයක් අවශ්‍ය වෙයි. බොහෝ අපරාධ සිදුවන්නේ සිත දමනය කරගන්නට අසමත් පුද්ගලයන් අතිනි. බොහෝ විට සිදුවන්නේ අප පිළිගත් සදචාර ධර්ම, අපගේ දැනුම හා බුද්ධිමත් බව වැනි සියළුම කරුණු අභිබවා අදාන්ත සිත ප්‍රචණ්ඩ ලෙස ක්‍රියාකාරී වීමය. මෙසේ සිදුවන්නේ කවර හෙයින් ද? සිත කයින් නිපන් දෙවන පෙළ පදාර්ථයක් නම් එය හික්මවා ගැනීම මෙතරම් අපහසු මන්ද?

මිනිස් සිත හුදෙක් එක් මොහොතකදී කායික ක්‍රියාකාරිත්වයෙන් පමණක් හටගන්නා රසායනික හෝ භෞතික ප්‍රතිචාර මාත්‍රයක් නොව දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන පටිච්චසමුප්පන්න ක්‍රියා පද්ධතියක ප්‍රතිඵලයක් සේ ක්‍රියාත්මක වන්නකි. මිනිස් සිත තුළ දීර්ඝ සාංසාරික අත්දැකීම් සමූහයක් නිදන්ගතව ක්‍රියාත්මක වෙයි. සිත තුළ නිළීනව ඇති කුසලාකුසල බීජ සමූහය හැඳින්වෙන්නේ අනුසය නමිනි. 'අනුසය' යන වචනයෙහි අරුත නිද්‍රෝපගත' යන්නය. බොහෝ කෙලෙස් සිත තුළට වැදී උප විඤ්ඤාණගතව නිශ්ක්‍රියව පවතියි. අනුසය වශයෙන් සිත තුළ නිදන මෙබඳු නිළීන රංජන හතක් බුදු දහමෙහි ඉගැන්වෙයි. එනම්, කාමරාග, පටිඝ, දිට්ඨි, විචිකිච්ඡා, මාන, භවරාග හා අවිජ්ජා ය. මේවා පවතින යටි සිත නිතරම උඩු සිත කලඹන්නට වෑයම් කරයි. ගැලපෙන අරමුණක් ලද විට යටි සිතේ නිද සිටින අනුසය පිබිදෙයි. එය පරියුට්ඨාන නමින් හැඳින්වේ. අනුසය පිබිදුම වඩාත් ප්‍රචණ්ඩ ලෙස සිදුවේ නම්, එය 'වීතික්කම' වශයෙන් හැඳින්වේ. මෙසේ මිනිස් සිත ගැඹුරින් තැන්පත් වූ ආවේග බීජ මගින් දූෂිත හෙයින්, එහි ක්‍රියාකාරිත්වය අදාන්ත වෙයි. අප පිළිගත් සදචාර ධර්ම මගින් එය හැසිරවීම දුෂ්කර වන්නේ එහෙයිනි. දූෂිත යටි සිත අපේ චර්යාව ව්‍යාකූල කිරීම සඳහා අධිසංවේදිව අපේක්ෂා කරවගව සිටින අතර, සීලය හා භාවනාව මගින් සිත හා ප්‍රඥාව වර්ධනය කරමින් අපි ඒවාට එරෙහිව අරගලයක යෙදෙමු. මෙම අරගලයේ දුෂ්කරතාව බෞද්ධ පතපොතෙහි විවිධ ආකාරවලින් නිරූපනය කර ඇත. මෙහිදී 'යටිසිත' යන වචනය නූතන මනෝවිද්‍යා ව්‍යවහාරානුසාරයෙන් අප භාවිත කළ ද, පැරණි බෞද්ධ පතපොතෙහි 'අනුසය' හා සම්බන්ධ කර යොදාගත හැකි පදය ලෙස හමුවන්නේ අසම්පජාන මනො සංඛාර යන වචනයයි. උඩු සිත සම්පජාන මනො සංඛාර ලෙස දැක්විය හැක. අපගේ යටිසිතෙහි නිළීනව සිට අපගේ සක්‍රිය මනස කෙරේ බලපාන ක්ලේශ සංයෝජන හෙවත් සසරට බඳනා බැම් වශයෙන් ද ක්‍රියාත්මක වෙයි. සිත නිබඳව ක්‍රියාත්මකව පවතින්නකි. එය නවතා තැබීම අතිශයින්ම දුෂ්කරය. එහි වේගය භෞතික රූපයෙහි වෙනස්වීම් වේගයට වඩා දහසත් ගුණයකින් වැඩි බව අභිධර්මයෙහි දැක්වේ. පෙළ පොත්වල සිතේ පැවැත්ම 'විඤ්ඤාණ සොත' වශයෙන් හඳුන්වන්නේ ද මෙම ගලාබස්නා ස්වභාවය හේතුවෙනි.



Free Distribution www.thiryak.org

සිතෙහි ක්‍රියාකාරිත්වය පඤ්ච උපාදනස්කන්ධ විවරණය තුළ ද ප්‍රකටව පෙනේ. නාම ධර්ම චතුර්විධව ප්‍රභේද කරන විට සිතෙහි ක්‍රියාකාරිත්වයන් හතරක් නාම ධර්ම කදම්බ වශයෙන් හැඳින්වෙන බව පෙනේ. වේදනා උපාදනස්කන්ධය මගින් විඳින ක්‍රියාවලිය අභිප්‍රේත ය. බාහිර ලෝකයෙන් අපගේ ඉන්ද්‍රියන් වෙත ගෝචර වන අරමුණු විෂයෙහි සුඛ, දුක්ඛ හා අදුක්ඛමසුඛ විඳින ලැබීම මෙයින් අදහස් වෙයි. මෙම විඳින මගින් අපි තෘෂ්ණාව වැනි විවිධ කෙලෙස්වලට මඟ පාදමු. ප්‍රියරූපී රූපයක් දුටුවිට අපි ඒ කෙරෙ ආශා කරමු. (ප්‍රිය රූපෙ රූපෙ සාරජ්ජති) අප්‍රිය රූපී රූපයක් දුටු විට ඒ කෙරෙ අමනාපයක් ඇතිකර ගනිමු. (අප්පිය රූපෙ රූපෙ බ්‍යාපජ්ජති) මෙසේ අරමුණු ඇසුරින් විඳින ලබා කෙලෙස් ජනිත කර ගන්නා අපි අසම්ප්‍රජානන මනසේ අනුසය ද වර්ධනය කරමු. සඤ්ඤා උපාදනස්කන්ධය මගින් අපගේ හඳුනාගැනීම් ක්‍රියාවලිය දක්වෙයි. අපගේ සිතෙහි පවත්නා ආකල්ප හෝ සංකල්ප උපකාරීකර ගනිමින් බාහිර ලෝකය හඳුනා ගැනීමෙන් අපි සඤ්ඤා උපාදන ඇතිකර ගනිමු. විඳින කෙරෙහි මෙන්ම මෙම 'හැඳුනුම්' කෙරෙහි ද සත්වයෝ බැඳුම් ඇතිකර ගනිති. ආත්ම දෘෂ්ටිය ඇතිකර ගනිති.

සංඛාර හෙවත් විවිධ චර්යා විශේෂ දක්වීම් ද මනසෙහිම ක්‍රියාකාරිත්වයකි. විවිධ චෛතසිකයන් පෙළගස්වමින් මානසික හැසිරීම් රටා සකසාගෙන, සිත කය හා මනස මගින් නිරූපණය කරන විට සංඛාර උපාදනස්කන්ධය ජනිත වෙයි. විඤ්ඤාණ නමින් හැඳින්වෙන්නේ ඉන්ද්‍රියානුසාරයෙන් අප ලබන දැනුම් සමූහයයි. එය ද අපගේ මමායනය හා බැඳෙන විට විඤ්ඤාණ උපාදනස්කන්ධ වශයෙන් පංච උපාදනස්කන්ධයේ සංග්‍රහණය වෙයි. මෙසේ අපගේ මානසික චර්යා පද්ධති හතරක් සිතෙහි ක්‍රියාකාරිත්වය සමඟ බැඳී අපගේ ආත්ම දෘෂ්ටිය තහවුරු කරයි.

සිතෙහි සක්‍රිය ස්වභාවය අභිධර්මයෙහි දැඩිලෙස ම අවධාරණය කෙරෙන බව පැහැදිලි හෙයින් එමගින් ඉටු කෙරෙන කාර්ය කවරේදැයි අභිධර්මානුකූලව තේරුම් ගැනීම ද වැදගත් ය. සිතෙන් ඉටු කෙරෙන ඒ ඒ ක්‍රියාවලින් විස්තර කිරීමේදී ''චිත්ත වීථි'' නමින් හැඳින්වෙන ''සිතිවිලි වැල්'' ක්‍රමය භාවිත කෙරේ. සිතෙන් කෙරෙන කාර්ය දහතරක් මුල්කරගෙන මෙම පැහැදිලි කිරීම කරනු ලැබේ.

(1) ප්‍රතිසන්ධි කෘත්‍යය – මරණයෙන් ජීවිතය කෙළවර වන්නට ඉඩ නොදී නැවත උපතක් ඇති කිරීම.

(2) භවංග කෘත්‍යය – ජීවිතය අතරතුරේ සිත් පරපුර සිඳී යන්නට ඉඩ නොදී දිගට පවත්වාගෙන යාම.

(3) ආවර්ජන කෘත්‍යය – කිසියම් අරමුණකට (විෂයයකට) සිත යොමු කිරීම.

(4) දර්ශන කෘත්‍යය – රූපය දැකීම

(5) ශ්‍රවණ කෘත්‍යය – ශබ්ද ඇසීම

(6) ආඝ්‍රාණ කෘත්‍යය – ගඳ සුවඳ දැන ගැනීම

(7) ආස්වාදන කෘත්‍යය – රස දැන ගැනීම

(8) ස්පර්ශන කෘත්‍යය – සිරුරෙහි ගැටෙන දේ දැන ගැනීම.



Free Distribution www.thiryak.org

(9) සම්ප්‍රත්‍යෂණ කෘත්‍යය - ඉන්ද්‍රිය පද්ධතිය මගින් ලද අරමුණු පිළිගැනීම.

(10) සන්තීරණ කෘත්‍යය - එසේ පිළිගත් අරමුණු විමසීම.

(11) ව්‍යවස්ථාපන කෘත්‍යය - විමසූ අරමුණෙහි තත්ත්වය විනිශ්චය කිරීම.

(12) ජවන කෘත්‍යය - පූර්වෝක්ත ක්‍රියා පිළිබඳව ම වූ අධික චිත්ත වේගය

(13) තදලම්බන කෘත්‍යය - ජවනයෙන් ගත් අරමුණ ග්‍රහණය කර ගැනීම.

(14) ච්‍යුති කෘත්‍යය - එක් එක් භවය (ජීවිතය) කෙළවර කිරීම.

මේ අතුරින් එක් සත්වයකුට එක් භවයකදී ප්‍රතිසන්ධි, චුති යන කෘත්‍ය සිදුවන්නේ එක්වර බැගිනි. වැඩිපුරම සිදුවන්නේ භවංග හා ජවන් සිත් ඇති වීමය.

චිත්ත විථි වර්ග දෙකක් වෙයි. පඤ්චද්වාරික විථි හා මනෝද්වාරික විථි නමිනි. පඤ්චද්වාරික විථි නම් අපගේ ඉන්ද්‍රිය පඤ්චකය හා බැඳුණු අරමුණක් පදනම් කරගත්තා සිත් වැල ය. මනෝද්වාරික නම් සිතට අරමුණු වන ධර්මයක් එල්බගෙන පවත්නා සිත් වැලය. සිත ක්‍රියාත්මක වන මෙම විථි නම් වූ රටාවන් අභිධර්මයෙහි දී ඉතා විසිතුරු ආකාරයකට සංකේත යොදමින් පැහැදිලි කරනු ලැබේ. (මේ පිළිබඳව දීර්ඝ ලෙස සංකීර්ණ විස්තර දැන ගැනීම සඳහා මහාචාර්ය රේරුකානේ චන්දවිමල නා හිමියන් ලියූ අභිධර්ම මාර්ගය නම් ග්‍රන්ථය කියවන්න.) සාමාන්‍යයෙන් චිත්ත විථියක් ක්ෂණ 17 කින් සම්පූර්ණ වෙයි. මෙම 17 සංඛ්‍යාව යොදා ඇත්තේ රූපයක පවත්නා ආයුෂ අනුව ය. චිත්ත විථියක ආරම්භය අතීත භවංගයේ සිට සටහන් කරනු ලැබේ. භවංගය නම් සිත අරමුණු චිත්තනයක නොයෙදී පවත්නා විට ඇති තත්ත්වය හඳුන්වන නමකි. අතීත භවංගය පළමු ක්ෂණය සේ ගත්විට දෙවැන්න භවංග චලනය වෙයි. තුන්වන ක්ෂණයේදී භවංගය උපච්ඡේද වේ. හතරවන ක්ෂණයේදී පඤ්චද්වාරාවජ්ජන තත්ත්වය උදා වේ. අරමුණක් කරා යොමුවීම ඇරඹෙන්නේ මෙම ක්ෂණයේදී ය. ඉන්පසු ක්ෂණයේදී චක්ඛු - සොත ආදී ඉන්ද්‍රියයන් පදනම් කරගෙන විඤ්ඤාණයක් ඇති වේ. එය අදාළ පරිදි චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ ආදී නම්වලින් හැඳින්වේ. හයවන ක්ෂණය සම්පටිච්ඡන හෙවත් සම්ප්‍රත්‍යෂණය සිදුවන අවස්ථාවයි. හත්වන ක්ෂණයේදී සන්තීරණය ද අටවන ක්ෂණයේදී වොත්ථපනයද සිදුවේ. 9 සිට 15 දක්වා වූ ක්ෂණ ජවන් සිත් වෙයි. 16-17 ක්ෂණ තදාරම්මණ කාර්යය සඳහා ගතවන කාලයයි. සාමාන්‍ය චිත්ත විථියක පොදු රටාව මෙයින් හඳුනා ගත හැක.

අතිමහන්තාරම්මණ, මහන්තාරම්මණ, පරිත්තාරම්මණ, අතිපරිත්තාරම්මණ වශයෙන් චිත්ත විථි රටාවෙහි යම් යම් ප්‍රභේද කිරීම ද වෙයි. මෙවායේ වෙනස්කම රඳා පවත්තේ අතීත භවංග සංඛ්‍යාව වැඩිවීම, ජවන් සිත් සංඛ්‍යාව අඩුවීම වැනි කරුණු මතය.

(1) අතිමහන්තාරම්මණයේ දී අතීත භවංග එකකි, ජවන් හතකි.

(2) මහන්තාරම්මණයේදී අතීත භවංග දෙකක් හෝ තුනක් ඉකුත් වේ. ජවන් හතකි. තදාරම්මණ නොමැත.



Free Distribution www.thiryak.org

(3) පරිත්තාරම්මණයේදී අතීත භවංග හතරක් වේ. ජවන් සිත් නොමැත. ඒ වෙනුවට වොත්ථපන දෙකක් හෝ එකක් ඇති වී ඉතිරි චිත්තක්ෂණ භවංග වලින් සම්පූර්ණවේ.

(4) අතිපරිත්තාරම්මණයේදී පංචද්වාරාවජ්ජනයේ සිට වොත්ථපන දක්වා ඇති සිත් ඇති නොවේ. ජවන් ද නොමැත.

මනෝද්වාරික චිත්ත වීථිවල ස්වරූපය මීට වෙනස් ය. එහිදී පඤ්ච ද්වාරා වර්ජනයක් නැති හෙයින් ඉන්ද්‍රිය පංචකය පිළිබඳව දක්වූ චක්ඛු විඤ්ඤාණාදියත් සම්පටිච්ඡන සන්තීරණ, වොත්ථපන ආදියත් නොමැත. මනෝද්වාරික චිත්ත වීථි විභූත හා අවිභූත වශයෙන් දෙයාකාරය. සිතෙන් කල්පනා කරනවිට පැහැදිලිව හොඳින් වැටහේ නම් එය විභූත ය. එසේ පැහැදිලි නො වන්නේ නම් අවිභූත ය. අවිභූත චිත්ත වීථියක් විභූතයෙන් වෙනස් වන්නේ අවිභූතයේදී තදාරම්මණ සිත් නොමැති වීමෙනි. එමෙන් ම මනෝ ද්වාරික චිත්ත වීථි, කාම ජවන චිත්ත වීථි හා අර්පනා ජවන චිත්ත වීථි වශයෙන් දෙ වැදෑරුම් ය. ප්‍රථම වර්ගය කාමාවචර ජවන් සිත් උපදිනා චිත්ත වීථිය. දෙවන වර්ගය ධ්‍යාන, මාර්ගඵල හා බැදෙන රූපාවචර, අරූපාවචර හා ලෝකෝත්තර චිත්ත වීථි ය.

සිතෙහි ක්‍රියාකාරිත්වය ඉතා සංකීර්ණ හා ගැඹුරු විෂයයකි. මෙහි එය සංක්ෂෙපයෙන් දක්වූ බව සිහියෙහි තබා ගත යුතු ය.



Free Distribution www.thiryak.org

9 වන පරිච්ඡේදය

# සිත කිළිටිවීම

අපි බාහිර විෂයලෝකය පිළිබඳ දැනුම ඉන්ද්‍රියඥනය මගින් ලබමු. ඉන්ද්‍රියඥනය මගින් විෂයලෝකය පිළිබඳ දැනුම ලබා ගැනීමෙහි දී පෘථග්ජනයා තුළ 'ප්‍රපඤ්ච' හටගන්නා බව ඉගැන්වෙයි. මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රයෙහි එය පැහැදිලි කොට ඇත්තේ මේ ආකාරයෙනි.

(1) චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං
(ඇසත් එයට අරමුණු වන රුවත් නිසා රූපය පිළිබඳ දළ දැනුමක් ඇති වෙයි.)

(2) තිණ්ණං සංගති ඵස්සෝ
(ඇස, රුව් සහ චක්ඛු විඤ්ඤාණය යන තුන නිසා සිත අරමුණු සමඟ ක්‍රියා කිරීමට පටන් ගනියි.)

(3) ඵස්ස පච්චයා වේදනා
(පූර්වෝක්ත ක්‍රියා මගින් විඳීමක් ඇති වෙයි.)

(4) යං වේදේති තං සඤ්ජානාති
(වේදනාව නිසා හැඳිනගැනීම ඇති වෙයි.)

(5) යං සඤ්ජානාති තං විතක්කේති
(හැඳිනීම නිසා විතර්කය හට ගනියි.)

(6) යං විතක්කේති තං පපඤ්චේති
(විතර්කය (කල්පනා කිරීම) නිසා ප්‍රපඤ්චිත තත්ත්වයට එළඹෙයි.)

(7) යං පපඤ්චේති තතෝ නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නේසු චක්ඛු විඤ්ඤෙය්‍යසු රූපේසු....."
(ඒ චක්ඛු රූපාදිය මූල් කාරණය කොටගෙන තෘෂ්ණා – දෘෂ්ටි – මානාදි ප්‍රපඤ්ච ධර්මයෝ අතීත අනාගත වර්තමාන යන තුන් කාලයට අයත් ඇසින් බලා දතයුතු වූ රූපයන් කෙරෙහි පුරුෂයා ග්‍රහණය කර සිටිති.)

මධුපිණ්ඩික සූත්‍රය ඉන්ද්‍රියයන් ඇසුරින් මිනිස් සිත ක්‍රියා කරන ආකාරය පියවරින් පියවර දක්වයි. විශේෂයෙන් මනසේ ක්‍රියාකාරිත්වය අනුව මිනිස් චින්තනය හසුරුවන අයුරු දක්වෙයි. (චින්තනයට භාෂාව අත්‍යවශ්‍ය නොවෙයි.) සිතේ හට ගන්නා 'සිතුවම්' මගින් සිතේ ක්‍රියාවලිය ඇතිවන අයුරු මෙහි දක්විණි.



Free Distribution www.thiryak.org

මධුපිණ්ඩික සූත්‍රයෙන් විවරණය කළ ඉන්ද්‍රියඥනයේ ප්‍රභවය පහත දැක්වෙන පරිදි තවදුරටත් කැටි කළ හැකි ය.

(i) මුල සිට ඵස්ස පච්චයා වේදනා යන ප්‍රකාශය දක්වා හේතුඵල ධර්මයට අනුව ඉබේ සිදුවන මානසික ක්‍රියාවලිය දැක්වෙයි. (1 –3)

(ii) යං වේදේති – තං පපඤ්චේති යනුවෙන් දැක්වෙන අවස්ථා (4 – 6) සකර්තෘක ක්‍රියාපද ස්වරූපයෙන් දැක්වෙයි.

(iii) ඉතික්ඛීතිව දැක්වෙන වාක්‍යයේ උක්තය ''පපඤ්ච සඤ්ඤ සංඛා''ය. එහි 'පුරිසං' යනු අනුක්ත රූපයයි.

ඉන්ද්‍රියඥනය මගින් චිත්තනය ක්‍රියාත්මක වන අවස්ථා තුනක් මෙහි උගත්වයි. ප්‍රථම අවස්ථාවෙහි ඉඳුරන් විවෘතව ඇති බැවින් ක්‍රියාවලිය ඉබේ සිදු වෙයි. බාහිර විෂය වස්තූන් සුවිශේෂ අධ්‍යයනයකින් තොරව මූලික වශයෙන් හඳුනා ගැනීම මෙ මගින් සිදු වෙයි. පුද්ගලයා ප්‍රතික්‍රියා දක්වන අයුරු දෙවැනි අවස්ථාවෙන් කියැවෙයි. තුන්වැනි අවස්ථාවෙහි දී කාලත්‍රය ඔස්සේ සිතුවිලිද්‍රමය ක්‍රියාත්මක වන අයුරු ප්‍රකාශිත ය. අතීතයේදී මෙසේ වූයේ ය. වර්තමානයේ මෙසේ වෙයි. අනාගතයෙහි දී මෙසේ විය හැකි ය ආදි වශයෙන් කල්පනාව මෙහෙයවෙයි. ඇස්, කන්, නාසාදි ඉඳුරන්ගේ මාර්ගයෙන් රූපාදි අරමුණු හැඳින ගැනීමට ප්‍රයත්න දරයි. මෙලෙස ක්‍රියා කිරීමෙහි දී සිතුවිලි ජනිත වෙයි. අරමුණු විජානනය කිරීමෙහිදී ඒ ඒ අරමුණුවලට මනසින් ඇගයුම් සැපයේ. හොඳ, සුභ, ලස්සන, සාධු අරමුණු විෂයෙහි ඇලීමක් ද නොහොඳ, අසුභ, අවලස්සන, අසාධු අරමුණු විෂයෙහි ගැටීමක් ද ජනිත වෙයි. හොඳ – නරක වශයෙන් අරමුණු බෙදගන්නේ ද අපේ මනස ය.

විඥනය ඇතිවීමට විඥනකාය සයක් අවශ්‍ය බව සූත්‍ර ධර්මවල සඳහන් වෙයි. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යනු ඒ හය යි. මේ ඉන්ද්‍රිය සය ඇසුරෙන් අපි බාහිර ලෝකය ගැන දැනුම ලබා ගනිමු. ඇස ඇසුරෙන් ඥනය ලබා ගැනීමට කරුණු තුනක් සම්පූර්ණ විය යුතු ය.

(i) නොබිඳුනු ඇසක් තිබීම
(අජ්ඣත්තිකං චක්ඛුං අපරිභින්නං හෝති)

(ii) බාහිර වශයෙන් ඇති රූපය එම ඇසෙහි ක්ෂේත්‍රයට අසු විය යුතු ය.
(බාහිරා ච රූපා අපාථං ආගච්ඡන්ති)

(iii) එම වස්තුව පිළිබඳ සුදුසු අවධානයක් යොමු කළ යුතු ය.
(තජ්ජෝ ච සමන්නාහාරෝ හෝති)

ඉන්ද්‍රියඥනය නිසි පරිදි ඇතිවීමට මේ අංග තුන ම සම්පූර්ණ විය යුතු ය. අභ්‍යන්තර (පුද්ගලයා සතු) ඉන්ද්‍රිය ලෙස සලකන ඇස ආදි කොට ඇති ඉන්ද්‍රියයන් තිබිය යුතු ය. ඒ ඉඳුරන් ද නොබිඳුණු (අපරිභින්න) තත්ත්වයක් ඉසිලිය යුතු ය. මසැස වූ පමණින් රූප දැකිය නො හැකිය. නොබිඳුණු තත්ත්වයෙන් පැවතීම අත්‍යවශ්‍යය. ඇස ආදි ඉඳුරන් මනාව තුබූ පමණින් බාහිර ලෝකය පිළිබඳ අපට දත නොහැකි ය.


Free Distribution www.thiryak.org

ඒ ඉන්ද්‍රියයන්ට රූපාදි සවැදෑරුම් අරමුණු එළඹිය (ආපාතගමනය) යුතු ය. චක්ඛුරින්ද්‍රියට රූපය අරමුණු විය යුතු ය. එසේ අරමුණු වූ පමණින් ඒ වස්තුව පිළිබඳ ඥානය ඇති නොවේ. ඒ සඳහා අවධානයක් යොමු කළ යුතු ය. ආවශ්‍යක ප්‍රත්‍යයන් අතුරින් මේ කරුණ ඉතා වැදගත් ය. අප මහමඟ ගමන් කරන කල අපමණ රූප ශබ්දදිය අරමුණු වෙයි. එහෙත් ඒවායින් අපේ අවධානය යොමු කරනු ලබන්නේ ඉතා ස්වල්පයක් විෂයෙහි පමණ ය. ඇසට රූප මුණගැසුණු පමණින් දැනුමක් නොලැබේ. ඒ ගෝචර වස්තුව වෙත අපේ අවධානය අභ්‍යන්තර වශයෙන් යොමු කළ යුතු ය. මෙයින් පැහැදිලි වන ප්‍රධානතම කරුණ නම් අපේ සිත ඒ සඳහා යොමු කිරීම අවශ්‍ය බව යි. සිත නොමෙහෙයවන්නේ නම් ඒ වස්තුව පිළිබඳ දැනුම් විශේෂයක් ද අප තුළ ජනිත නොවෙයි. මිනිසා බාහිර ලෝකය පිළිබඳ දැනුම ලබා ගන්නේ මේ අයුරිනි.

ඉඳුරන්ගේ ක්‍රියාකාරිත්වය මගින් මානව පෞරුෂය කේන්ද්‍ර කොට ගෙන ආත්ම සංකල්පය (අස්මිමානය – මමත්වය) ප්‍රභවය ලබන බව බුදුසමය පැහැදිලි ව දක්වයි.

> "අවිද්‍යාවෙන් පැනනඟින වේදනාවන්ගෙන් ස්පර්ශ කරනු ලබන නූගත් පෘථග්ජනයාට "මම සිටිමි" කියා ද, "මෙය මම වෙමි" කියා ද හැඟේ. (අවිජ්ජා සම්ඵස්සජේන වේදයිතේන ඵුට්ඨස්ස අස්සුතවතෝ පුථුජ්ජනස්ස අස්මී'ති පිස්ස හෝති. අයං අහං අස්මී'ති පිස්ස හෝති" – ඛන්ධ සංයුක්තය)

සංවේදනීය භාවයෙන් යුත් ශරීරය මමය, මගේය යන හැඟීමෙන් යුක්තව සිත ක්‍රියා කරයි.

නාම ධර්මයන්ගේ හා රූප ධර්මයන්ගේ සමවායෙන් පුද්ගල ව්‍යූහය සැකසී ඇත. බුදුසමය පුද්ගලයා සැදී ඇති අයුරු විග්‍රහ කරන්නේ මූලික වශයෙන් ම පඤ්චුපාදානක්ඛන්ධය මගිනි. උපාදානය යනු දැඩි සේ අල්වා ගැනීමයි. දැඩි ග්‍රහණයයි. පුද්ගලයා නිරතුරුව තමා සතු යයි අල්ලා බැඳගත්තා කොටඨාශ පහක් පඤ්ච උපාදානස්කන්ධ වශයෙන් ඉගැන්වෙයි.

රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ යනු ඒ පහයි. "මගේ මුහුණ, මගේ අත, මගේ කකුල, මගේ ඇස, මගේ මොළය ආදි වශයෙන් අපි අපේ සිරුර අප සතු කර ගනිමු. "මම සුදුයි, මම උසයි, මම මිටියි" ආදි වශයෙන් පවසන්නේ තමාගේ සිරුර පිළිබඳ විස්තරයකි. මෙමගින් අප මනසින් නිර්මාණය කරන්නේ තමා සන්තක වන අනන්‍යතාව ය. තමා සෙසු අයගෙන් වෙන්කොට දැක්වීමේ ප්‍රයත්නයකි. මෙමගින් දෘෂ්ටියක් ජනිත වෙයි. අපේ සිරුර හා බැඳුණු කොටස් හතරක් වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනුවෙන් දැක්වෙයි.

"මම දුක් විඳිමි, මම සැප විඳිමි, මම සැපෙන් සිටිමි" ආදි වශයෙන් අපි වේදනාවන් මමත්වයෙන් ග්‍රහණය කරමු. සුඛ දුක්ඛ චිත්තනයන් සමඟ අපි අනන්‍යතාවක් ඇති කර ගනිමු. සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන තෙවැදෑරුම් වේදනා "මම" "මාගේ" ආදි හැඟීමෙන් ග්‍රහණය කිරීම වේදනා උපාදානස්කන්ධය යි.

අපි යම් යම් දේ හඳුනා ගනිමු. යම් යම් දෑ පිළිබඳව ආකල්ප ඇතිකර ගනිමු. පුද්ගලයාගෙන් පුද්ගලයාට අදහස්වල සමතාවකට වඩා විෂමතාවක් දිස්වෙයි. එය ඔවුනොවුන්ගේ ඥාන මට්ටම් අනුව ද ඇතිවෙයි. අප හඳුරණ විෂයයන් අනුව ද පුද්ගල


Free Distribution www.thiryak.org

බද්ධ ආකල්පයන්හි විෂමතා ඇති වෙයි. එක ම වස්තුවක් දෙස කිප දෙනෙකු බලන්නේ තම තමන්ගෙන් පුහුණු ක්ෂෙත්‍රයන්ට අනුව විවිධ දෘෂ්ටිකෝණවලිනි. ළදරුවාට කාසිය සෙල්ලම් භාණ්ඩයකි. ගනුදෙනුකරුවාට මූල්‍යමය භාණ්ඩයකි. කහවණුව රත්කරුවාට විශේෂඥ දැනුම අනුව උපරිම හා අවම වටිනාකම් සහිත භාණ්ඩයකි. මේ ත්‍රිවිධ විවිධතාව පැනනගින්නේ ඔවුන්ගේ දැනුම අනුව ය. මේ සියලු අදහස් – ආකල්ප සඤ්ඤා, නාමයෙන් හැඳින්විය හැකි ය. මෙ සඤ්ඤා ද මිනිසා මමත්වයෙන් සලකන බව සඤ්ඤා උපාදානස්කන්ධයෙන් අවධාරණය කරයි. බුදුසමය දිට්ඨි උපාදානය විස්තර කරන්නේ මෙහි ප්‍රබලතාව දැඩිව අවධාරණය කරමිනි.

චේතනාව පෙරටු කොටගෙන කය, වචනය, සිත යන තිදෙරින් පහළවන ක්‍රියාවෝ 'සංඛාර' නම් වෙති. මේ ක්‍රියා අපි මමත්වයෙන් සැලකීමට හුරුපුරුදුව සිටිමු. 'මම යමි', 'මම කථා කරමි', 'මම සිතමි' ආදි ප්‍රකාශ මගින් අපි කායික, වාචසික හා මානසික ක්‍රියාවන්ට අනන්‍යතාව සමාරෝපණය කරමු. මෙයින් ප්‍රකටවන්නේ ඒ ඒ පුද්ගලයාගේ අභිලාෂ, අපේක්ෂා, බලාපොරොත්තු, ප්‍රාර්ථනා, ආවේග යනාදි සියල්ල සංඛාර උපාදාන ස්කන්ධයට ඇතුළත්වන බව ය.

චක්ඛු විඤ්ඤාණ ආදි වශයෙන් අප ඉඳුරන් මගින් ලබන දැනුම විඤ්ඤාණ උපාදාන ස්කන්ධයට අයත් වෙයි. ඉන්ද්‍රියවිඥානය හේතුඵල න්‍යායට අනුව නොයෙක් වස්තූන්ගේ සමවායෙන් හටගන්නා නමුත් අවිද්‍යාව නිසා අපි ඒවාට මමත්වය ආරෝපණය කොට 'මම දකිමි', 'මම අසමි' ආදි වශයෙන් පිළිගනිමු.

පඤ්ච උපාදාන ස්කන්ධය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙන් ඒ හා එකට බැඳුණු, 'මම'ය 'මාගේ' ය යන ආකල්පයෙන් යුතුව පවතින එක් එක් පුද්ගලයා පිළිබඳ වූ පෞද්ගලික සිත විවරණය කැරෙන අයුරු පැහැදිලි වෙයි.

මිනිස් සිත පුදුමාකාර බව අපි දනිමු. උපදින්නේ එකෙකි, මිය යන්නේ අනෙකකි, එවන් සූක්ෂ්මතර සිතට උපමාවක් පවා දැක්වීම ද දුෂ්කරය'යි බුදුරජාණන් වහන්සේ වරක් වදාළහ. අත්තෙන් අත්තට පනින රිළවකු මෙන් සිත අරමුණෙන් අරමුණට පනියි.

'දූරංගමං ඒකචරං–අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති–මොක්ඛන්ති මාරබන්ධනා'

යනුවෙන් ධම්මපදය සිත විවරණය කළේ එබැවිනි. බුදුසමය සිත ප්‍රභාස්වර යයි ද නමුත් එය ආගන්තුක කෙලෙසුන්ගෙන් කිළිටි වී ඇතැයි ද අවධාරණය කරයි. එම සිත ආවරණ පහකින් වැසී ඇත. ඒ පහ පඤ්ච නීවරණ ය.

(i) කාමච්ඡන්ද

(ii) ව්‍යාපාද

(iii) ථීනමිද්ධ

(iv) උද්ධච්චකුක්කුච්ච

(v) විචිකිච්ඡා



Free Distribution www.thiryak.org

පඤ්චඉන්ද්‍රියන් පිනවීමට ඇති දැඩි ආශාව කාමච්ඡන්දය යි. මෙහිලා මෛථුන සේවනය (ලිංගික චර්යාව) ප්‍රමුඛ වෙයි. මිනිසා ආශාවන් පසුපස හඹා යයි. ලිංගික චර්යාවෙහි ද සීමා (මර්යාද) ඇති කොට නොගනී යි. කම් සැප විඳීමට තැඹුරු වූ සිත නිරතුරුව ප්‍රයත්න දරන්නේ සිය ආශා මුදුන්පත් කර ගැනීමට ය. කාම සිතුවිලි ජාලයක් සේ සිත වෙලාගත් කල පුද්ගලයා ඒ සිතුවිලිල්ලේ වහලෙක් වෙයි. එවිට නිරතුරුව ඔහු උත්සාහ දරන්නේ සිය සිත උපන් ආශාව තෘප්තිමත් කිරීමට ය. නිල් කණ්ණාඩියක් පැළඳි පුද්ගලයාට ලොව සියල්ල නිල් පැහැයෙන් පෙනෙ යි. රුදුරු කාම සිතුවිලිලෙන් වැසුණු පුද්ගලයාට කාම සිතුවිලි තුනී කර ගැනීමෙ ප්‍රයත්නයක් ජනිත නො වෙයි. ඔහු උත්සුකවන්නේ තමාගේ කාම සිතුවිලි තෘප්ත කිරීමට ය. කාමච්ඡන්දය පවත්නා තුරු විවෘත මනසකින් වස්තු දෙස බැලීමේ ශක්තිය උත්පාදනය නො වෙයි.

පෘථග්ජන පුද්ගලයා තෘප්තියට පත් නොකොට ගත් මනසින් යුතුව (ඌනාව හුත්වාන ජහන්ති දේහං) මියැදෙන බව බුදුරජාණන් වහන්සේ විසින් වදරා ඇත්තේ එබැවිනි.

ද්වේශයෙන් සිත කුපිතවීම ව්‍යාපාදය යි. අපේ ඉඳුරන්ට ගෝචර වන අරමුණු අපි වර්ග කර ගනිමු. හොඳ – ලස්සන දේට ප්‍රිය කරමු. නොහොඳ – අවලස්සන දේට අප්‍රිය කරමු. මේ මානසිකත්වය අනුව ප්‍රියදේට ඇලෙමු. අප්‍රිය දේ සමඟ ගැටෙමු. ප්‍රිය දෙයෙහි කාමච්ඡන්දය ඇති වෙයි. අප්‍රිය දෙයෙහි පටිඝය හෙවත් ද්වේෂය ඇති වෙයි. තරහයෙන් කුපිත සිතැති පුද්ගලයා අප්‍රිය අමනාප දෙයට විපත් කිරීමට – හිංසා පැමිණවීමට පෙළඹෙ යි. ව්‍යාපාදය යනු එය යි. මේ සිතුවිල්ල ද නිබඳව ම සිත කිළිටි කරයි. ව්‍යාපාදය ඇතිතාක් ලොව දෙස මැදහත්ව – මෛත්‍රී සහගතව බැලීය නොහැකි ය.

සිත – කය දෙක්හි ඇති කුසීතකම – කම්මැලිකම ථිනමිද්ධය යි. මානව ප්‍රගමනය සඳහා පුරුෂවීර්යය, පුරුෂපරාක්‍රමය අත්‍යවශ්‍ය ය. යුගයෙන් යුගයට මිනිසා ප්‍රගතිය කරා ළඟා වූයේ පුරුෂවීර්යය නිසා ය. පෞද්ගලිකව සැලකුවද පුද්ගල ප්‍රගමනය සිදු වන්නේ පුද්ගලවීර්යය නිස යි. පුරුෂවීර්යයට බාහිර සාධක උපකාරී වීමට පුළුවන. එහෙත් පුද්ගලයා බැහැර කටයුතු දේ බැහැර ලා (නික්කමධාතු) සංවර්ධනය කළයුතු දේ අභිසංවර්ධනයට (පරක්කමධාතු) පත් කර ගතයුතු ය. සිත – කය දෙකේ මැලිකම පුද්ගලයකු නිෂ්ක්‍රිය බවට පත් කරයි. එබඳු පුද්ගලයා කෙලෙස් වසඟයට පත්වීම අනිවාර්ය වෙයි. ජීවගුණයෙන් තොර මිනිසා තුළ කුශලතා (කෞශල්‍ය) වර්ධනයක් සිදු නො වෙයි. එබැවින් ථිනමිද්ධය පුද්ගල මානසිකත්වය ප්‍රදූෂ්‍ය කරයි.

සිතෙහි ඇති නොසන්සුන්බව ·උද්ධච්චකුක්කුච්ච නමින් හැඳින්වේ. එම නොසන්සුන්බව නොදමුණු ඉන්ද්‍රියයන්ගෙන් ද කළ වරද පිළිබඳ සිතේ බැඳුණු කහටෙන් යුතුව පශ්චාත්තාපයෙන් ද උද්ගත වෙයි. නොසන්සුන් සිතක් ඇති පුද්ගලයාට කළයුතු, නොකළයුතු දෑ තේරුම් – බේරුම් කරගෙන, බැහැරලීය යුතු දෑ බැහැර ලා වර්ධනය කළයුතු දෑ වර්ධනය කරලීමේ ශක්තිය නැතිව යයි. එමනිසා නොසන්සුන් මනස කර්මණ්‍ය (ක්‍රියාවට නැඟිය හැකි) තත්ත්වයට පත්කර ගැනීමට



Free Distribution www.thiryak.org

විශාල බාධකයකි. ඉන්ද්‍රියයන්ගේ අසංවරභාවය හිතේ සමාහිත බව ඇතිකර ගැනීමට විශාල බාධකයකි. කළ වරද පිළිබඳ නොනවත්වා පසුතැවිලිවීමෙන් ද හිත කර්මණ්‍ය තත්ත්වයට පත්කළ නොහැකි ය. සිත කර්මණ්‍යත්වයට පත් නොවන තාක් භාවනා කිරීමට හිත නැඹුරු කළ නොහැකි ය.

විචිකිච්ඡාව නම් සැකය යි. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් හා කර්මඵල පිළිබඳ ඇති සැකය පමණක් නොවේ. ආත්ම විශ්වාසය අඩු තරමට ද සැකය ඇති වෙයි. නීවරණ ධර්මයන්ගෙන් වැසී ගත් සිත පිළිබඳ විවිධ විස්තර හා උපමා පාලි සූත්‍රවල දක්වා තිබේ. 'ජලය' පිළිබඳ උපමාව පොදුජනයාට වටහා ගැනීමට ඉතා පහසු ය.

කාමච්ඡන්දයන්ගෙන් ආවරණය වූ සිත සායම් මුසුකළ ජලය හා බඳු ය. ව්‍යාපාදයෙන් ආලෝලනය වූ සිත උතුරන ජලය හා සමාන ය. ථීනමිද්ධයෙන් වැසුණු සිත මතුපිට දිය සෙවෙල් බැඳුනු ජලය බඳු ය. උද්ධච්චකුක්කුච්චයෙන් කැළඹුණු සිත රළ සහිත ජලය මෙනි. විචිකිච්ඡාව වූකලී අන්ධකාරයේ තිබෙන මඩ සහිත ජලය බඳු ය. මෙලෙස අපවිත්‍රත්වයට පත් ජලය කිසියම් රූපයක නියම පිළිඹිබුව දැක්වීමට අපොහොසත් වන්නාක් මෙන් පඤ්චනීවරණයන්ගෙන් වැසුණු සිත ද යමක යථා තත්ත්වය අවබෝධ කරදීමට අපොහොසත් වෙයි.

මිනිස් සිත උඩුසිත හා යටිසිත වශයෙන් බෙදා ඒ පිළිබඳ පර්යේෂණ දැනට නොනවත්වා සිදු වෙයි. මනෝවිද්‍යාඥයන් අතර මේ පිළිබඳ විවිධ මතවාද ද පවතී යි. සාමාන්‍යයෙන් උඩුසිත 1/7ක් සේ සලකනොත් යටිසිත 6/7ක් වේ යැයි නූතන මනෝ විද්‍යාඥයන්ගේ පිළිගැනීම යි. සිතේ පවත්නා මේ දෙවැදෑරුම් ස්වරූපය අංගුත්තර නිකායේ සඤ්චේතනික වග්ගයේ පළමුවැනි සූත්‍රයෙහි ඉතා මනරම් සේ විස්තර කොට ඇත. එහිදී භාවිතකොට ඇත්තේ සම්පජාන හා අසම්පජාන යන වචන දෙක යි. සම්පජාන – අසම්පජාන යන දෙකොටසට අයත් කායසංඛාර, වචීසංඛාර සහ මනෝ සංඛාර ඇත. අප දැනුවත්ව සිදු කරන කායික ක්‍රියා සම්පජාන කාය සංඛාර වෙයි. ආහාර ජීර්ණය, රුධිර ධාවනය වැනි අපේ සවිඤ්ඤාණිකත්වයෙන් තොරව ශරීරය තුළින් සිදුවන ක්‍රියා අසම්පජාන සංඛාර වෙයි.

ප්‍රසිද්ධ රැස්වීමකදී කථාවක් පවත්වනවිට, කවියක්, සින්දුවක් ගායනා කරන විට එය සිදු කරන්නේ වචී සංඛාර අනුව ය. අනුන්ගේ කථාවකට, ගායනයකට සවන්දෙන විට ද සම්පජාන වචී සංඛාරය ඇති වෙයි. අසම්පජාන වචී සංඛාර යන්නෙන් යටි සිතෙන් උද්ගතව වාචෝද්ගතවන වචන අදහස් කෙරේ. එසේ නොමැති නම් ස්මරණයෙන් මතු කර ගත නොහැකි යටිසිතට කිඳබැසගත් වාචසික අත්දැකීම් ද විය හැකි ය.

ඒ ඒ පුද්ගලයන් විසින් ඇතිකර ගනු ලබන චිත්තජ රූප සටහන් සම්පජාන මනෝ සංඛාර ය. පතපොත, චිත්‍ර, මූර්ති, චිත්‍රපටි දර්ශන ආදි විවිධ ක්ෂේත්‍රයන් හදාරන අය තුළ සම්පජාන මනෝ සංඛාර පැනනගී යි. කාලාන්තරයක් තිස්සේ යටිසිතට බැසගෙන ක්‍රියාශීලී වන චිත්තජ රූප අසම්පජාන මනෝ සංඛාර ලෙස හඳුනා ගත හැකි ය. නිදිගත් කල උඩුසිතට මතුව එන්නේ මේවාදැයි අනුමාන කළ හැකි ය.



Free Distribution www.thiryak.org

සම්පජාන - අසම්පජාන යන විග්‍රහය අනුව සිත. කායික - වාචසික හා මානසික ක්‍රියාද මයත් මඟින් සර්වාංගව්‍යාප්තව සමස්ත පෞරුෂය සිසාරා පවතින බව සිතීමට පුළුවන.

පාලි සූත්‍ර ධර්මවල සිත පිළිබඳ විවිධ විස්තර විවරණ ඇතුළත්ව ඇති බව අපි දනිමු. ඒවා අතුරින් ප්‍රමුඛ විවරණ තුනක් විතික්කම. පරියුට්ඨාන හා අනුසය වශයෙන් උගන්වනු ලැබේ යි. මෙමඟින් සිතේ මට්ටම් තුනක් ඉදිරිපත් කැරෙන බව පිළිගැනීමට පුළුවන.

(i) කායික හා වාචසික සංවරබව බිඳ දමමින් සිතේ පවත්නා හැඟීම් පිටතට පනින ස්වරූපය විතික්කම නම් වෙයි. ඇතැම් පුද්ගලයන් කෝපාවිශ්ටව අනුනට බැණ වැදීම. පහරදීම මෙහි ප්‍රතිඵලය යි. මේ තත්ත්වය ශීලයෙන් පාලනය කර ගත හැකි යයි ඉගැන්වේ.

(ii) කායිකව හා වාචසිකව පිටතට නොපැන. උද්ධුසිත කලඹන ස්වරූපය පරියුට්ඨාන නම් වෙයි. පුද්ගල සන්තානයෙහි උද්ගතවන ආවේග කායික - වාචසික වශයෙන් පිටතට පුපුරා නොගොස් උද්ධුසිත කැළඹිල්ලකට පත්වන අවස්ථා අපට දනෙ යි. සමථභාවනාව මඟින් මේ තත්ත්වය පාලනය කළහැකි ය.

(iii) පුද්ගල සන්තානය තුළ නිලීනව. අප්‍රකටව. රහසිගතව ආවේගයෝ පවතිති. ඒවා අනුසය ධර්ම ය. මේවා වංචනික ලෙස ද හඳුන්වා තිබේ. විපස්සනා භාවනාව මඟින් මේ තත්ත්වය පාලනය කළ හැකි ය. විතික්කම. පරියුට්ඨාන හා අනුසය යන චිත්ත ස්වභාවය සිතේ ස්තර හෙවත් මට්ටම් තුනක් හෙළි පෙහෙළි කරයි. මේ ආවේගයෝ චක්‍රාකාර ය. සමහරවිට විතික්කම. පරියුට්ඨාන යන අවස්ථා දෙක ආක්‍රමණය කරමින් අනුසය අවස්ථාවම පුද්ගලයාගෙන් ප්‍රකට වීමට ඉඩ තිබේ. ඒ නිසා මේ අවස්ථා තුන අනුපිළිවෙළින් පහළවන ස්වරූප තුනක් සේ නොපිළිගත යුතු ය. මේ මානසික ක්‍රියාකාරීත්වය සීල - සමාධි - පඤ්ඤ යන ත්‍රිශික්ෂාවන් ප්‍රගුණ කිරීමෙන් තැසිය හැකි බව බෞද්ධ පිළිගැනීම යි.

සිතේ පහළවන විවිධ කෙලෙස් දහම් හැඳින්වීම සඳහා බුදුසමය විවිධ වචන භාවිත කොට ඇති බව අපි දනිමු. පෙළ පොත්වල බහුල වශයෙන් භාවිත කළ තවත් වචනයක් ආසව යන්න. ඉඳුරන්ගේ මාර්ගයෙන් සිත තුළට ගලාඑන ක්ලේශ 'ආසව' ලෙස සැලකිය හැකි ය. ඉඳුරන් මඟින් සිතට ගලා එන ආශා යටිසිතේ මෝරමින් පවතී යි. එබැවින් ඒවා 'ආසව' ය. කාමාසව. භවාසව. දිට්ඨාසව. අවිජ්ජාසව යනුවෙන් එය සිව්වැදෑරුම් වේ.

කෙලෙස් දහම් සිතේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපායි. එබැවින් ඒවා බන්ධන හෙවත් සංයෝජන ය. ඒවා දහයකි. ඒ දහය අපේ නිදහස් චින්තනයට සපුරා බාධාකර ලෙස පවතී යි.



Free Distribution www.thiryak.org

මිනිස් සිතේ තවත් ප්‍රබල ක්‍රියාකාරීත්වයක් 'මඤ්ඤනා' නමින් හැඳින්වෙයි. මේ පිළිබඳ අතිශය දර්ශනික විවරණයක් මජ්ඣිම නිකායේ පළමුවැනි සූත්‍රයවන මූල පරියාය සූත්‍රයේ ඉදිරිපත් කෙරේ.

''අස්සුතවා පුථුජ්ජනෝ පඨවිං පඨවිතෝ සඤ්ජානාති
පඨවිං පඨවිතෝ සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති, පඨවියා මඤ්ඤති,
පඨවිතෝ මඤ්ඤති, පඨවිං මෙති මඤ්ඤති, පඨවිං අභිනන්දති,
තං කිස්ස හේතු ? අපරිඤ්ඤතං තස්සාති වදාමි''

අශ්‍රැතවත් (ධර්මය නොඇසූ) පෘථග්ජනයා පොළොව, පොළොව වශයෙන් හඳුනා ගනී යි. පෘථිවිය, පෘථිවිය වශයෙන් හඳුනාගෙන නිච්ච, සුඛ, අත්තා අනුව සිතයි. පෘථිවියෙන් සිතයි. පෘථිවියෙන් කියා සිතයි. පෘථිවිය මගේ යයි සිතයි. පෘථිවිය ගැන සතුටු වෙයි. ඊට (එසේ සිතීමට) හේතුව කුමක් ද ? පෘථිවිය පිළිබඳ නිසියාකාර ලෙස නොදැනීම යයි කියමි''.

භාෂාව ඇසුරුකොට සාවද්‍ය චින්තන හටගන්නා අයුරු මෙයින් ප්‍රකට වෙයි. අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් සැලකිය යුතු ද නිසි වැටහීම නොමැති නිසා වැරදි ලෙස ග්‍රහණය කිරීම මෙයින් පැවසෙ යි.

''යේන යෙනහි මඤ්ඤන්ති – තතෝ තං හෝති අඤ්ඤථා'' යන සුත්ත නිපාතාගත සල්ල සූත්‍රයේ ගාථාවෙන් යමක් පිළිබඳ විපරීත ලෙස සිතීම 'මඤ්ඤනාව' බව දක්වා ඇත. මේ තත්ත්වය නිසා චතුර්විධ විපර්යාස (විපල්ලාස) හට ගනී යි. අනිත්‍ය දෙය නිත්‍ය ලෙසත්, අසුභ දෙය සුභ ලෙසත් ආදී ලෙස අප විෂයලෝකය ග්‍රහණය කරන්නේ අපේ බුද්ධියේ විපරීත බව නිසා ය.

මෙලෙස සිත කිළිටි කරන කරුණු සමුදයක් සූත්‍ර ධර්මවල උගන්වා තිබේ. සිත කිළිටි වූ කල පුද්ගලයාට තමා වෙත එළඹිය හැකි අර්ථ – අනර්ථ නොදැනෙ යි. කළයුත්ත නොකළයුත්ත නොදැනෙ යි. කිළිටි වූ සිතෙන් කිසි කලෙකත් යහපතක් සිදු නොවෙයි. කෙරෙන්නේ තමාටත් අනුන්ටත් අයහපතක්ම ය. සිත කිළිටි වීමෙන් ආරක්‍ෂා නොකර ගත් පුද්ගලයෝ දුකින් දුකට ම පත් වෙති.

''සොරෙක් සොරකු දැක ඔහුට යමක් කරන්නේ ද, එසේ ම බද්ධ වෛරක්කාරයෙක් හෝ තමන් කෙරෙහි බද්ධ වෛර ඇති එකකු දැක යමක් කරන්නේ ද වැරදි සේ තබන ලද සිත එයට වඩා බරපතල හානියක් ඔහුට කරන්නේ ය.''

''දිසෝ දිසං යං තං කයිරා – වේරී වා පන වේරිනං
මිච්ඡා පනිහිතං චිත්තං – පාපියෝ තං තතෝ කරේ''

කිළිටි සිත පුද්ගලයාට සතුරකුට වඩා හානි පමුණුවන බව මෙයින් ප්‍රකාශ වෙයි. එසේම මනාකොට ආරක්ෂා කළ සිත (පිරිසිදු සිත) ඒ පුද්ගලයාට උදාර මෙහෙයක් ඉටු කරන බව ද බුදුසමය පිළිගනී යි.


Free Distribution www.thiryak.org

''සග මොක් සුව ලබාදෙන කාරණය මව නො කරන්නීය. පියා නො කරන්නේ ය. තවද සෙසු ඥතීහු ද හෝ නොකරන්නාහු ය. මනාකොට පිහිටුවන ලද සිත ඒ හේතුවෙන් ඒ පුද්ගලයා ඉතා උතුමකු කරන්නේ ය''

''න තං මාතා පිතා කයිරා – අඤ්ඤේ වා'පිච ඤාතකා
සම්මා පනිහිතං චිත්තං – සෙය්‍යසෝ නං තතෝ කරේ''

සිතේ ස්වරූප දෙකක් පිළිබඳ මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයේ සඳහන් වෙයි. අයෝනිසෝ මනසිකාරය (හේතු යුක්තිත් නොදැන මෙනෙහි කිරීම) නිසා නූපන් ආශ්‍රවයෝ උපදිති. උපන් ආශ්‍රවයෝ මනාව වැඩෙති. යෝනිසෝ මනසිකාරය නිසා නූපන් ආශ්‍රවයෝ නූපදිති. උපන් ආශ්‍රවයෝ ප්‍රහීණ වෙති.

''යෝනිසෝ ච මනසිකාරං, අයෝනිසෝ ච මනසිකාරං. අයෝනිසෝ භික්ඛවෙ මනසිකරෝතෝ අනුප්පන්නා චේ'ව ආසවා උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති. යෝනියෝ ච භික්ඛවේ මනසිකරෝතෝ අනුප්පන්නාචේ'ව ආසවා නුපජ්ජන්ති. උප්පන්නා ච ආසවා පහියන්ති''

සිත කිළිටි වීමෙන් සත්ත්වයා කිළිටිවන බවත්, සිත පිරිසිදු වීමෙන් සත්ත්වයා පිරිසිදු වන බවත් (චිත්ත සංකිලේසා භික්ඛවේ සත්තා සංකිලිස්සන්ති, චිත්ත වෝදනා විසුජ්ඣන්ති) බුදුරජාණන් වහන්සේ වදාළේ එබැවිනි.

යෝනිසෝ මනසිකාරයෙන් යුතුව ලොව දෙස බලන භාවනානුයෝගී පුද්ගලයාට අසුභය, අසුභය ලෙසත්, අනිත්‍යය, අනිත්‍යය ලෙසත්, දුක්ඛය, දුක්ඛය ලෙසත්, අනාත්මය අනාත්මය ලෙසත් ප්‍රත්‍යක්ෂ වෙයි. සම්‍යක්ඥනයට ඉන්ද්‍රියාර්ථ විපරීත ලෙස හසු නොවේ. බුද්ධිය යහපත් වූ විට සරාගී ලෙස පෘථග්ජන පුද්ගලයාට හැඟෙන දේ ප්‍රඥවන්තයාට විරාගී ලෙස පෙනේ. එවිට මේ ලෝකය කෙරෙහි ඇලීමට ඔහුට කිසිම හේතුවක් නො පෙනේ. විරාගී ලෙස ලෝකය දකින ඔහු ලොව කෙරෙහි කලකිරෙ යි. විරාගයට පැමිණේ යි. යථාභූත ඥන දර්ශනය ඇතිකර ගැනීමට ඔහුට පිළිසරණවන්නේ සීල – සමාධි – පඤ්ඤ යන ත්‍රිශික්ෂාව යි.


Free Distribution www.thiryak.org

## 10 වන පරිච්ඡේදය

# සිත පිරිසිදු කරගැනීම

සිත කිළිටි කරන, රාගාදි පව් වඩන සිත සංවර කර ගැනීම අවශ්‍ය ය. බුදුරදුන් වදාළ යථාභූත ඥාන දර්ශනය පසක් කර ගැනීමට බ්‍රහ්මචරිය වාසය අත්‍යවශ්‍ය ය. එ බැවින් බුදුදහම ආචාර විද්‍යාත්මක පදනමක පිහිටා මනෝවිද්‍යාත්මක විශ්ලේෂණය ගරු කරමින් ධර්ම මාර්ගය ඉදිරිපත් කර යි.

ආදි බෞද්ධ චින්තනය ආත්මවාදය බැහැරලයි ; මනසේ ක්‍රියාකාරිත්වයට ප්‍රමුඛ ස්ථානය පිරිනමයි ; මනෝ විශ්ලේෂණය ගරු කරයි. එම පදනමෙහි පිහිටා සිට දුක හා දුකේ ස්වභාවය ද දුඃඛනිරෝධය ද විවරණය කොට දක්වයි.

පුද්ගල සන්තානය ශාන්ත බවට පත්කර ගැනීම සඳහා සදාචාරාත්මක ශික්ෂණය අවශ්‍ය වෙයි. සමාධිය ජනිත කර ගැනීමට පෙරාතුව 'සීලය' ආවශ්‍යක ප්‍රත්‍යයක් සේ දක්වා ඇත්තේ එබැවිනි. සාමාන්‍ය පුද්ගලයා සංවර බවට පත්කිරීම ක්‍ෂණිකව කළ නොහේ. එබැවින් එය ද එක්තරා ක්‍රමයකට අනුපිළිවෙළින් සිදු විය යුතු ය. ඒ නිසා පුද්ගලයාගේ සංවරය ඇති කරලීමට පළමුව ඉඳුරන්ගේ සංවර බව ඇති කළ යුතු ය. ඉන්ද්‍රියසංවරය නොමැති විට සිත සමාහිත කළ නො හැකි ය. මූලික වශයෙන් සංවරය ඇති කරලීමට සීලය අවශ්‍ය යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. කෙලෙස් කසටින් වැසී යන සිත පවිත්‍ර කර ගැනීම අවශ්‍ය ය. බුදුදහම අභ්‍යන්තර විශුද්ධිය සලසන විශුද්ධි මාර්ගයක් සේ පෙළ දහමෙහි සඳහන් වන්නේ එබැවිනි.

බෞද්ධයාගේ අවසාන නිෂ්ඨාව වන නිර්වාණය සාක්ෂාත් කළ හැක්කේ අවිද්‍යාව නසා සන්තානය තුළ විද්‍යාව ජනිත කිරීමෙන් පමණි. භක්තිය, විශ්වාසය පදනම් කොට ගෙන විද්‍යාව ඇති කළ නොහැකි ය. එසේම අවිද්‍යාව නසා විද්‍යාව ජනිත කර ගැනීම ආකස්මිකව කළ නො හැකි ය. ඒ සඳහා අවශ්‍ය පරිසරයක් හා සුදුසු ක්ෂේත්‍රයක් සකසා ගැනීමට සිදු වෙයි. බුදුරදුන් වදාළ ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව දෙස විචාර පූර්වක බලන කල මේ තත්ත්වය මනාව ප්‍රකට වෙයි.

මිනිස් සන්තානය තුළ ජනිත වන පූර්වෝක්ත ක්ලේශ ධර්ම ප්‍රහාණය කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අවශ්‍ය බව බුදුසමය පිළිගනී යි. බුදුරජාණන් වහන්සේ සීල සමාධි පඤ්ඤා යනුවෙන් ත්‍රිශික්ෂාවක් දක්වා වදාළේ එබැවිනි. අනුපූර්ව ශික්ෂණ ක්‍රමය මගින් අභ්‍යන්තර විශුද්ධිය උපදවා ගන්නා අයුරු සහ උපදවා ගත හැකි බව පාලි සූත්‍ර ධර්මවල දී මනාව දක්වා තිබේ. මේ පිළිබඳ විස්තර එක් තැනක දෙතැනක නොව බොහෝ සූත්‍රවල දක්වා ඇති අයුරු පෙළ දහමින් ප්‍රකට වෙයි. මුල් බුදු සමයෙහි අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා හා අධිපඤ්ඤාසික්ඛා යනුවෙන් අනුපූර්ව ශික්ෂාව දැක්වෙයි.



Free Distribution www.thiryak.org

බුද්ධධර්මය ආචාර විද්‍යාත්මක පදනමක් මත ගොඩනැගුණු ධර්මමාර්ගයක් ලෙස පිළිගනු ලබයි. එමනිසා බුදුසමය විද්‍යාව මෙන්ම චරණයද (විජ්ජාචරණසම්පන්නෝ) අවධාරණය කරයි. විද්‍යාවත් චරණයත් සමතුලිතතාවෙන් යුතුව වර්ධනය කළයුතු බව උගත්වා ඇත්තේ එහෙයිනි. ''යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං (සීලය යම් තැනක ද ප්‍රඥාව එතැනය ; ප්‍රඥාව යම් තැනෙක ද සීලය එතැනය) යන්නෙන් ප්‍රකාශ වන්නේ එම අර්ථය යි.

බෞද්ධ ප්‍රතිපදාවෙහි ප්‍රධානතම පරමාර්ථය චතුරාර්යසත්‍යාවබෝධයෙන් ආධ්‍යාත්මික පාරිශුද්ධිය ද විමුක්තිය ද සාදාගැනීම ය. බාහිර වූත් ආධ්‍යාත්මික වූත් පාරිශුද්ධිය ද විමුක්තිය ද නිරායාසයෙන් ලබා ගත නොහැකි ය. සත්‍යාවබෝධය සඳහා ප්‍රඥාව අවශ්‍ය යි. පෘථග්ජන පුද්ගලයාට විශුද්ධ වූ ප්‍රඥාව නොමැති ය.එම නිසා පෘථග්ජනයා විසින් සත්‍යාවබෝධය සඳහා ප්‍රඥාව වැඩිය යුතු ය. ''පඤ්ඤා භාවේතබ්බා'' යැයි සූත්‍රවල නිරතුරුව සඳහන් වන්නේ ඒ නිසා යි. ප්‍රඥාව වැඩිය හැකි එකම මාර්ගය ශීලයෙහි පිහිටා ඉන්ද්‍රියසංවරය ඇති කොට ගෙන, සමාධිය උපදවා ගැනීමෙන් පමණි.

දිනක් බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණි එක්තරා දේවතාවෙක්, ''ආභ්‍යන්තරික වූත් බාහ්‍ය වූත් ක්ලේශ ජටාව නැති කළ යුත්තේ කෙසේ ද'' යි ප්‍රශ්න කළේ ය. ඊට බුදුරජාණන් වහන්සේ මෙ ලෙස පිළිතුරු දුන්හ.

> ''සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ
> චිත්තං පඤ්ඤඤ්ච භාවයං
> ආතාපී නිපකෝ භික්ඛු
> සෝ ඉමං විජටයේ ජටං''

මේ ප්‍රකාශයට අනුව බෞද්ධ විමුක්ති මාර්ගයෙහි මූලික ම පදනම ශීලය වන බව ඉතා පැහැදිලි ය. සදාචාර ධර්ම මාර්ගය විමුක්තිය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක වන ශ්‍රාවකයාගේ මූලික කාර්යය ලෙස උගන්වනු ලබන්නතේ ද එහෙයිනි.

ආර්යප්‍රඥාව උපදවා ගැනීම පිණිස චෛතසික පාරිශුද්ධිය අත්‍යවශ්‍ය ය. බුදුසමයෙහි ඉගැන්වෙන උසස් ම ඥාන තත්ත්වයන් වන පුබ්බේනිවාසානුස්ති, චුපපතපා හා ආසවක්ඛය වැනි විශිෂ්ටතර ඥානාදිය ලබා ගත හැක්කේ ද සදාචාර ධර්ම පරිපූර්ණයෙන් චිත්ත පාරිශුද්ධිය ලබා ගතහොත් පමණි. රූපාවචර, අරූපාවචර ආදි ධ්‍යානලාභීත්වය සඳහා ද අභ්‍යන්තර පාරිශුද්ධිය (නොමැතිව නො හැකිය.) තිබිය යුතුය.

විමුක්ති මාර්ගයට පිළිපන් ආර්ය ශ්‍රාවකයකු විසින් සමාදන්ව පිළිපැදිය යුතු ශීලය පිළිබඳ ව සම්පූර්ණ විස්තරයක් දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි එයි. එහි චූල සිල-මජ්ඣිම සිල-මහා සිල වශයෙන් ශීලය කොටස් තුනකට බෙද දක්වයි.

බෞද්ධ විමුක්ති මාර්ගය ශික්ෂාත්‍රයකින් යුක්ත බව ඉහත සඳහන් කරන ලදී. ඒ ත්‍රිවිධ ශික්ෂා සමාදානය ශ්‍රමණකරණීය ධර්ම වශයෙන් සාමඤ්ඤඵල සූත්‍රයෙහි ද ගණක මොග්ගල්ලාන සූත්‍රයෙහි ද දක්වයි.



Free Distribution www.thiryak.org

"අධිසීල සික්ඛා සමාදනං, අධිචිත්ත සික්ඛා සමාදනං, අධිපඤ්ඤ සික්ඛා සමාදනං, ඉමානි ඛෝ භික්ඛවේ තීනි භික්ඛුස්ස අච්ඡාධිතානි කරණීයානි."

බෞද්ධ දර්ශනයට අනුව පරමාර්ථසත්‍යය තර්කානුසාරයෙන් හෝ අනුශ්‍රාවානුසාරයෙන් හෝ ලබා ගත නොහැකි ය. පරමාර්ථසත්‍යය ප්‍රත්‍යක්ෂ කළයුත්තේ ප්‍රඥවෙනි. විමුක්තියට ප්‍රධාන වන්නේ ආර්යප්‍රඥව යි. එහෙත් ආර්ය ප්‍රඥව නිරායාසයෙන් ම ජනිත නොවෙයි. එබැවින් බුදුරජාණන් වහන්සේ මෙ ලෙස දක්වති :

"නාහං භික්ඛවේ ආදිකේනේව අඤ්ඤාරාධනං වදමි. අපි ච භික්ඛවේ අනුපුබ්බකිරියා අනුපුබ්බ පටිපද අඤ්ඤාරාධනා හෝති"

ශීලය විමුක්තිය සොයන්නාගේ ආදි ප්‍රතිෂ්ඨාව ලෙස දක්වන්නේ මේ නිසා ය. ප්‍රඥ ප්‍රතිලාභය සඳහා අවශ්‍ය වූ සතර සතිපට්ඨානය වැඩීම පිණිස ද, ශීලය අවශ්‍ය ප්‍රත්‍යය ලෙස උගන්වා ඇත්තේ මේ නිසා ය :

"සීලේ පතිට්ඨාය, සීලං නිස්සාය චත්තාරෝ සතිපට්ඨානේ භාවෙය්‍යාථ"

යම් සේ සියලු බීජයන් මහා පොළොව ම ප්‍රතිෂ්ඨාව කොට වෘද්ධියට පැමිණේ ද, එසේ ම ශීලය ම ප්‍රතිෂ්ඨාව කොට සප්ත බෝධි අංග වඩා භික්ෂුවක් විසින් ධර්මයන්ගේ විපුලත්වයට පැමිණිය යුතු ය.

විමුක්තිය සලසා ගත යුත්තේ අනුපූර්ව ප්‍රතිපදවකිනි ; අනුපූර්ව ශික්ෂාවකිනි. යම් සේ ගණකයන් හික්මවන පුද්ගලයා අනුපූර්ව වශයෙන් එකේ සිට උපරිම සංඛ්‍යාව දක්වා යේ ද, එසේ ම පැවිදි බිමට පිළිපන් ආර්යශ්‍රාවකයා ද අනුපූර්ව වූ පිළිවෙළකට බුදුරජාණන්වහන්සේ විසින් හික්මවනු ලබන බව ගණක මොග්ගල්ලාන සූත්‍රයෙහි පැහැදිලිව දක්වා තිබේ. තථාගත තෙමේ දමනය කළ යුතු පුරුෂයකු ලැබ ප්‍රථමයෙන් ම හික්මවන්නේ ශීලයෙහි ය :

"තථාගතෝ පුරිසදම්මං ලභිත්වා පඨමං ඒවං විනේති : ඒහි ත්වං භික්ඛු සීලවා හෝහි"

සප්ත විශුද්ධීන් අතුරෙහි ද පළමුවෙන් ම දැක්වෙන්නේ සීල විසුද්ධිය යි. සාමඤ්ඤඵල සූත්‍රයෙහි හා ගණක මොග්ගල්ලාන සූත්‍රයෙහි ද දැක්වෙන පරිදි විමුක්තිය සලසා ගැනීමේදී භික්ෂුව පළමුවෙන් ම ශීල සම්පන්න විය යුතු බව උගන්වයි. ඊට පසුව ඉන්ද්‍රියසංවරය ද, සතිසම්පජඤ්ඤය ද සන්තුට්ඨිය ද වැඩිය යුතු ය. මේ අංගයන්ගෙන් පිරිපුන් භික්ෂුව භාවනා වැඩීමට යෝග්‍ය වූ ස්ථානයක් කරා ගොස් සිත තව තවත් පිරිසුදු කිරීමට උත්සාහ ගත යුතුවෙ යි. ඒ අවස්ථාවෙහි චිත්ත නිවරණ ධර්මයන්ගේ ප්‍රහාණය සිදු වෙයි ;

"සෝ අභිජ්ඣාලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. ව්‍යාපාද පදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති. සබ්බ පාණභූතහිතානුකම්පී ව්‍යාපාද පදෝසා චිත්තං පරිසෝධේති. උද්ධච්ච



Free Distribution www.thiryak.org

කුක්කුච්චං පහාය අනුපමත්තෝ විහරති. අභිජ්ඣං වූපසන්තචිත්තෝ උද්ධච්ච කුක්කුච්චං චිත්තං පරිසෝධෙති. විචිකිච්ඡා පහාය තිණ්ණං විචිකිච්ඡා විහරති. අකථං කථං කුසලේසු ධම්මේසු විචිකිච්ඡාය චිත්තං පරිසෝධෙති.''

මෙසේ සිත තුළ පවත්නා පඤ්ච නීවරණ ධර්මයන් ප්‍රහීණ වූ කල ස්වකීය අධ්‍යාත්මය දෙස බලන භික්ෂුවට ප්‍රමෝදයක් උපදී. ප්‍රමෝදයට පත් භාවනානුයෝගියාට ප්‍රීතිය පහළ වෙයි. ප්‍රීතිමත් මනසක් ඇති ඔහුම කෙනෙකුට කායපස්සද්ධිය (සිරුරේ සැහැල්ලු බව) උපදී. සන්සුන් වූ සිරුර ඇති භික්ෂුව ආධ්‍යාත්මික වශයෙන් සුවයක් විඳියි. සුවය විඳින ඔහුගේ සිත සමාධිගත වෙයි. බුදුරජාණන් වහන්සේ විසින් දක්වා ඇති චිත්ත දියුණුව මේ මූල ධර්මය මත පිහිටා ඇත.

භෞතික වශයෙන් සිරුර සන්සුන් නොවූයේ නම් සිත සමාධිගත නොවෙයි. එ බැවින් සිත මූල ප්‍රතිෂ්ඨාව කොට ගෙන පඤ්ච නීවරණ ප්‍රහාරණයෙන් ඇති වන ප්‍රමෝදය ප්‍රීති ය, කාය පස්සද්ධිය ආදිය හේතු කොට ගෙන උපදින ආධ්‍යාත්මික සුවය සමාධිය වර්ධනය කරමින් ධ්‍යාන වැඩීමට උගන්වා ඇත. ප්‍රථමාදි ධ්‍යාන වැඩීමෙන් පසු සිත මුළුමනින් ම කර්මණ්‍ය තත්ත්වයට පත්වෙයි. එවිට සිත ආර්යප්‍රඥාව වෙත යොමු කළ හැකි ය. පුබ්බෙනිවාසානුස්සති, චුතූපපාත හා ආසවක්ඛය යන ඥාන තුනත් පසක් කිරීමට අවශ්‍ය ත්‍රිවිද්‍යා ප්‍රතිලාභිත්වය පිණිස සිත යොමු කළ හැක්කේ ධ්‍යාන වැඩීමෙන් සිත සම්පූර්ණයෙන් පරිශුද්ධ වූ පර්යෝදාත (හාත්පසින්ම පිරිසුදු) වූ අනංගණ (කෙලෙස් මළ රහිත) වූ තත්ත්වයට පැමිණීමෙන් පසුව යි.

> ''සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධෙ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති; අභිනින්නාමේති''
>
> (දී. සාමඤ්ඤඵල සුත්ත)

නිර්වාණ ධර්මය අවබෝධ කර ගැනීමට පෙරාතුව පුනර්භවය හා කර්මය යන සත්‍යයන් පිළිබඳ ව ප්‍රත්‍යක්ෂ ඥානයක් අවශ්‍ය වන බව බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රකට වෙයි. පුබ්බෙනිවාසානුස්සති ඤාණය හා චුතූපපාත ඤාණය ද වඩනා තෙක් ශ්‍රාවකයා මේ සත්‍යයන් පිළිගන්නේ හුදෙක් ශ්‍රද්ධාමාත්‍රයෙන් (සද්ධාමත්තේන) පමණකි. පූර්වාත්මයන් දැකීමේ ඥානය පහළ වීමෙන් පසුව පුනර්භවය පිළිබඳ ව සත්‍යය ද චුතූපපාත ඤාණය පහළ වීමෙන් පසුව යථා කර්මෝපග වූ (කර්මානුරූප සසර සැරිසරන) සත්ත්වයන් දැකීමෙන් කර්මශක්තිය ද ප්‍රත්‍යක්ෂ කරයි. එයින් පසු ප්‍රත්‍යක්ෂ වශයෙන් චතුරාර්ය සත්‍යාවබෝධය කොට ආසවක්ඛය ඤාණයෙන් සියලු කෙලෙසුන් නසා අවසාන විමුක්තිය සාදගනී යි.

චිත්ත පාරිශුද්ධිය ජනිත කර ගැනීම සඳහා බෞද්ධයා විසින් අනුගමනය කළයුතු පිළිවෙත කවරක් දැයි මෙයින් ප්‍රකට වෙයි. අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤ, සංඛ්‍යාත අනුපූර්වශික්ෂාවෙහි අර්ථක්‍රියාකාරිත්වය ද මෙයින් පැහැදිලි වෙයි. හුදෙක් ශීලයෙන්



Free Distribution www.thiryak.org

ද හුදෙක් සමාධියෙන් ද පරමාර්ථ සත්‍යය පසක් කළ නොහැකි ය. ප්‍රඥාවෙන් කෝටි ප්‍රාප්ත පුද්ගලයන්ට ගැඹුරු එක් ධර්ම පදයක් ඇසූ පමණින් සපුරා කෙලෙස් බැමි බිඳ හැර නිවන් පසක් කළ හැකි වුව ද සාමාන්‍ය පොදු මහාජනතාවට එය කළ නොහැකි වෙයි. එම නිසා අනුපූර්ව ශික්ෂණ මාර්ගයක් නිර්දේශ කිරීමට බුදුන් වහන්සේට සිදු විය.

ප්‍රාථමික වශයෙන් ශීලයෙන් පුද්ගලයා සංවරත්වයට පත්කොට, සමාධියෙන් චිත්ත දියුණුව ඇති කොට, සිතෙහි පවත්නා කෙලෙස් දහම් සිඳ බිඳ දමා, සියලු බැඳුම්වලින් මිදී විෂයලෝකය දෙස බැලීමට බුදුහු අනුදැන වදාළහ. අප වාසය කරන ලෝකය සරාගී වෙයි. එම සරාගීලෝකය දෙස විරාගී චිත්තාකල්පයකින් බැලිය හැක්කේ ආර්යප්‍රඥාව ඇති වූ විට ය. සරාගී ලොව ඉන්ද්‍රිය සංවරය ඇති කොට, චිත්ත සංවර්ධනයෙහි දී ප්‍රබුද්ධව ලොව දෙස බලන විට ලොව යථා තත්ත්වය පසක් වෙයි. ලෝකය ශූන්‍ය වශයෙන් බැලීමට තරම් ප්‍රඥාවෙහි පිරිපුන් බවක් ලබා ගත යුතු වෙයි. ආර්යප්‍රඥාව ජනිත කර ගැනීමත් සමඟම භෞතික මෙන් ම අභෞතික සියලු බැඳුම් නසා නිවන් පසක් කළ හැකි ය.



Free Distribution www.thiryak.org

දහම් පාසල් සිසුන් සඳහා
නොමිලයේ නිකුත් කරන ලදී.